# පුරවැසි අධ්‍යාපනය

## 6 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

සියලු හිමිකම් ඇවිරිණි.

ප්‍රථම මුද්‍රණය : 2014
දෙවන මුද්‍රණය : 2015
තෙවන මුද්‍රණය : 2016
සිව්වන මුද්‍රණය : 2017
පස්වන මුද්‍රණය : 2018
හයවන මුද්‍රණය : 2019
හත්වන මුද්‍රණය : 2020

ISBN 978 - 955 - 25 - 0260 - 6

**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්**
හෝමාගම, කටුවාන පාර, කාර්මික ජනපදය, අංක 145 දරන ස්ථානයෙහි පිහිටි
සවින්ද ග්‍රැෆික් සිස්ටම්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා පළ කරන ලදි.

**Published by - Educational Publications Department**
**Printed by - Savinda Graphic Systems (Pvt) Ltd,**
**No. 145, UDA Industrial Estate, Katuwana Road, Homagama.**

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

දියුණුවේ හිණිපෙත කරා ගමන් කරනා වත්මන් ලොවට, නිතැතින්ම අවැසි වනුයේ වඩාත් නව්‍ය වූ අධ්‍යාපන ක්‍රමයකි. එමඟින් නිර්මාණය කළ යුත්තේ මනුගුණදම් සපිරුණු හා කුසලතාවලින් යුක්ත දරුපරපුරකි. එකී උත්තුංග මෙහෙවරට ජව බලය සපයමින්, විශ්වීය අභියෝග සඳහා දිරියෙන් මුහුණ දිය හැකි සිසු පරපුරක් නිර්මාණය කිරීම සඳහා සහාය වීම අපගේ පරම වගකීම වන්නේ ය. ඉගෙනුම් ආධාරක සම්පාදන කාර්යය වෙනුවෙන් සක්‍රීය ලෙස මැදිහත් වෙමින් අප දෙපාර්තමේන්තුව ඒ වෙනුවෙන් දායකත්වය ලබා දෙන්නේ ජාතියේ දරුදැරියන්ගේ නැණ පහන් දල්වාලීමේ උතුම් අදිටනෙනි.

පෙළපොත විටෙක දැනුම් කෝෂ්ඨාගාරයකි. එය තවත් විටෙක අප වින්දනාත්මක ලොවකට ද කැඳවාගෙන යයි. එසේම මේ පෙළපොත් අපගේ තර්ක බුද්ධිය වඩවාලන්නේ අනේකවිධ කුසලතා පුබුදු කරවාගන්නට ද සුවිසල් එළි දහරක් වෙමිනි. විදුබිමෙන් සමුගත් දිනක වුව අපරිමිත ආදරයෙන් ස්මරණය කළ හැකි මතක, පෙළ පොත් පිටු අතර දැවටී ඔබ සමඟින් අත්වැල් බැඳ එනු නොඅනුමාන ය. මේ පෙළපොත සමඟම තව තවත් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත නිති පියමනිමින් පරිපූර්ණත්වය අත් කරගැනුමට ඔබ සැම නිරතුරුව ඇප කැප විය යුතු ය.

නිදහස් අධ්‍යාපනයේ මහාඝර්ඝ ත්‍යාගයක් සේ මේ පුස්තකය ඔබ දෝතට පිරිනැමේ. පෙළපොත් වෙනුවෙන් රජය වැය කර ඇති සුවිසල් ධනස්කන්ධයට අර්ථසම්පන්න අගයක් ලබා දිය හැක්කේ ඔබට පමණි. මෙම පාඨ්‍ය ග්‍රන්ථය මනාව පරිශීලනය කරමින් නැණ ගුණ පිරි පුරවැසියන් වී අනාගත ලොව ඒකාලෝක කරන්නට දැයේ සියලු දූ දරුවන් වෙත දිරිය සවිය ලැබේවායි හදවතින් සුබ පතමි.

පෙළපොත් සම්පාදන කාර්යය වෙනුවෙන් අප්‍රමාණ වූ සම්පත්දායකත්වයක් සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ප්‍රණාමය පුදකරමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2020.06.26

**නියාමනය හා අධීක්ෂණය :**

පී. එන්. අයිලප්පෙරුම - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම :**

ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය :**

පාලිත අරවින්ද වීරක්කොඩි - සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

එච්. එම්. පියුමි අනූපමා - සහකාර කොමසාරිස් (2020 මුද්‍රණය)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සංස්කාරක මණ්ඩලය :**

1. විශාඛා සූරියබණ්ඩාර - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2. ඒ. එච්. ටී. තක්ෂිලා ජයමිණී - උප පීඨාධිපති
රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
3. එස්. යූ. අයි. කේ. ද සිල්වා - කථිකාචාර්ය
ජාතික අධ්‍යාපන ආයතනය
4. ආර්. එම්. පී. ඒ. ගුණතිලක - උප පීඨාධිපති
සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
5. පාලිත අරවින්ද වීරක්කොඩි - සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
6. වී. ත්‍යාගරාජා - කථිකාචාර්ය/ජ්‍යෙෂ්ඨ උපදේශක
මානව හා සමාජීය විද්‍යා දෙපාර්තමේන්තුව
විවෘත විශ්වවිද්‍යාලය

**සිංහල භාෂා සංස්කරණය :**

1. කුමුදු කරුණාරත්න - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල භාෂා අධ්‍යයන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය :**

| | | |
|---|---|---|
| 1. සී. එස්. ජයසිංහ | - | ගුරු මධ්‍යස්ථාන කළමනාකරු (විශ්‍රාමික)<br>හොරණ අධ්‍යාපන කලාපය |
| 2. අනෝමා කරුණානායක | - | ගුරු උපදේශක<br>කොළඹ අධ්‍යාපන කලාපය |
| 3. එම්. කේ. කිංස්ලි ප්‍රියන්ත | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 4. ජේ. එම්. එම්. ජයසුන්දර | - | ගුරු උපදේශක<br>නිකවැරටිය අධ්‍යාපන කලාපය |
| 5. හිමාරානි මාසිලාමනී | - | ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ |
| 6. එන්.නාගේද්‍රන් | - | ශ්‍රී ලංකා විදුහල්පති සේවය 2 II<br>මඩ/ඉරුවිල් කන්නකී මහ විද්‍යාලය,<br>කලවංචිකුඩි |
| 7. එම්.ඒ.එම්.හුවයිස් | - | ශ්‍රී ලංකා ගුරුසේවය I<br>මහ/අල් සෆා මහ විද්‍යාලය, වත්තේදෙර,<br>පොල්ගොල්ල |
| 8. කේ.ඩී.ඩී.පර්සිවල් | - | විශ්‍රාමික කථිකාචාර්ය<br>ගුරු විද්‍යාලය, මහරගම |
| 9. පී.එන්.එන්. දිල්ෂානි දයාරත්න | - | සහකාර කථිකාචාර්ය<br>කැලණිය විශ්වවිද්‍යාලය |

**පිට කවර හා චිත්‍ර රූප සටහන් :**

| | | |
|---|---|---|
| සකුන්තලා වේහැල්ල | - | ගුරු උපදේශක (විශ්‍රාමික)<br>කොළඹ අධ්‍යාපන කලාපය |

**පරිගණක ගත කිරීම, පිටු සැකසීම**

| | | |
|---|---|---|
| ඩබ්.ඒ.ශියන්ති භාග්‍යා | - | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**පිට කවරය සැකසීම**

| | | |
|---|---|---|
| මිතිල උදාර | - | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# පටුන


| | |
|---|---|
| අපේ පාසල | 01 - 46 |
| අප ජීවත්වන ප්‍රදේශය | 47 - 71 |
| යහපත් පුරවැසියෙකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග | 72 - 105 |



පිවිසෙන්න නිදහසේ සතුටින් දැනුම සොයා.. ට... www.e-thaksalawa.moe.gov.lk

The National e-learning Portal for the General Education

01

# අපේ පාසල

## හැඳින්වීම

නිවස හැරුණු විට අපට වඩාත් හුරු පුරුදු පරිසරය අපේ පාසලයි. නැණ ගුණ දහමින් යුතු යහපත් පුරවැසියන් තනන්නට පාසල ඉමහත් මෙහෙවරක් ඉටු කරයි. පාසල පුද්ගලයාගේ සංවර්ධනයට පමණක් නොව සමාජයේ සංවර්ධනයට ද දායක වන ආයතනයකි. ක්‍රියාශීලී සාමාජිකයකු ලෙස සමාජයේ සංවර්ධනයට දායක වීමට අවශ්‍ය නිපුණතා හා ආකල්ප ඇති කිරීමට පාසල අපට කොතරම් බලපා තිබේ ද? අප සාර්ථක පුද්ගලයකු ලෙස සමාජයට දායාද කරන පාසල කෙරෙහි මහත් අභිමානයක් හා ගෞරවයක් අප හදෙහි නැගෙන්නේ ඒ නිසා ය. මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් ඔබගේ පාසල ගැන අවබෝධයක් ලබාගෙන, ක්‍රියාශීලී යහපත් සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත.



1.1 රූපය

# පාසල හඳුනා ගනිමු

## 1.1 අපේ පාසලේ ඉතිහාසය

ඔබටත්, ඔබේ පවුලටත්, ඔබේ ගමටත් ඉතිහාසයක් ඇත. එමෙන් ම ඔබේ පාසලටත් එවැනි ම ඉතිහාසයක් ඇත. ඉතිහාසය යනු අතීතයේ ජීවත් වූ මිනිසුන් හා ඔවුන් කළ කී දෑ පිළිබඳ තොරතුරු සොයා බලා ඒවා පැහැදිලි කිරීමයි.

**පාසලේ ඉතිහාසය යනුවෙන් අදහස් කරනුයේ පාසල ආරම්භ වූ දා සිට මේ දක්වා විකාශනය වූ ආකාරය පිළිබඳ තොරතුරු ය.**

ඉතිහාසය ගැන අපට දැනුම ලබා දීමට උපයෝගී වන සෑම දෙයක් ම හැඳින්වීමට යොදන පොදු නමක් තිබේ. ඒ 'මූලාශ්‍රය' යන්න ය.

**ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපකාරී වන මූලාශ්‍රය කීපයක් පහත දැක්වේ.**

- පාසලේ විවිධ ස්ථානවල ඇති සමරු ඵලක
- ගමේ හෝ නගරයේ පුස්තකාලවල පැරණි ලිපි ලේඛන, පින්තූර හා ඡායාරූප
- විශ්‍රාමික විදුහල්පතිවරුන්ගෙන් හා ගුරුවරුන්ගෙන් ලබා ගත හැකි තොරතුරු
- පාසලේ පවත්වාගෙන යන ලිපි ලේඛන (ලොග් පොත, සිසුන් ඇතුළත් කිරීමේ ලේඛන, ලකුණු පොත්, සංගණන වාර්තා)
- ආගමික ස්ථානවල නායකයන්ගෙන් ලබා ගන්නා තොරතුරු
- ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගෙන් ලබා ගත හැකි තොරතුරු

6 ශ්‍රේණියේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ තම පාසල ගැන තොරතුරු සෙවීමට කතා කර ගත්හ. මේ සඳහා පාසලට ඇතුළත් වූ මුල් ම ශිෂ්‍යයා ගෙන්වා කරුණු දැන ගැනීමට ඔවුහු තීරණය කළහ.

ගුරුතුමියගේ සහාය ඇති ව තම පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා ළමයින් විදුහල්පතිතුමා හමු වුණා. ඔවුන්ට අවශ්‍ය වුණේ පාසලේ මුල් ම ශිෂ්‍යයා පිළිබඳ විස්තර දැන ගැනීමටයි. විදුහල්පතිතුමා ඔවුනට පැරණි ඇතුළත්වීමේ ලේඛන පරීක්ෂා කිරීමට අවස්ථාව ලබා දුන්නා. එහි මුලින් ම නම සටහන් වූ ශිෂ්‍යයා ගැන මෙසේ ලිය වී තිබුණා.

| ඇතුළත්වීමේ අංකය | දිනය | ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම | උපන් දිනය |
|---|---|---|---|
| 01 | 1935.01.09 | ඇම්. ඒ. සියාතුහාමි | 1930.01.30 |

අසූවන වියේ පසුවන ඇම්. ඒ. සියාතුහාමි මහතා පාසලේ ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හා දෙමව්පියන්ගේ සහායෙන් පාසලට ගෙන්වා ගැනීමට විෂයභාර ගුරුතුමියට හැකි වුණා. ගුරුතුමියගේ ආරාධනාවෙන් පාසලට පැමිණි සියාතුහාමි මහතා ළමයින් විසින් පිළිගනු ලැබුවේ බුලත් හුරුල්ලක් දීමෙන්.



1.2 රූපය

විදුහල්පතිතුමා අමුත්තා හඳුන්වා දුන්නේ, ළමයින්ගේ අත්පොළසන් මධ්‍යයයේ ය. සියාතුහාමි මහතා පිළිගැනීමෙන් පසුව ළමයින්ට පාසලේ ඉතිහාසය සම්බන්ධ ව දැන ගැනීමට අවශ්‍ය කරුණු පිළිබඳ ව විෂය භාර ගුරුතුමිය සියාතුහාමි මහතාට පැහැදිලි කර දුන්නා.

සියාතුහාමි මහතා පාසලේ අතීත තොරතුරු සිසු සිසුවියන්ට හෙළි කළේ රසවත් ආකාරයෙන්. “දුවේ පුතේ, මට මේ ස්ථානයට ආවාම ලොකු සතුටක් දැනුණා. මට මතක් වුණා ඔබ වගේ කුඩා දරුවෙකු විදියට මා මේ පාසලට ඇතුළත් වූ දිනය”.

“මගේ දෙමව්පියෝ කියලා දීල තියෙන විදිහට මේ පාසල පටන් ගෙන තියෙන්නේ 1935 අවුරුද්දේ, ආණ්ඩුවේ පාසලක් විදියටයි. ඒ, නගරයේ පාසලට යන්න අපහසුකම් තිබුණ ගමේ ළමයින් වෙනුවෙන්. ඒ කාලේ නගරේ තිබුණෙත් පාසල් දෙකයි. එකක් මිෂනාරි පාසලක්. අනෙක බෞද්ධ පාසලක්. ගමෙත් ඒ හැටි පවුල් හිටියේ නෑ. පවුල් විස්සක් විතර තමයි පදිංචි වෙලා හිටියේ. ගමේ හුඟක් දෙනාගේ රස්සාව ගොවිතැන. මැටි කර්මාන්තය කරපු අයත් හිටියා. අපේ තාත්තා කළේ වෙළෙඳාම. කරත්ත රස්සාව, හේන් ගොවිතැන කරපු අයත් හිටියා. පාසල් නොගිය ළමයිනුත් ගමේ හිටියා. ගමේ පෝසත් අයගේ ළමයින් ගියේ නගරයේ පාසලටයි. ඒත් නගරයට යන්නත් දැන් වගේ ලේසි නෑ. ගුරු පාර දිගේ බක්කි කරත්තෙන් යන්නත් හුඟක් වෙලා

ගතවෙනවා. බොහෝ දෙනා නගරයට ගියේ පයින්.''

"මුලින් ම මේ පාසල ආරම්භ කළේ ඇම්. ඒ. බණ්ඩාර මහත්තයා, මගේ පියාට අයත් කඩමණ්ඩිය ළඟ තිබුණ පුංචි ඉඩමක. ඒ කටු මැටි ගැසූ, පොල් අතු සෙවිලි කළ, කුඩා කාමරයක්. ගුරුතුමා වූයේ සේකර විදානආරච්චි මහතා. ගුරු කාමරයට පුංචි ඉඩක් වෙන් වූ පසු, ඉතිරි කොටස ඉස්කෝලේ සඳහා යොදා ගත්තා. මුලින් ම ඇතුළත් වූ ශිෂ්‍යයා තමයි මම. ඉන්පසු තවත් දහ හතර දෙනෙකු විතර වරින් වර ඉස්කෝලෙට ඇතුළත් වුණා. අන්න අර ඈතින් පෙනෙන කුඩා ගොඩනැගිල්ලක් තියෙන්නේ...... එතන තමයි මුලින් ම පාසල තිබුණේ.''

"මමත් එක්ක එක පංතියේ ඉගෙන ගත්ත ළමයි තමයි පැලිස්, ශංමුගම්, ඩිංගිරි බණ්ඩා, උමා, පියසේන, කාදර්. පස්සේ කලෙක විවිධ දානපතියෝ ඉඩම් හා ගොඩනැගිලි පරිත්‍යාග කළා. අපිට ඩෙස් පුටු ලැබුණා. එතකන් අපි ඉගෙන ගත්තේ දිග බංකුවල ඉඳගෙන. පස්සේ කාලෙක තව ළමයින් හා ගුරුවරුන් වැඩි වුණා. පසුව අපේ පාසල මධ්‍ය මහා විද්‍යාලයක් බවට පත්වුණා. ඊට පස්සේ තමයි විශාල ගොඩනැගිලි, විද්‍යාගාර පහසුකම් හා අනෙකුත් පහසුකම් ලැබුණේ.''

"ගමේ ළමයින් විතරක් නෙමේ පිට පළාත්වලින් දක්ෂ ළමයින් වැඩිදුර ඉගෙන ගන්න මේ පාසලට ආවා. මාත් විශ්වවිද්‍යාලයට ඇතුළු වුණා. උසස් අධ්‍යාපනය ලැබූ අය වගේ ම රටට වැඩදායි සේවයක් කරන විවිධ වෘත්තීන්ට අයත් විශාල පිරිසක් මෙම පාසලෙන් බිහි වුණා. විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කළ මට මගේ ම පාසලට ගුරු පත්වීමක් ලැබුණා.''

"මම මුලින් ම රැකියාවට ගිය දා පාසලේ උදේ රැස්වීමේ දී විදුහල්පතිතුමා මාව ළමයින්ට හඳුන්වලා දුන්නේ පාසලේ සිටි දීප්තිමත් සිසුවෙකු ලෙසටයි. පසු කලෙක මා මේ පාසලේ ම විදුහල්පති වුණා. අපේ කාලෙට වඩා පාසල දැන් හුඟක් දියුණුයි. ඉදිරියේ දී තවත් දියුණු වේවි. ඔබ හැම දෙනාගෙන්ම ඉල්ලන්නේ මං වගේ ම ඉගෙන ගත්ත පාසල ගැන අභිමානයෙන් කථා කරන්න පුළුවන් හොඳ විනය ගරුක දරුවන් වෙන්න කියලා'' කියමින් සියාතුහාමි මහතා කථාව අවසන් කළා. ළමයින් හැම දෙනා ම සතුටින් අත්පොළසන් දුන්නා.

පසු දින, පාසල ගැන සියාතු හාමි මහතාගෙන් දැනගත් කරුණු පිළිබඳව පුරවැසි අධ්‍යාපනය කාල පරිච්ඡේදයේ දී ළමයින් ගුරුතුමිය සමඟ සාකච්ඡා

කළා. ගුරුතුමියගේ අදහස වූයේ මීට අමතර ව තවත් තොරතුරු පාසලේ ඇති ලිපි ලේඛනවලින් සොයා ගත හැකි බවයි. ළමයින් විදුහල්පතිතුමාගෙන් අවසර ලබා ගෙන ලිපි ලේඛන පරීක්ෂා කළා. බොහෝ කරුණු නිවැරදියි. ළමයින්ට තම පාසල පිළිබඳ ඇති වූයේ අභිමානවත් හැඟීමක්.

## ක්‍රියාකාරකම 1

1. ඉහත සඳහන් වූ පාසලට ඉතිහාසයක් තිබෙන ආකාරයට ඔබ පාසලට ද ඉතිහාසයක් ඇත. ඔබේ පාසලේ ඉතිහාසය දැන ගැනීමට උපකාරී වූ මූලාශ්‍රය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබේ පාසල ආරම්භ කිරීමට මුල් වූ හේතුව කුමක් ද?
(ii) ඔබේ පාසල ආරම්භ කළ දිනය කවදා ද?
(iii) ඔබේ පාසල ආරම්භ කිරීමට පුරෝගාමී වූ පුද්ගලයන්ගේ නම් ලියා දක්වන්න.

2. ඔබ පාසලට අදාළ ව පහත වගුව සම්පූර්ණ කරන්න.

| | ආරම්භයේ දී | වර්තමානයේ දී |
|---|---|---|
| පාසලේ නම | | |
| භූමි ප්‍රමාණය | | |
| විදුහල්පතිතුමාගේ/තුමියගේ නම | | |
| ගොඩනැගිලි සංඛ්‍යාව | | |
| ගුරු සංඛ්‍යාව | | |
| ශිෂ්‍ය සංඛ්‍යාව | | |

3. (i) ඔබ පාසලෙන් බිහි වූ කීර්තිමත් ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නම් ලියා ඔවුන් කීර්තිය ඉසිලූ ක්ෂේත්‍ර ලියා දක්වන්න.

(ii) ඔවුන්ගෙන් එක් අයෙකු තෝරාගෙන ඔහුගෙන්/ඇයගෙන් රටට සිදු වූ සේවාව අගය කරමින් ප්‍රදර්ශන පුවරුවට ලිපියක් ඉදිරිපත් කරන්න.

4. ඉතිහාසය ඉගෙනීමට යොදා ගත හැකි මූලාශ්‍රය ඔබ හඳුනාගෙන ඇත. ඒ ඇසුරින් පාසලේ ඉතිහාසය පිළිබඳ ව බිත්ති පුවත්පතට සුදුසු ලිපියක් සකස් කරන්න.

## 1.2 පාසලේ සංවිධාන ව්‍යූහය විමසමු

පාසලේ සංවිධාන ව්‍යූහය යනු පාසලේ පරිපාලන හා සංවර්ධන කටයුතු සංවිධානය වී ඇති ආකාරයයි. පාසලක ශිෂ්‍ය සංඛ්‍යාව ගුරු සංඛ්‍යාව අනුව මෙම සංවිධාන ව්‍යූහය වෙනස් විය හැකි ය. ඔබේ පාසලේ ද එවැනි සංවිධාන ව්‍යූහයක් පවතී.

**පාසල් සංවිධාන ව්‍යූහයක දළ සැලැස්ම**

ශිෂ්‍ය ශිෂ්‍යාවන්

↓

පන්ති නායක නායිකා

↓

ශිෂ්‍ය නායක නායිකා

↓

ශ්‍රේණිභාර ගුරුවර/ගුරුවරියන්

↓

අංශභාර ගුරුවර/ගුරුවරියන්

↓

නියෝජ්‍ය විදුහල්පති/විදුහල්පතිනි

↓

ආදි ශිෂ්‍ය සංගමය → විදුහල්පති ← පාසල් සංවර්ධන කමිටුව

### ක්‍රියාකාරකම 2


1) පාසලක සංවිධාන ව්‍යූහය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i පාසලේ පාලනයට සම්බන්ධ ප්‍රධාන තනතුර කුමක් ද?

ii. පාසලකට සංවිධාන ව්‍යූහයක් අවශ්‍ය වන්නේ ඇයි ? හේතු දෙකක් ලියන්න.

2) ඔබේ පාසලේ සංවිධාන ව්‍යූහය දැක්වෙන සටහනක් සකස් කරන්න.

## පාසල් සංවිධාන ව්‍යූහයේ විවිධ භූමිකා හා අන්තර් සම්බන්ධතා




1.3 රූපය

## පාසල් සාමාජිකයන්ගේ වගකීම් හා යුතුකම්

### විදුහල්පතිගේ කාර්යභාරය

- අධ්‍යාපන කටයුතුවල නියමුවා ලෙස ක්‍රියා කිරීම
- ළමයින් ඇතුළත් කිරීම, ඔවුන් පන්තිවලට බෙදීම, ගුරුවරුන් නම් කිරීම
- කාල සටහන් සකස් කිරීම හා ඒ අනුව පන්තිවල ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීම
- ගුරු මණ්ඩලයේ සංවර්ධනය සම්බන්ධ කටයුතු හා ගුරු ශුභසාධන කටයුතු දියත් කිරීම
- විෂයමාලාව ක්‍රියාත්මක කිරීම හා එහි සංවර්ධනය
- ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය
- ගුරු ඇගයීමේ කටයුතු
- ශිෂ්‍ය ඇගයීම් කටයුතු හා සිසු විනය පිළිබඳ සොයා බැලීම

■ **පාසලේ ප්‍රධානියා වශයෙන්**

★ දෙපාර්තමේන්තු නීති රීති හා රෙගුලාසි ක්‍රියාවට නැංවීම හා ඒවා සම්බන්ධ ව දෙපාර්තමේන්තුවට වගකීම
★ දෙමව්පියන්, ආදි ශිෂ්‍යයන්, බාහිර ප්‍රජාව හා ආයතන සමඟ සමීප ව කටයුතු කරමින් පාසල දියුණුව කරා මෙහෙයවීම
★ පාසලට අවශ්‍ය උපකරණ හා ක්‍රීඩා භාණ්ඩ ආදිය සපයා ගැනීම හා ඒවා භාවිතයට ඉඩ සලසා ගැනීම

● **ගුරුවර/ගුරුවරියන්**

★ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විනයවත් කිරීම හා හික්මවීම
★ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නිවැරදි මග පෙන්වීම හා චරිත සංවර්ධනය
★ පාසල් සමාජයේ සියලු ම සාමාජිකයන් සමඟ සහයෝගයෙන් සිටීම හා කැපවීමෙන් යුතුව කටයුතු කිරීම
★ විෂයට අදාළ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය
★ පිළිගත් නීතිරීති හා සාරධර්මවලට අනුව කටයුතු කිරීම
★ පාසලේ අධ්‍යාපන හා භෞතික සංවර්ධනයට දායක වීම
★ පාසල් වාර පරීක්ෂණ පවත්වා ලකුණු ලබා දීම
★ පාසල් පාදක ඇගයීම් සිදු කිරීම
★ පන්ති කාමරය තුළ ප්‍රිය ජනක පරිසරයක් පවත්වාගෙන යෑම
★ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සමානාත්මතාවෙන් යුතුව සැලකීම
★ ශිෂ්‍ය ශිෂ්‍යාවන් යහපතේ යෙදවීම හා සමාජයට හඳුන්වා දීම

● **අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

★ පාසලේ කටයුතු පවත්වාගෙන යෑමට විදුහල්පතිට/විදුහල්පතිනියට හා ගුරු මණ්ඩලයට සහාය වීම
★ පාසලේ ළමයින්ගේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යෑමට අවශ්‍ය පහසුකම් සපයා දීමට සහාය වීම
★ පාසල් භූමියේ පවිත්‍රතාව හා අලංකාරය පවත්වා ගෙනයාමට සහාය වීම
★ ආරක්ෂක කටයුතු සඳහා සහාය වීම
★ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමඟ සුහද ව කටයුතු කිරීම

● **ශිෂ්‍ය/ශිෂ්‍යාවන්**

★ දිනපතා පාසල් පැමිණීම
★ හොඳින් ඉගෙනීමේ කටයුතුවල යෙදීම
★ විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලයට ගෞරව කිරීම
★ පාසලේ අනෙකුත් ළමයින් සමඟ සහයෝගයෙන් හා සමගියෙන් කටයුතු කිරීම
★ පාසල් මෑණියන්ගේ ගෞරවය ආරක්ෂාවන පරිදි සෑම විට ම හැසිරීම


★ පාසලේ විනය නීති රීති, සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම
★ පාසලේ සම්පත් ආරක්ෂා කිරීම
★ පාසල් පරිසරය ක්‍රමවත් ව පිරිසිදුව පවත්වා ගැනීමට සහාය වීම

ඉහතින් සඳහන් කර ඇති යුතුකම් හා වගකීම් එකිනෙකා විසින් ඉටු කිරීම පාසල ගුණාත්මකභාවය කරා ගෙන යාමටත් පාසලේ සංවර්ධනයටත් මහෝපකාරී වේ.

**ක්‍රියාකාරකම 3**

පහත දැක්වෙන තනතුරු දරන්නන් හමු වී කරුණු රැස් කර අදාළ නිලයට අයත් කාර්යයන් තුන බැගින් ලියන්න.

i. විදුහල්පති හෝ නියෝජ්‍ය විදුහල්පති
ii. අංශ ප්‍රධාන
iii. පන්ති භාර ගුරුවර/ගුරුවරියන්
iv. ශිෂ්‍ය නායක නායිකාවන්




1.4 රූපය


## ක්‍රියාකාරකම 4

1) ඉහත රූපය ඇසුරු කරගෙන ඔබේ පාසල් සංවිධාන ව්‍යුහයේ ඇති විවිධ සංවිධාන නම් කරන්න.

2) ඒවායෙන් ඉටුවන කාර්යභාරයන් තුන බැගින් ලියා දක්වන්න.

## 1.3 මගේ තොරතුරු මම ම විමසමි

පාසල් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක ලෙස ඔබට ඔබ නිවැරදි ව හඳුනා ගැනීම සඳහා රූප සටහනේ දැක්වෙන කරුණු උදවු කර ගත හැකිය.




1.5 රූපය

## මම කවුද?

සෑම පුරවැසියෙකුට ම අනන්‍යතාවක් තිබේ. පාසල් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක ලෙස ඔබේ අනන්‍යතාව හඳුනා ගැනීම සඳහා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## ක්‍රියාකාරකම 5

(1) ඔබගේ සම්පූර්ණ නම : ..................................
ඔබගේ වයස : ..................................
ඔබගේ ලිපිනය : ..................................
ඔබ පාසලට ඇතුළත් වූ දිනය : ..................................
පාසලට ඇතුළත් වීමේ අංකය : ..................................

(2) නිවැරදි තොරතුරු තහවුරු කර ගත් ආකාරය පෙන්නුම් කිරීමට "✓" ලකුණ කොටුව තුළ යොදන්න.

1. ඔබගේ සම්පූර්ණ නම නිවැරදි බව තහවුරු කර ගත් ආකාරය

| | | | |
|---|---|---|---|
| පියාගෙන් | ☐ | මවගෙන් | ☐ |
| භාරකරුගෙන් | ☐ | පන්තිභාර ගුරුතුමියගෙන්/ ගුරුතුමාගෙන් | ☐ |
| උප්පැන්න සහතිකයෙන් | ☐ | | |

2. ඔබගේ වයස නිවැරදි බව තහවුරු කර ගත් ආකාරය

| | | | |
|---|---|---|---|
| පියාගෙන් | ☐ | මවගෙන් | ☐ |
| භාරකරුගෙන් | ☐ | උප්පැන්න සහතිකයෙන් | ☐ |
| පන්තිභාර ගුරුතුමියගෙන්/ ගුරුතුමාගෙන් | ☐ | පවුලේ සාමාජිකයන්ගෙන්/ පවුලේ ඥාතීන්ගෙන් | ☐ |
| ගණනය කිරීමෙන් | ☐ | | |

3. ඔබගේ ලිපිනය නිවැරදි බව තහවුරු කර ගත හැකි ආකාරය

| | | | |
|---|---|---|---|
| පියාගෙන් | ☐ | මවගෙන් | ☐ |
| පවුලේ සාමාජිකයන්ගෙන් | ☐ | පාසලෙන් | ☐ |
| ඡන්ද නාම ලේඛනයෙන් | ☐ | ග්‍රාම නිලධාරිවරයාගෙන් / නිලධාරිනියගෙන් | ☐ |

4. ඔබ පාසලට ඇතුළත් වූ දිනය නිවැරදි බව තහවුරු කර ගත් ආකාරය

| | | | |
|---|---|---|---|
| පියාගෙන් | ☐ | මවගෙන් | ☐ |
| භාරකරුගෙන් | ☐ | සිසුන් ඇතුළත් කිරීමේ ලේඛනයෙන් | ☐ |
| පන්ති භාර ගුරුතුමියගෙන්/ ගුරුතුමාගෙන් | ☐ | | |
| නාම ලේඛනයෙන් | ☐ | | |

5. ඔබේ ඇතුළත් වීමේ අංකය නිවැරදි බව තහවුරු කර ගත් ආකාරය

| | | | |
|---|---|---|---|
| පන්ති භාර ගුරුතුමියගෙන් | ☐ | සිසුන් ඇතුළත් කිරීමේ ලේඛනයෙන් | ☐ |
| නාම ලේඛනයෙන් | ☐ | | |

**ක්‍රියාකාරකම 6**

(1) ඔබගේ පෞද්ගලික තොරතුරු ඇතුළත් කර, දී ඇති ජීව දත්ත තොරතුරු පත්‍රිකාව සම්පූර්ණ කරන්න.

## ජීව දත්ත තොරතුරු පත්‍රිකාව

1. මුලකුරු සමග නම : .......................................................................
2. උපන් දිනය : .......................................................................
3. මෙම වර්ෂයේ ජනවාරි 01 දිනයට වයස :

අවු. [ ] මාස [ ] දින [ ]

4. පෞද්ගලික ලිපිනය :.......................................................................
5. දුරකථන අංකය (තිබේ නම් පමණක්) : .......................................................
6. හදිසි අවශ්‍යතාවක දී දැනුම් දිය යුතු අයගේ නම සහ ලිපිනය :

.......................................................................................................

.......................................................................................................

(ඔහුගේ/ඇයගේ දූරකථන අංකය)
(තිබේ නම් පමණක්): .......................................................................

7. ඔබේ පාසලේ නම : .......................................................................
8. පාසලේ ලිපිනය : .......................................................................
9. පාසලේ දූරකථන අංක :.......................................................................
10. පාසලට ඇතුළත් වූ දිනය :.......................................................................
11. පාසලේ සිට ඔබ පදිංචි ස්ථානයට ඇති දුර : ............................................

........................................ ........................................

දිනය අත්සන

**ඔබ සුවිශේෂී පුද්ගලයෙකි. ඔබට සමාන කිසිවෙක් මෙලොව නැත. ඔබ ඔබ ම විය යුතු ය. ඒ ඔබගේ අනන්‍යතාවයි.**

## තමන් සතු යහපත් ගති ලක්ෂණ

වැවේගම කනිටු විදුහලේ 6 ශ්‍රේණියේ නෙළුම් පංතියේ ඉගෙනුම ලබන සෙව්වන්දි සිසුවිය තමන් සතු යහපත් ගති ලක්ෂණ ලියා දැක්වූයේ මෙසේ ය.




1.6 රූපය

### ක්‍රියාකාරකම 7

1) ඉහතින් දක්වා ඇති ආකාරයට, ඔබ සතු යහපත් ගති ලක්ෂණ හඳුනා ගෙන නම් කරන්න.

2) ඉහත සඳහන් කළ ඔබ සතු යහපත් ගති ලක්ෂණ සැබැවින් ම ප්‍රදර්ශනය වූ අවස්ථා ලියා දක්වන්න.

උදා : සත්‍යවාදී බව : තමා පාසලට ඒමට ප්‍රමාද වූ දින, ප්‍රමාදයට හේතු වූ සත්‍ය කරුණ ගුරුතුමියට පැවසීම

## තමන්ගේ දක්ෂතා



1.7 රූපය
ඉගෙනුම දක්ෂතාවක් වූ අවස්ථාවක්



1.8 රූපය
පළාත් ක්‍රීඩා තරගාවලියේ දී ශිෂ්‍යයෙකු උස පැනීමේ ඉසව්ව ජය ගත් අවස්ථාවක්



1.9 රූපය
තම සෞන්දර්යාත්මක හැකියා පෙන්වන සිසු සිසුවියන් පිරිසක්



1.10 රූපය
ක්‍රීඩා උත්සව අවස්ථාවක දී සංග්‍රහ කිරීමට සිසිල් පැන් සකසන අවස්ථාවක්



1.11 රූපය
ප්‍රාථමික අංශයේ ක්‍රීඩා උත්සවයේ දී කුඩා ළමයින්ට 6 ශ්‍රේණියේ ළමයින් සහාය වූ අවස්ථාවක්

### ක්‍රියාකාරකම 8

1. ඔබ සතු දක්ෂතාවක් පිළිබිඹු කෙරෙන අයුරින් නිර්මාණයක් කරන්න. (උදා: ඉවතලන දෑ, ගොක් කොළ, මැටි, පරිගණකය ඇසුරින්)

**ඔබ සතු දක්ෂතා හඳුනා ගැනීම සඳහා පහත සඳහන් දේ පිළිබඳ සිතන්න.**

1. ඔබ පෙන්වා ඇති දක්ෂතා මොනවා ද?
2. ඔබට ජයග්‍රහණ හිමි වී ඇති අවස්ථා මොනවා ද?
3. ඔබ කර ඇති නිර්මාණ මොනවා ද?
4. අන් අයගේ දක්ෂතා ඔබ හඳුනාගෙන තිබේ ද?
5. එම දක්ෂතා අගය කිරීමට ඔබ භාවිත කළ වචන මොනවා ද?
6. අන් අය ඔබ සතු යැයි සිතන ඔබේ හැකියා මොනවා ද?
7. අන් අය ඔබට ප්‍රශංසා කරන්නේ ඔබගේ කුමන දක්ෂතාවකට ද?
8. අන් අයගෙන් ඔබ ප්‍රශංසා ලබන විට ඔබට දැනුණු හැඟීම් මොනවා ද?

කුඩා කල මතු වූ හෝ හඳුනා ගත් දක්ෂතා තම ඉදිරි ගමනට යොදා ගෙන ජීවිතය ජය ගත් උදාර ශ්‍රී ලාංකිකයකුගේ ජීවන තොරතුරු වෙත ඔබේ අවධානය යොමු කරන්න.

## ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා

ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර 1884 ඔක්තෝම්බර් මස 13 ද බලපිටිය හා අම්බලන්ගොඩ අතර පිහිටි රන්දොඹේ ගම්මානයේ උපත ලැබී ය. සය හැවිරිදි වියේ දී ඔහුගේ මව මිය ගියා ය. එහෙත් ඔහුට සිය කුඩම්මාගේ නොමඳ ආදරය ලැබුණි.



1.12 රූපය

ළමා වියේ දී මහත් ඉගෙනුම් හැකියා ප්‍රදර්ශනය කළ ඔහු ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේ රන්දොඹේ වෙස්ලියානු මිෂනාරි පාසලෙනි. එහි ත්‍යාග ප්‍රදානෝත්සවයට ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූ ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ විදුහල්පති ජේ.එච්.ඩැරල් දේවගැතිතුමා අතින් ප්‍රදානය කළ ත්‍යාගවලින් වැඩි ප්‍රමාණයක් ලැබුවේ කුඩා කන්නන්ගරයි.


14 වන වියේ දී ශිෂ්‍යත්වයක් දිනා ගෙන

රිච්මන්ඩ් විද්‍යාලයට ඇතුළත් වූ ඔහු එහි දී නොමිලේ ආහාර හා ඉඳුම්හිටුම් මෙන් ම ඉගෙනීමේ පහසුකම් ලැබූ අතර තමන් ලද පහසුකම් උපරිම ලෙස යොදා ගෙන ඉගෙනුම කෙරෙහි අවධානය යොමු කළේ ය.

කිසි විටෙකත් විශේෂ වරප්‍රසාද බලාපොරොත්තු නොවී කටයුතු කළ ඔහු පසු කලෙක ශ්‍රී ලංකාවේ වරප්‍රසාද රහිත දරුවන්ට සෙත සැලසීමට කැප වන්නට ඇත්තේ තමන් ඉගෙන ගන්නා කාලයේ මුහුණ දීමට සිදු වූ කර්කශ අත්දැකීම් නිසා විය හැකි ය. ඉගෙනුමෙහි අති දක්ෂයෙකු වූ ඔහු 1903 දී කේම්බ්‍රිජ් ජ්‍යේෂ්ඨ විභාගයේ දී ගණිතය විෂය සඳහා ඉහළ ම ලකුණු ලැබූ ශිෂ්‍යයා වීමට සමත් විය. එම වසරේ ම විද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායමේ නායකත්වය දැරූ ඔහු පාසල් පාපන්දු කණ්ඩායමේ ද සාමාජිකයෙක් විය. ඔහු දක්ෂ කථිකයෙකු හා නළුවෙකු ලෙස පාසල් වියේ දී ප්‍රකට විය. රිච්මන්ඩ් විද්‍යාලයෙහි ගුරුවරයෙකු ලෙස සේවය කළ ඔහු පසුව නීතිය හදාරමින් සිටිය දී ම මොරටු වේල්ස් කුමර විදුහලේ හා වෙස්ලි විද්‍යාලයේ ද ගුරුවරයෙකු ලෙස සේවය කළේ ය.

1910 දී නීතිඥ වෘත්තියට පිවිසි ඔහු සමාජීය හා දේශපාලන කටයුතුවල නියැලුණේ ය. 1923 දී ගාලු දිස්ත්‍රික්කය වෙනුවෙන් ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්වුණු කන්නන්ගර මැතිතුමා 1931 දී නැවත රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත් විය. 1931 දී ලංකා ජාතික සංගමයේ සභාපතිත්වය දැරී ය.

අධ්‍යාපනය පිළිබඳ විධායක කාරක සභාවේ සභාපති ධූරය දැරූ ඔහු 1931 දී ලංකාවේ මුල් ම අධ්‍යාපන අමාත්‍යවරයා වීමට සමත් විය. බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දීම සඳහා කටයුතු කළ එතුමා මව් භාෂාවෙන් අධ්‍යාපනය ලබා දීම සහ මධ්‍ය මහා විද්‍යාල ඇති කිරීම මඟින් ලංකාවේ නිදහස් අධ්‍යාපනය ආරම්භ කිරීම සඳහා විශාල මෙහෙවරක් ඉටු කළේ ය. මේ නිසා ඔහු නිදහස් අධ්‍යාපනයේ පියා යන විරුද නාමය ලබයි.




1.13 රූපය

## ක්‍රියාකාරකම 9

1. තම දක්ෂතාවලින් ජීවිතය ජය ගත් කිහිපදෙනෙකුගේ නම් සහ තොරතුරු රැස් කර ගුරුතුමියගේ සහාය ඇතිව ඔවුන් දක්ෂතා පෙන්වූ ක්ෂේත්‍ර සහ ඔවුන් දැක්වූ දක්ෂතා ලියා දක්වමින් වගුව සම්පූර්ණ කරන්න.

| නම | දක්ෂතාව පෙන්වූ ක්ෂේත්‍රය | දක්ෂතාව |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |

2) ඉහත නම් සඳහන් එක් පුද්ගලයකුගේ ජීවිත තොරතුරු ඇතුළත් කර පොත් පිංචක් සකස් කරන්න.

3) පාසල් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක ලෙස ඔබ සතු දක්ෂතා ලියා දක්වන්න.
4) ඔබේ මිතුරකු හෝ මිතුරියකගේ හඳුනාගත් දක්‍ෂතාවක් පිළිබඳ තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

**ඔබ ඔබේ දක්ෂතා හඳුනා ගත්තේ ද? එම දක්ෂතා වැඩි දියුණු කර ගැනීම සඳහා ඔබ කළ යුත්තේ කුමක් ද?**

★ තමන්ට කළ හැකි, තමන් කැමැති දේ හඳුනා ගෙන, වඩාත් හොඳින් කිරීම.
★ ඔබ තුළ ඇති දක්ෂතාව අවස්ථානුකූල ව පෙන්වීමෙන් ඔබේ ආත්ම විශ්වාසය ගොඩනගා ගැනීම.
★ තමන්ගේ දක්ෂතා සමාජයේ දියුණුවට වැදගත් බව තේරුම් ගෙන ඒවා වර්ධනය කර ගැනීම.
★ ඔබේ දක්ෂතාවලින් උපරිම ඵල නෙළා ගත හැකි වනුයේ ජීවිත ස්වභාවය තේරුම් ගෙන ඒවා තම දක්ෂතා හා සම්බන්ධ කර ගැනීමෙන් බව අවබෝධ කර ගැනීම.

**ඔබට පහසු හෝ කැමති දේවල් තෝරා බේරා ගැනීම මගින් ඔබේ හැකියා, දක්ෂතා අනුව ජීවිත අරමුණු ගොඩනගා ගත හැකිය**

## තම දුර්වලතා

පාසලක 6 ශ්‍රේණියේ "අරලිය" පන්තියේ සිසු සිසුවියන් ගුරුතුමාගේ/ ගුරුතුමියගේ උපදෙස් පරිදි කළුලෑල්ලේ සටහන් කරන ලද තම තමන්ගේ දුර්වලතා කිහිපයක් පහත දැක්වේ.

- ඉවසීම නැති කම
- කේන්ති යෑම
- බොරු කීම
- යහළුවන් විහිළුවට ලක් කිරීම
- ආවේගශීලී බව
- කලහකාරී බව
- ආත්මාර්ථකාමී බව
- සැක කිරීම
- අන් අය පීඩාවට පත් කිරීම
- උදව් කරන්න අකමැති වීම
- වැඩවල පිළිවෙළක් නැති කම
- අලසකම

**බොරු කීම විනෝදයක් ලෙස සැලකූ ළමයකුගේ කථාව**

එක ගමක ගව රැළක් බලා ගන්න ළමයෙක් සිටියා. බොරු කීම විනෝදාංශයක් සේ සැලකූ ඔහු තමන්ගේ ගව රංචුව තණ කැවීම සඳහා රැගෙන ගියේ වන රොදක් මැද පිහිටි තණ පිටියකට. දිනක් ඔහු තණ පිටියේ ගවයින්ට තණ කවමින් සිටින විට “කොටියා ආවෝ......කොටියා ආවෝ........ මාව බේර ගනියෝ........” කියා කෑ ගැසුවා. වන රොදට දර කැපීමට පැමිණි මිනිස්සු මේ හඬ ඇසී ළමයා සිටි දෙසට දුව ගෙන ආවා. එවිට මේ ළමයා කෑ ගසමින් සිනාසී සරදම් ලෙස මෙසේ කීවා.

“ අයියෝ.... ඔයාලා රැවටුණා... හූ...... හූ.... ඔයාලා රැවටුණා..... ”

ඉන් දින කීපයකට පසු වන රොද මැද දී මේ ළමයා පෙර දිනයේ පරිදි ම “කොටියා ආවෝ......... මා බේරා ගනියෝ........” කියමින් කෑ ගැසුවා. එදිනත් එම හඬ ඇසී දුව ආ මිනිස්සු තමන් රැවටුණු බව දැන ලැජ්ජාවට පත් වුණා. තවත් දිනක මේ ළමයා ගවයන්ට තණ කවමින් සිටි වෙලාවේ ඇත්තට ම කොටියෙක් ගොරවමින් ළමයා දෙසට ආවා.

“ කොටියා ආවෝ..... මාව බේරගනියෝ.....” කියමින් ළමයා දිගින් දිගට ම කෑ ගසන්නට වුණා. එය කැලෑවට ආ මිනිසුන්ට ඇසුණ මුත් ඔවුන් කිසිවෙක්, හඬ ආ දෙසට දිව ගියේ නෑ. පසු දින ගමේ මිනිසුන් දැන ගත්තා ගව රැළ බලාගත් ළමයා ඇත්තටම කොටියාට ගොදුරු වී ඇති බව.

**බොරු කියන පුද්ගලයා ඇත්ත කියන විට ද විශ්වාස කිරීමට නොහැක.**

**ඉහත දැක්වෙන ආකාරයට ඔබ තුළ ද දුර්වලතා තිබිය හැකි ය. අන් අය පෙන්වා දීමට පෙර ඔබ ම ඒවා හඳුනා ගන්න.**

තම දුර්වලතා අවම කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

- ⋆ තම දුර්වලතා හඳුනා ගැනීම
- ⋆ තම දුර්වලතා අන් අය පෙන්වා දුන් විට ඒවා නිහතමානී ව පිළිගැනීම
- ⋆ තම දුර්වලතා හැකිතාක් අවම කර ගැනීමට අධිෂ්ඨානයක් ඇති කර ගැනීම
- ⋆ හඳුනාගත් ඔබේ දුර්වලතා නැවත ඇති නොවන ලෙස කටයුතු කිරීම

## ක්‍රියාකාරකම 10

1. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. මේ සඳහා ඔබගේ ගුරුතුමාගෙන් හෝ ගුරුතුමියගෙන් උපදෙස් ලබා ගන්න.

| තමන් සතු දුර්වලතා | | ඒවා අවම කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |

**2.** ඔබේ දුර්වලතාවක් හේතුවෙන් ඔබට සිදු වූ අවාසි ලියා දක්වන්න.

### තමන්ට ඇති බාධා සහ අභියෝග

පාසල් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක ලෙස ඔබ අධ්‍යාපන කටයුතුවල නිරත වීමේ දී අභියෝගවලට මුහුණ දීමට සිදු විය හැකි ය. ආර්ථික අපහසුකම්, අන් අය ඔබේ අනන්‍යතාවට ගරු නොකිරීම, නායකත්වය නොලැබීම, අන් අය පිළි නොගැනීම, කලහකාරී සිසුන්ගෙන් ඇති වන පීඩා යනාදිය වශයෙන් එම බාධා විවිධ විය හැකි ය.

ජීවිතයේ සෑම පුද්ගලයෙකුට ම අභියෝගවලට මුහුණ දීමට සිදුවෙයි. සෑම අභියෝගයක් ම ජීවිත සාර්ථකත්වයට තුඩුදෙන ශක්තියක් බවට පත් කර ගත හැකි බව ඔබ විශ්වාස කළ යුතු ය. අභියෝග ජයගත් පුද්ගලයන් ලෝකයේ සාර්ථක පුද්ගලයන් බවට පත් ව ඇත.

### ජීවිත අභියෝගවලට මුහුණ දී දිවිය ජයගත් පුද්ගලයෙකු පිළිබඳ තොරතුරුවලට අවධානය යොමු කරමු

ක්‍රි.ව. 1920 පෙබරවාරි 13 වැනි දින ජන්ම ලාභය ලැබූ සේනක බිබිලේ මහතා දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ අහංගම කතළුව සිය ගම් පියස කර ගත්තේ ය. මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාළ මොහු

පසුව කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇතුළත් විය. කුඩා අවධියේ සිට ම ඉගෙනුමට ඉතා දක්ෂයෙකු වූ මොහු වෛද්‍ය අංශයට හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවට පිදෙන රන් පදක්කම් හිමිකර ගත්තේ ය. කොළඹ වෛද්‍ය පීඨයේ ක්‍රි.ව. 1954 දී පළමු වරට ආරම්භ වූ ඖෂධවේදය පිළිබඳ අධ්‍යාපන අංශයේ ප්‍රධානියා විය. ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්යවරයා වූයේ ද ඔහු ය.

ඔහුගේ ජීවිතයේ ප්‍රධාන අරමුණ වූයේ රෝගීන් හට අත්‍යවශ්‍ය ඖෂධ සහන මිලට ලබාදීමයි. ඒ සඳහා ඔහු රාජ්‍ය ඔසුසල බිහිකිරීමට පුරෝගාමී විය. රජය මඟින් අත්‍යවශ්‍ය ඖෂධ ආනයනය කර රාජ්‍ය ඔසුසල මඟින් රෝගීන්ට සපයා දිය යුතු බව ඔහුගේ ප්‍රතිපත්තිය විය. තව ද ඖෂධවල වෙළෙඳ නාමය වෙනුවට ඖෂධීය නාමය භාවිත කළ යුතු බව ඔහු අවධාරණය කළේ ය. ඔහු ඉදිරිපත් කළ ඖෂධ ප්‍රතිපත්තිය ලෝක සෞඛ්‍ය සංවිධානයේ ද අවධානයට ලක් විය.



1.14 රූපය

ජීවිතයේ අවසාන භාගයේ දී සිය අත්දැකීම් පදනම් කොටගෙන අත්‍යවශ්‍ය ඖෂධ සාධාරණ මිලකට රෝගීන්ට ලබා දීමේ ප්‍රතිපත්තිය තුන්වන ලෝකයේ සෙසු රටවල ප්‍රචලිත කිරීමේ කටයුතුවල නියුතුව සිටිය දී ඝානාවේ දී ඔහුට අවසන් හුස්ම හෙළීමට සිදු විය.

## ක්‍රියාකාරකම 11

1. ඔබට ඇති බාධා/අභියෝග හඳුනා ගන්න. ඒවායෙන් මිදීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග ලියා දක්වන්න.

2. දී ඇති උදාහරණය සැලකිල්ලට ගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| ඔබට ඇති වූ අභියෝග | එයට මුහුණ දුන් ආකාරය | එහි ප්‍රතිඵල | | |
|---|---|---|---|---|
| | | ඔබට | ඔබේ පවුලේ අයට | පාසලට |
| උදාඃ-පන්ති නායකත්වය නොලැබීම | නායකත්ව ගුණාංග තමා තුළ ඇති කර ගැනීම | තමා පිළිබඳ ආත්ම විශ්වාසය ගොඩනැගීම | තමා පිළිබඳ අභිමානයක් ඇති වීම | සැබෑ නායකත්ව ගුණාංග ඇති සිසුවෙකු වීමට උත්සුක කිරීම |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**සෑම අභියෝගයකට ම මුහුණ දිය හැකි විවිධ මාර්ග පවතින බවත් තමා ඒවා අනුගමනය කළ යුතු බව ඔබත් තේරුම් ගන්න.**

## තමාගේ සංවර්ධනය සඳහා පාසලෙන් ලැබෙන අවස්ථා

පාසලේ දී ඔබ ලබා ගන්නා දැනුම, ආකල්ප, කුසලතා හා පුරුදු යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් වීම සඳහා බෙහෙවින් උපකාරී වේ. පාසල ඔබට විෂය දැනුම හා අවබෝධය ලබා දෙයි. එමෙන් ම තම දක්ෂතා ප්‍රදර්ශනය කළ හැකි අවස්ථා සම්පාදනය කරන අතර සාමූහිකත්වයෙන් ක්‍රියා කිරීමට පුහුණු කරයි.

## තමන්ගේ සංවර්ධනය සඳහා පාසලෙන් ලැබෙන අවස්ථා



1.15 රූපය
ශ්‍රමදානයක නියැලෙන අවස්ථාවක්



1.16 රූපය
පන්ති කාමර ඉගෙනුම



1.17 රූපය
ගුරු මඟපෙන්වීම යටතේ නිදහස් ක්‍රියාකාරකම්වල යෙදෙන අවස්ථාවක්



1.18 රූපය
ගුරු උපහාර උත්සවයක්

### ක්‍රියාකාරකම 12

1. ඉහත දක්වා ඇති පින්තූර ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මේ සඳහා විෂය භාර ගුරුතුමියගෙන් සහාය ලබා ගන්න.)

i. ඉහත රූපවලින් නිරූපණය වන අවස්ථාවලට සහභාගි වීමෙන් පාසල් සිසුවෙකු ලෙස ඔබට අත්වන ප්‍රයෝජන මොනවා ද?

ii. ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක ලෙස ඔබේ චරිත සංවර්ධනයට පාසල ලබා දෙන දායකත්වය පිළිබඳ බිත්ති පුවත්පතට ලිපියක් සකස් කරන්න.

iii. "පාසල අප සුරකින මව වැනිය" යන ආදර්ශ පාඨය මාතෘකා කර ගනිමින් කවි කිහිපයක් නිර්මාණය කරන්න / පාසල් සඟරාවට ලිපියක් රචනා කරන්න.

පාසල් සිසුවකු සිසුවියක ලෙස ඔබ ජීවිතයේ සාර්ථකත්වය උදෙසා උදාර අරමුණු ඇති කර ගත යුතු ය. එම අරමුණු යහපත් වීම හා ඵලදායක වීම ඉතා වැදගත් ය. යහපත් අරමුණු ඇතිකර ගැනීම ඔබේ මෙන් ම සමාජයේ ද ප්‍රගතියට හේතු වේ. 6 ශ්‍රේණියේ සිසුවෙකු/සිසුවියක ලෙස ඔබේ ජීවිතයේ සාර්ථකත්වය උදෙසා කෙබඳු යහපත් අරමුණු ඇති කර ගත යුතු ද?

- ★ සෑම විෂයකට ම ලකුණු 80 ට වැඩියෙන් ලබා ගැනීම
- ★ නායකත්ව කුසලතා වර්ධනය කර ගැනීම
- ★ පාසල වෙනුවෙන් ක්‍රීඩා කිරීමට අවස්ථාවක් ලබා ගැනීම
- ★ මව් බසට අමතර ව දෙවන භාෂා භාවිත කිරීමේ හැකියාව වර්ධනය කර ගැනීම
- ★ පරිගණකය භාවිතය පිළිබඳ කුසලතා වර්ධනය කර ගැනීම

යනාදි වශයෙන් ඔබට නිශ්චිත ඉලක්ක තිබිය යුතු ය. එම ඉලක්ක වෙත ළඟා වීමට අපහසු නම් අවශ්‍ය තැන විකල්ප ක්‍රියා මාර්ග භාවිත කළ යුතු ය. එක් මාර්ගයක් වැසුණ විට තවත් මාර්ගයක් ඔබට විවෘත වනු ඇත. ඔබ කළ යුත්තේ ඒවා පිළිබඳ ව විමසිලිමත් වීම ය. ඇතැම් විට ඉලක්ක කරා යාමේ දී අපට අභියෝග පැන නැගීම, වැරදීම් වැනි දෑ සිදු විය හැකි ය. ඒවාට මුහුණ දීම සඳහා ආත්ම විශ්වාසය, චිත්ත ධෛර්යය, උනන්දුව, කැපවීම මෙන් ම තම දුර්වලතා අවම කර ගැනීම ආදි ගුණාංග අප වර්ධනය කර ගත යුතු ව ඇත.


**තම ඉලක්ක ජය ගැනීම සඳහා මෙන් ම සංවර්ධනය කර ගැනීම සඳහා අවස්ථා සම්පාදනය කර ගැනීමට ඔබට ගත හැකි ක්‍රියා මාර්ග**

- ■ විෂයන්ට අදාළ අතිරේක පොත්පත් කියවීම
- ■ අධ්‍යාපන වැඩසටහන් නැරඹීම
- ■ පෙළපොත් නිසි පරිදි පරිහරණය කිරීම
- ■ දැනුම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම
- ■ ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතුවලින් සහජ කුසලතා ඔප්නංවා ගැනීම

## 1.4 අපි සැලසුමකට වැඩ කරමු

ජීවිතයට සැලසුමක් අත්‍යවශ්‍ය වේ. සැලසුම්කරණය යනු යම් කාර්යයක් වඩා ඵලදායී ලෙස කිරීම සඳහා කාර්ය කොටස් අනුපිළිවෙළකට කාල රාමුවක් ඇතුළත ක්‍රියාත්මක කිරීමයි. නිවසේ දී හා පාසලේ දී තම කාර්යයන් සංවිධානාත්මක ව හා ක්‍රමවත් ව ඉටු කර ගැනීමට හුරු වීම පාසල් සිසුවකු හෝ සිසුවියක වශයෙන් ඉතා වැදගත් ය.

★ උදෑසන අවදි වී නියමිත වේලාවට පෙර පාසලට යෑම සඳහා ඔබ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සඳහන් කරන්න.
උදා : වේලාසනින් නින්දට යෑම හා උදෑසනින් අවදි වීම




1.19 රූපය

## ක්‍රියාකාරකම 13

1) පාසල් ශිෂ්‍යයෙකු ලෙස කාලය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට හැකි වන අයුරින් දෛනික කාල සටහනක් පිළියෙල කරන්න.

**සැලසුම් සහගත හා එසේ සැලසුම් සහගත නොවන ශිෂ්‍යයෙකුගේ හෝ ශිෂ්‍යාවකගේ ලක්ෂණ කිහිපයකට නිදසුන් පහත දැක්වේ.**

| සැලසුම් සහගත ශිෂ්‍යයා | සැලසුම් සහගත නොවූ ශිෂ්‍යයා |
|---|---|
| ක්‍රමානුකූල ව කටයුතු කරයි | අත්‍යවශ්‍ය පියවර අත් හරී |
| කාලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගනියි | වැඩ කල් දමයි |
| තම අරමුණු ඉටු කර ගනියි | පසුතැවීමට ඇති අවස්ථා වැඩි වෙයි |
| ආතතියෙන් තොර වෙයි | ආතතියෙන් යුතුව වැඩ කටයුතුවල යෙදෙයි |
| පහසුවෙන් අභියෝග ජය ගනියි | අභියෝගවලට මුහුණ දීම අපහසු වේ |

**පන්ති කාමරය හා පාසලේ පවිත්‍රතා කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට සහාය වීම**

පන්ති කාමරය පවිත්‍රව හා පිළිවෙළට තබා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩසටහනක් සඳහා සැලසුමක් සකස් කිරීමේ දී ඔබේ අවධානයට ලක් විය යුතු කරුණු

- ★ පන්ති කාමරයේ ඇති පරිහරණය වන දෑ හඳුනා ගැනීම
- ★ පවතින අඩු පාඩු හඳුනාගෙන සටහන් කර ගැනීම
- ★ වඩාත් පවිත්‍ර ව හා පිළිවෙළට තබා ගැනීම සඳහා යෝජනා ලබා ගැනීම
- ★ එම යෝජනාවලින් වඩාත් ඉක්මනින් කළ යුතු දේ තීරණය කිරීම
- ★ එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම

## ක්‍රියාකාරකම 14

ඉහතින් දක්වා ඇති කරුණු සැලකිල්ලට ගනිමින් ඔබේ පන්තියට පැවරුණු 6 ශ්‍රේණියට අයත් පන්ති කාමර ඉදිරිපස කොටස ප්‍රසන්න ආකාරයෙන් සකස් කර ගැනීම සඳහා වැඩසටහනක් සැලසුම් කරන්න.

- පාසලේ හෝ පන්ති කාමරයේ විවිධ අවස්ථාවල දී ක්‍රමවත් ව සැලසුම් සහගත ව කටයුතු කිරීමෙන් අතපසුවීම් අවම කරගෙන අදාළ කටයුත්ත වඩාත් සාර්ථක ලෙස සිදු කිරීමට ඔබට හැකි වෙයි.

- ක්‍රීඩා උත්සවයක දී
- ත්‍යාග ප්‍රදානෝත්සවයක දී
- ළමා දින සැමරුම් උත්සවයක දී
- විවිධ ප්‍රසංගයක දී
- ගුරු උපහාර උළෙලක දී

## 1.5 පාසල් සංස්කෘතිය (School Culture)

පාසලේ පවත්නා නීතිරීති, සම්ප්‍රදායන්, සිරිත් විරිත්, පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත ආදිය පාසල් සංස්කෘතියට අයත් වේ.

**පාසලට නීති පද්ධතියක් අවශ්‍ය වීමට හේතු**

- ⋆ පාසලෙහි හොඳ ඉගෙනුම් වාතාවරණයක් ගොඩනැගීම සඳහා
- ⋆ පාසල ක්‍රමවත් ව පාලනය කිරීම සඳහා
- ⋆ ළමයින් විනය ගරුක පුද්ගලයන් බවට පත් කිරීම සඳහා
- ⋆ පාසලේ සියලු දෙනාගේම අයිතිවාසිකම් මැනවින් ආරක්ෂා කිරීම සඳහා
- ⋆ පාසලේ අනන්‍යතාව ආරක්ෂා කිරීම සඳහා

ඉහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත් විට පාසලේ පවත්නා නීති ඔබ සැමගේ යහපතට හේතුවන බව ඔබට අවබෝධ වන්නට ඇත.

පාසලේ පවත්නා නීති මැනවින් පිළිපැදීමට එම නීති පිළිබඳ ඔබ හොඳින් දැනුම්වත් විය යුතු ය. නීතිගරුක වීම ඔබේ ගෞරවය ආරක්ෂා වීමට හේතු වේ. ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වශයෙන් ඔබට හිමිවන අයිතිවාසිකම් රාශියකි. එම

අයිතිවාසිකම් මැනවින් භුක්ති විඳීමට මෙන් ම ඒ වෙනුවෙන් තම යුතුකම් ඉටු කිරීමට ද සහෝදර සිසු සිසුවියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ද පාසලේ පවත්නා නීති රීති අනුව කටයුතු කිරීම අවශ්‍ය වේ. ඔබ නීති ගරුක නම් එය පාසලේ යහපැවැත්මට ද හේතු වේ.

**ළමයින් සම්බන්ධයෙන් පාසලක පවතින පොදු නීති රීති කිහිපයක්**

- දිනපතා පාසලට පැමිණීම
- පාසල ආරම්භ කරන වේලාවට පෙර පාසලට පැමිණීම
- නියමිත නිල ඇඳුමෙන් සැරසී පාසලට පැමිණීම
- පාසල් පැවැත්වෙන කාල සීමාවෙහි පාසලෙහි රැඳී සිටීම
- කාල සටහන අනුව අධ්‍යාපන කටයුතුවල යෙදීම
- විදුහල්පතිතුමාට/තුමියට හා ගුරු දෙමාපියන්ට අවනත වීම හා ගරු කිරීම
- නායකත්වයට අවනත වීම
- පාසලේ පවතින සම්ප්‍රදායයන් ආරක්ෂා කිරීම

## පාසලේ පවත්නා සම්ප්‍රදායන්

පාසලේ කාලයක් තිස්සේ පැවත එන සිරිත් විරිත් හා පිළිගැනීම් සම්ප්‍රදායන් ලෙස හැඳින්වීමට හැකි ය. පාසලේ පවත්නා නීති රීති මෙන් ම, සම්ප්‍රදායන් ද ඉතා වැදගත් වේ. එම නිසා ඔබ පාසලේ පවත්නා සම්ප්‍රදායන් පිළිබඳ දැනුම්වත් විය යුතු ය. එම සම්ප්‍රදායන් අනුගමනය කිරීමට පුරුදු පුහුණු විය යුතුය. උදෑසන රැස්වීමේ දී මෙන් ම පාසල අවසාන කරන අවස්ථාවේ දී ඔබේ පාසලට ආවේණික සම්ප්‍රදායන් තිබේ.

පාසල් නිල ඇඳුම සකස් කර ගන්නා ආකාරය පිළිබඳ ව ද කාලයක් පුරා අනුගමනය කරන සම්ප්‍රදායන් තිබේ. පාසල් ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී, නිවාසාන්තර ක්‍රීඩා තරගවල දී ඒ ඒ පාසලට සුවිශේෂී සම්ප්‍රදායන් පවතී. විෂයභාර ගුරුතුමා හෝ ගුරුතුමිය සමග සාකච්ඡා කර ඔබේ පාසලේ පවත්නා සම්ප්‍රදායන් හඳුනා ගන්න.

**සම්ප්‍රදායන් රැක ගැනීමේ වැදගත්කම**

- ළමයින් තුළ ශික්ෂණය ගොඩනැගීම
- ආත්මාභිමානයෙන් යුතු පිරිසක් බිහි වීම
- පාසලේ අනන්‍යතාව ආරක්ෂා වීම
- අනාගත සිසු පරපුරට ඒවා පවරා දීමට හැකිවීම

**ක්‍රියාකාරකම 15**

- ඔබේ පාසලේ පවත්නා නීතිරීති දෙකක් හා සම්ප්‍රදායන් දෙකක් ලියන්න.
- ඔබේ පන්ති කාමරයට සුදුසු නීතිරීති මාලාවක් සකස් කර ගන්න.

## පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත

### 1. ආදර්ශ පාඨය (Motto)

පාසලේ ආදර්ශ පාඨය පාසල් සිසුන්ගේ ජීවිතය හැඩගස්වා ගැනීම සඳහා ආදර්ශයක් වන අයුරින් සකස් කර තිබීම විශේෂ ලක්ෂණයකි.

ඔබේ පාසලේ ආදර්ශ පාඨය හා එහි අර්ථය ගැන සාකච්ඡා කරන්න.
පාසලේ ආදර්ශ පාඨය ඔබේ ජීවිතයට ආදර්ශයක් කර ගන්න. එය ඔබේ අනාගත ජීවිතය සාර්ථක කර ගැනීම ට ඉවහල් වේ.

**ක්‍රියාකාරකම 16**

- ඔබේ පාසලේ ආදර්ශ පාඨය ලියන්න.
- එහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

### 2. පාසල් ලාංඡනය (School Crest)

පාසලේ අනන්‍යතාව පෙන්නුම් කරන තවත් සංකේතයක් ලෙස පාසල් ලාංඡනය වැදගත් වේ.



1.20 රූපය

පාසල් ලාංඡනය සඳහා වර්ණ හා සංකේත භාවිත වෙයි. බොහෝ පාසල් ලාංඡනවල පහන, සූර්යයා වැනි සංකේත ඇතුළත් ව තිබෙනු දක්නට ලැබේ. ඔබේ පාසල් ලාංඡනයේ ඇති වර්ණ, සංකේත පිළිබඳ අවධානය යොමු කරන්න. ඒ පිළිබඳ ඔබේ ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න.


**පාසල් ලාංඡනය භාවිත කරන අවස්ථා කිහිපයකට නිදසුන්**

- පාසල් නිල ඇඳුම සමග
- පාසලෙන් නිකුත් කරන ලිපි ලේඛනවල
- පාසලෙන් නිකුත් කරන පොත්පත් හා ප්‍රකාශනවල
- පාසලට අයත් බව ඇඟවීම සඳහා
- පාසලේ අනන්‍යතාව ඇඟවීම සඳහා

**ක්‍රියාකාරකම 17**

- ඔබේ පාසල් ලාංඡනයේ ආකෘතියක් ඔබට පහසුවෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය යොදාගෙන නිර්මාණය කරන්න.
- එහි ඇති වර්ණ හා සංකේතවලින් නිරූපණය වන දේ පැහැදිලි කරන්න.
- ඔබේ පාසල් ලාංඡනය භාවිත කර ඇති අවස්ථා සොයා එම අවස්ථා සටහන් කරන්න.

## 3. පාසල් කොඩිය (School Flag)


1.21 රූපය

පාසල් කොඩිය පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන තවත් සංකේතයකි. පාසල් කොඩිය විවිධ වර්ණ, සංකේත ආදියෙන් සමන්විත වේ. ඇතැම් පාසල් කොඩිවල පාසල් ලාංඡනය හා ආදර්ශ පාඨය ද ඇතුළත් කර නිර්මාණය කර තිබෙනු ඔබ දැක ඇත.

පාසල් කොඩියක ඇති වර්ණ හා සංකේත විවිධ අදහස් නිරූපණය කිරීම සඳහා යොදා තිබේ. ඔබේ පාසල් කොඩියේ වර්ණ හා සංකේතවලින් පිළිබිඹු වන අදහස ගුරුතුමා/ගුරුතුමියගෙන් අසා දැනගන්න.

**පාසල් කොඩිය භාවිත කරන අවස්ථා කිහිපයකට නිදසුන්**

- පාසලේ උදෑසන රැස්වීමේ දී
- නිවාසාන්තර ක්‍රීඩා උත්සවවල දී
- පාසලේ පැවැත්වෙන වෙනත් විශේෂ උත්සවවල දී

**පාසල් කොඩිය ඔසවන අවස්ථාවල දී ප්‍රදර්ශනය කළ යුතු ඉරියව්**

- පාසල් කොඩිය දෙසට මුහුණ ලා සීරුවෙන් සිටීම
- පාසල් කොඩිය අභිමානයෙන් එසවීම
- පාසල් ගීය ගායනා කිරීම

පාසල් කොඩිය පාසල නියෝජනය කරන සංකේතයක් වන බැවින්, එයට ඔබේ නිරන්තර ගෞරවය හිමි විය යුතුය.

**ක්‍රියාකාරකම 18**

- ඔබේ පාසල් කොඩිය චිත්‍රයට නගන්න.
- එහි ඇතුළත් වර්ණ හා සංකේත නම් කර ඒවායෙන් පිළිබිඹු වන දේ කෙටියෙන් පැහැදිලි කරන්න.

## 4. පාසල් ගීතය (School Anthem)

සෑම පාසලකට ම පාසල් ගීතයක් ඇත. එය පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන වැදගත් සංකේතයකි.

**පාසල් ගීතයෙන් ඉටුවන මෙහෙය**

- පාසලෙන් ජාතියට සිදුවන මෙහෙය පිළිබඳ සිතුවිලි ළමයින් තුළ ජනිත කිරීම

- ළමයින් තුළ තම පාසල පිළිබඳ ගෞරවය, අභිමානය හා ආදරය ඇති වීම
- පාසලේ අනන්‍යතාව පිළිබිඹු වීම

ඔබේ පාසල් ගීතය හා එහි අර්ථය මතකයට නගන්න. බොහෝ පාසල් ගීතවල පාසල "මවක" ලෙස සලකා ආමන්ත්‍රණය කර තිබෙනු දක්නට ලැබේ.

**පාසල් ගීතය ගායනා කරන අවස්ථා කිහිපයකට නිදසුන්**

- පාසල ආරම්භයේ දී
- පාසලේ පැවැත්වෙන විශේෂ උත්සව අවස්ථාවල දී
- නිවාසාන්තර ක්‍රීඩා උත්සවවල දී

ඔබේ පාසලේ පාසල් ගීතය ගායනා කරන අවස්ථා සිහිපත් කරන්න.

**පාසල් ගීය ගායනා කරන අවස්ථාවේ දී ප්‍රදර්ශනය කළ යුතු ඉරියවු**

- පාසල් ගීය මතකයෙන් තාලයට ගායනා කිරීම
- පාසල් ගීයට නිසි ගෞරව දක්වෙන ආකාරයට අභිමානයෙන් යුතු ව ගායනා කිරීම
- සීරුවෙන් සිටිමින් ගායනා කිරීම
- පාසල් ගීය ගායනා කරන අවස්ථාවේ දී වෙනත් කිසිදු කාර්යකට අවධානය යොමු නොකිරීම

ඔබත් නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරමින් මතකයෙන් තාලයට පාසල් ගීය ගායනා කිරීමට පුරුදු පුහුණු වන්න.

**ක්‍රියාකාරකම 19**

★ ඔබේ පාසල් ගීතයේ අර්ථය සරල බසින් ලියන්න.

★ ඔබේ පාසල් ගීතයේ සමගිය වැනි ගුණාංග ගැන කියවෙන වදන් හා පාසලෙන් සමාජයට, රටට සිදුවන මෙහෙය කියවෙන වදන් උපුටා දක්වන්න.

★ ඔබේ පාසලට ආසන්නව පිහිටි පාසල් දෙකක පාසල් ගීත එකතු කර ගුරුතුමා / ගුරුතුමියගේ උදවු ඇතිව ඒවායේ අර්ථය විමසා බලන්න.

## 5. පාසලේ දැක්ම (Vision of the school)

පාසලක "දැක්ම" මේ සමග දක්වා තිබේ. එය හොඳින් කියවා එහි අදහස තේරුම් ගැනීමට උත්සාහ කරන්න.

**අප පාසලේ දැක්ම**

ගුණ නුවණින් හා හැකියාවන්ගෙන් පිරිපුන් සිසු පරපුරක් රටට දායාද කිරීම

ඔබේ පාසලේ ''දැක්ම'' හා එහි අදහස ඔබේ ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කර අවබෝධ කර ගන්න.
පාසල අනාගතයේ දී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණ ''දැක්ම'' තුළින් ප්‍රකාශවන බව ඔබට පැහැදිලි වනු ඇත.
ඔබ හොඳින් අධ්‍යාපන කටයුතු නිමකර රටට වැඩදායක යහපත් පුරවැසියකු ලෙස සමාජයට පිවිසුණ විට පාසලේ ''දැක්ම'' ඉටු වනු ඇත.

## 6. මෙහෙවර ප්‍රකාශය (Mission Statement)

ඔබේ පාසලේ මෙහෙවර ප්‍රකාශය ප්‍රදර්ශනය කර ඇති ස්ථානය ගුරුතුමා/ගුරුතුමියගෙන් අසා දැනගන්න. මෙහෙවර ප්‍රකාශය හොඳින් කියවා අභ්‍යාස පොතෙහි සටහන් කර ගන්න. ගුරුතුමා/ගුරුතුමියගෙන් විමසා එහි අර්ථය වටහා ගන්න.
පාසලෙන් සේවය ලබනුයේ සිසු දරු දැරියන් වන ඔබයි. ඔබේ පාසල ඔබ වෙනුවෙන් ඉටුකරන මෙහෙය මෙහෙවර ප්‍රකාශයෙන් දක්වෙයි. එම මෙහෙවර සාර්ථක වීමෙන් යහපත් පුරවැසියන් රටට දායාද කිරීමට හැකියාව ලැබේ.

පාසලෙන් සමාජයට සිදුවන මෙහෙය ඉමහත් ය. මේ නිසා පාසලේ අගය හා එහි වැදගත්කම ප්‍රකට වන කියමනක් පහත දැක්වේ.

“එක් පාසලක් විවෘත කිරීම සිරගෙයක් වසා දැමීමට හේතු වනු ඇත” පාසලෙන් යහපත් පුරවැසියන් සමාජයට දායාද කර දෙන බව මින් කියවේ.

**ක්‍රියාකාරකම 20**

- ඔබේ ගුරුතුමා/ගුරුතුමියගේ උපදෙස් අනුව පාසලේ “දැක්ම” උපුටාගෙන, එය ඔබේ අභ්‍යාස පොතෙහි සටහන් කරගන්න. එහි අදහස විමසා බලන්න.
- වෙනත් පාසලක ඉගෙනුම ලබන ඔබේ මිතුරකුගෙන් එම පාසලේ ''දැක්ම'' අසා දැනගෙන, එය අභ්‍යාස පොතෙහි සටහන් කරගන්න. එහි අදහස විමසා බලන්න.

## 7. පාසල් නිල ඇඳුම (School Uniform)

පාසල් සංස්කෘතිය විදහා දක්වන සංකේතයක් ලෙස නිල ඇඳුම ඉතා වැදගත් වේ. සෑම පාසලක ම සිසුන් සඳහා නියමිත නිල ඇඳුමක් භාවිත වේ. නිල ඇඳුම පිළියෙල කර ගැනීම සඳහා වාර්ෂිකව රජය විසින් නිල ඇඳුම් සඳහා රෙදි නොමිලේ සපයනු ලැබේ.

ඒ ඒ පාසල ට සුවිශේෂ වූ නිල ඇඳුමක් තිබේ. පාසල් නිල ඇඳුම, පාසලේ අනන්‍යතාව ඔබෙන් බාහිර ලෝකයට ප්‍රකාශවන එක් ආකාරයකි.

නිල ඇඳුම නියමිත ප්‍රමිතීන්ට අනුව, පිළියෙල කර ගැනීම පාසලේ අනන්‍යතාව මෙන්ම නීතිය ද වේ. එමගින් පාසලේ අනන්‍යතාව මෙන් ම ළමයින් අතර සමාන බව ද චාම් බව ද පෙන්නුම් කෙරේ.
එබැවින් නිල ඇඳුමෙන් සැරසුණු ඔබ සැමවිට ම ඔබේ පාසලේ ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට වග බලා ගත යුතු ය.

**ක්‍රියාකාරකම 21**

- ඔබේ පාසල් නිල ඇඳුම චිත්‍රයට නගන්න.

## 1.6 අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් හා වගකීම් ඉටු කරමු

පාසල් සමාජයේ සමාජිකයෙකු වශයෙන් ඔබට පහත දැක්වෙන හිමිකම් ලබා දීමට පාසලේ සියලු දෙනා කටයුතු කරති. මේවා පාසලේ සාමාජිකයකු ලෙස ඔබ සතු අයිතිවාසිකම් වේ.

- අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
- තම දක්ෂතා සංවර්ධනය කර ගැනීමට ඇති අයිතිය
- ආරක්ෂා සහිතව සිටීමට ඇති අයිතිය
- සමාන ලෙස සැලකුම් ලැබීමට ඇති අයිතිය
- තම අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය
- සහෝදර සිසු සිසුවියන් ඇසුරු කිරීමට ඇති අයිතිය
- තම අනන්‍යතාව රැක ගැනීමට ඇති අයිතිය

පාසල් අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අවශ්‍ය අවම පහසුකම් ලැබීම ඔබ සතු අයිතිවාසිකමකි. ඔබට ඔබේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට සහ ඔබේ හැකියා වර්ධනය කර ගැනීමට රජය විවිධ පහසුකම් ඔබට සපයා ඇත. නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- නොමිලේ අධ්‍යාපනය ලබා දීම
- නොමිලේ පාසල් පෙළපොත් ලබා දීම
- නොමිලේ පාසල් නිල ඇඳුම් රෙදි ලබාදීම
- විද්‍යාගාර පහසුකම් සැපයීම
- ක්‍රීඩා උපකරණ සැපයීම
- පුස්තකාල පහසුකම් සැපයීම
- පරිගණක පහසුකම් සැපයීම
- භාෂාගාර පිහිටුවීම

අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීම පිළිබඳව ද ඔබේ අවධානය යොමු විය යුතු ය. එසේ යුතුකම් ඉටු කිරීම ඔබේ අයිතිවාසිකම් තව දුරටත් තහවුරු වීමට හේතු වේ.

අධ්‍යාපනය ලැබීම ඔබේ අයිතිවාසිකමකි. හොඳින් ඉගෙනීමේ කටයුතුවල නිරත වීම, විනය ගරුක වීම, නීති ගරුක වීම, සෙසු ළමයින් සමග සමානාත්මතාවෙන් යුතු ව කටයුතු කිරීම ඔබගේ යුතුකම් වේ. එමෙන් ම සෙසු ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන අන්දමින් කටයුතු කිරීම ද ඔබගේ යුතුකමකි. ඔබේ යහළු යෙහෙළියන් අයහපත් ක්‍රියාවල යෙදීමෙන් වළක්වා ගැනීම ද ඔබ සතු යුතුකමක් හා වගකීමක් වේ. සැම විට ම ඔවුන් යහපත් ක්‍රියාවන්ට යොමු කිරීමට උත්සහ කරන්න. පාසලෙහි සම්පත් ආරක්ෂාකාරී ලෙස පරිහරණය කිරීම ද ඔබ සතු වගකීමකි.

ගුරු දෙමාපියන්ට කීකරු වීම, ගෞරව කිරීම ඔබෙන් ඉටු විය යුතු යුතුකම් ය. ඔබට පාසල තුළ ආරක්ෂා සහිත ව සිටීමට අයිතියක් ඇති අතර, සෙසු ළමයින්ගේ එම අයිතියට ගරු කිරීම ඔබගේ යුතුකමකි.

ඔබ ජීවත්වන පරිසරය ආරක්ෂා කිරීමට දායක වීම ද ඔබෙන් ඉටු විය යුතු යුතුකමකි. පන්ති කාමරය පිරිසිදු ව හා අලංකාර ව තබා ගැනීම සඳහා ඔබ උනන්දුවෙන් කටයුතු කළ යුතු ය. එමෙන් ම පවිත්‍ර පාසල් පරිසරයක් පවත්වා ගෙන යාමට ද ඔබට දායක විය හැකි ය.

පාසල් සමාජය විවිධත්වයෙන් යුතු සමාජයකි. විවිධ වයස් මට්ටම්වල ළමයින්ගෙන් පාසල් සමාජය සමන්විත වේ. ඔබට වඩා වැඩිමහල් ළමයි ද ඔබට බාල වියේ පසුවන ළමයි ද පාසලේ ඉගෙනුම ලබති.

එමෙන් ම විවිධ ජනවර්ගවලට අයත් සහෝදර සිසුන් ඔබ සමග ඉගෙනුම ලබන්නට පිළිවන. විවිධ ආගම් අදහන අය ඔබේ පාසලේ සිටිය හැකි ය. ඒ සැම දෙනා ම එක ම පාසල් මවගේ දරුවන් ලෙස සලකා සහෝදරත්වයෙන් කටයුතු කිරීම ඉතා වැදගත් ය.

මෙවන් විවිධතා පැවතුණ ද පාසල් සමාජයේ සියලු ම සාමාජිකයන්ට සමාන අයිතිවාසිකම් හිමි වේ. සියලු දෙනා සතු අයිතිවාසිකම් තහවුරුවන ලෙස කටයුතු කිරීම ඔබගේ යුතුකම හා වගකීම වේ.

**ක්‍රියාකාරකම 22**

- ඔබේ ගුරුතුමාගේ/ ගුරුතුමියගේ උපදෙස් ලබා ගෙන පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න. (එක් අයිතිවාසිකමක් හා බැඳුණ යුතුකමක් නිදසුන් ලෙස දක්වා ඇත.)

| ඔබ සතු අයිතිවාසිකම් | එම අයිතිවාසිකම් හා බැඳුණ යුතුකම් |
|---|---|
| තම අදහස් ඉදිරිපත් කිරීම | සෙසු අයගේ අදහස්වලට ගරු කිරීම |
| අධ්‍යාපනය ලැබීම | ........................................................ |
| පාසලෙහි ආරක්ෂා සහිත ව සිටීම | ........................................................ |
| ඔබේ හැකියා දියුණු කර ගැනීම | ........................................................ |

## ගුරු මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යයාවන් අතර අන්‍යෝන්‍ය යුතුකම් ඉටු කිරීම

ගුරුසිසු සබඳතාව යහපත් ව පැවතීම ළමයින්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක වීමට බෙහෙවින් බලපායි. ගුරුවරුන් වෙනුවෙන් ඔබේ යුතුකම් නොපිරිහෙළා ඉටු කිරීම ගුරු ශිෂ්‍ය සබඳතා යහපත් අන්දමින් පවත්වා ගැනීමට හේතු වේ.

### ගුරු මණ්ඩලය වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම්

★ හොඳින් ඉගෙනීමේ කටයුතුවල යෙදීම.
★ අවශ්‍ය අවස්ථාවල උදව් කිරීම හා සහාය වීම.
★ ගුරු අවවාද අනුශාසනා පිළිගෙන කටයුතු කිරීම.
★ ආචාරශීලී වීම.
★ ගරු කිරීම හා කීකරු වීම.

## ගුරුවර ගුරුවරියන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ඉටුකරන යුතුකම් හා වගකීම්

ඔබට හොඳ අධ්‍යාපනයක් ලබා දීම සඳහා කැපවීමෙන් කටයුතු කිරීම ඔබේ ගුරු මෑණිවරුන් හා ගුරු පියවරුන් ඔබ වෙනුවෙන් ඉටුකරන ඉතා වැදගත් වගකීමකි. ඔබ සැම යහපත් දරුවන් බවට පත් කිරීම ගුරු මණ්ඩලයේ

වගකීම හා යුතුකම වේ. ඒ සඳහා ඔබට ගුරුවර ගුරුවරියන් නොයෙකුත් අවවාද ඔබ වෙත ලබා දෙනු ඇත. එහි අරමුණ අනාගතයේ දී ඔබට යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීමයි.

ඔබට අවශ්‍ය ආරක්ෂාව හා රැකවරණය ලබා දීමට ද ඔබේ ගුරු පිරිස ක්‍රියා කරනු ඇත. ඒ අනුව කටයුතු කිරීම ඔබේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු වීමට හේතු වේ.

එමෙන් ම ඔබගේ ගැටලු විසඳා ගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දීමට ඔබේ ගුරුතුමන් හෝ ගුරුතුමියන් ක්‍රියා කරනු ඇත. අධ්‍යාපන කටයුතු කර ගෙන යාමේ දී යම් යම් ගැටලුවලට මුහුණ දීමට සිදුවිය හැකිය. එමෙන් ම ජීවිතයේ එදිනෙදා කටයුතුවල දී වුවද ගැටලු සහගත අවස්ථා ඇති වීමට පිළිවන. මෙවන් ගැටලු විසඳා ගැනීමටත් ඒවා ජය ගැනීමටත් අවශ්‍ය මග පෙන්වීම් හා උපදෙස් ඔබේ ගුරු මෑණිවරුන්ගෙන් හා ගුරු පියවරුන්ගෙන් ලැබෙයි.

ඔබේ දක්ෂතා හඳුනා ගෙන ඒවා ඔප්නංවා ඔබ සමාජයට හඳුන්වා දීමට විශාල මෙහෙයක් ඉටු කරන්නේ ඔබේ ගුරු මෑණිවරු හා ගුරු පියවරුය. ගුරු ගෞරවය රැකෙන අයුරින් කටයුතු කර ඔවුන්ගේ සේවය ලබා ගෙන රටට වැඩදායී පුරවැසියකු වීමට අධිෂ්ඨාන කර ගන්න.

## ශිෂ්‍ය ශිෂ්‍යාවන් තම සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම්

පාසල් සමාජයේ සාමාජිකයෙකු ලෙස සිසු සිසුවියන් තම සහෝදර සිසුන් හා සිසුවියන් වෙනුවෙන් ඉටු කළ යුතුකම් හා වගකීම් කෙරෙහි ද ඔබේ අවධානය යොමු විය යුතුය.

සහයෝගයෙන් හා සමානාත්මතාවෙන් යුතු ව කටයුතු කිරීම, යහපත් ක්‍රියාකාරකම්වල යෙදීම, අවශ්‍ය අවස්ථාවල උදව් උපකාර කිරීම, පහළ වයස් කාණ්ඩවල පසුවන සහෝදර සහෝදරියන්ගේ රැකවරණය සැලසීම, ඔවුන්ට ආදර්ශවත් වන පරිදි හැසිරීම ඒ අතර ප්‍රධාන වේ.


**ක්‍රියාකාරකම 23**

- ගුරුවර / ගුරුවරියන් වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතුකම් කිහිපයක් ලියන්න.
- ඔබේ සහෝදර සිසු සිසුවියන් වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් ලැයිස්තුවක් පිළියෙල කරන්න.

## 1.7. පාසල හා සමාජය අතර සබැඳියාව

පාසල සමාජය අපේක්ෂා කරන අවශ්‍යතා ඉටු කිරීම සඳහා කටයුතු කරන සමාජයට අත්‍යවශ්‍ය ආයතනයක් ලෙස සැලකේ.

**පාසල හා අවට ප්‍රජාව අතර පවතින විවිධ සබඳතා**





1.22 රූපය

පාසලට සම්බන්ධ විවිධ පුද්ගල කණ්ඩායම් හා සංවිධාන ක්‍රියාත්මක වේ. එම පිරිස් සමඟ පාසල විවිධ ලෙස සම්බන්ධතා පවත්වති. ඉහත රූපයෙන් එම සබඳතා ඔබට පැහැදිලි වෙයි.

**පාසල හා සමාජය අතර අන්‍යෝන්‍ය සබඳතා පැවැත්වීමේ දී පාසලෙන් සමාජයටත්, සමාජයෙන් පාසලටත් සේවා සැලසේ**

**පාසලෙන් සමාජයට සැපයෙන සේවා**

- ★ යහපත් පුරවැසියන් බිහිකිරීම
- ★ ජනතාවගේ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම
- ★ අනාගත නායකයන් පුහුණු කිරීම
- ★ දරුවන්ට අධ්‍යාපනය ලබා දී යහපත් ජීවිතයක් ගත කිරීමට මග පෙන්වීම
- ★ දරුවන් විනයගරුක පුද්ගලයන් බවට පත්කිරීම
- ★ දරුවන්ගේ දක්ෂතා එළි දැක්වීම
- ★ ප්‍රජාවට පණිවිඩ ලබා දීම
- ★ පාසලේ සම්පත් අවශ්‍ය අවස්ථාවල ප්‍රජා අවශ්‍යතා සඳහා ලබා දීම
  උදා -: ක්‍රීඩා පිටි ලබා දීම




**සමාජයෙන් පාසලට සැලසෙන සේවා**

- ★ පාසලේ සංවර්ධන කටයුතුවලට සහාය වීම
- ★ පාසල සතු දේපළ ආරක්ෂා කිරීම
- ★ පාසල අවට සමාජයේ ඇති විවිධ සංවිධානවලින් පාසලට විවිධ සේවා ලබා ගැනීම
- ★ පාසලේ විවිධ උත්සවයන්ට සහභාගි වීම
- ★ ප්‍රජාවගේ සංස්කෘතික උරුමයන් හා සමාජ හරයන් පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීමට කටයුතු කිරීම
- ★ මනා සෞඛ්‍යාරක්ෂණ ක්‍රම, නවීන තාක්ෂණික ශිල්ප ක්‍රම පිළිබඳ පාසල දැනුම්වත් කිරීම

## පාසල ප්‍රජාව හා සම්බන්ධවන ආකාර කිහිපයක් පිළිබඳ ව අපි දැනුම්වත් වෙමු

දැනට ක්‍රියාත්මකවන පාසල් නඟා සිටුවීමේ වැඩ සටහන මඟින් පාසලේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය හා පාසලට සම්බන්ධ සෙසු පිරිස් පාසලේ සංවර්ධනය උදෙසා සහභාගි කර ගැනීමට කටයුතු කරයි.

එහි අරමුණු කිහිපයක් පහත දැක්වේ.

- සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන් ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම
- ශිෂ්‍ය, ගුරු, විදුහල්පති හා ප්‍රජාව අතර 'පාසල තමන්ගේ ය' යන හැඟීම වර්ධනය කිරීම
- සම්පත් භාවිතය ප්‍රශස්ත මට්ටමකට පත් කිරීම
- සෑම දරුවෙකුගේ ම විවිධ අවශ්‍යතා වෙන් වෙන් ව හඳුනා ගැනීම
- පාසලේ ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම්වල නම්‍යශීලීතාවයක් ඇති කිරීම (මේ සඳහා පාසල් සංවර්ධන කමිටුව හා පාසල් කළමනාකරණ කමිටුව පත් කර ඇත)

### ■ පාසල් සංවර්ධන කමිටුව

දෙමාපිය නියෝජිතයන්, ආදි ශිෂ්‍ය නියෝජිතයන්, ආචාර්ය මණ්ඩලයේ නියෝජිතයන් සහ කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයෙකුගෙන් සමන්විත මෙම කමිටුවේ සභාපතිත්වය දරන්නේ විදුහල්පතිවරයා ය. පාසලට අවශ්‍ය සම්පත් ලබා ගැනීම හා භාවිත කිරීම මඟින් පාසල ගොඩනැඟීම මෙම කමිටුවේ කාර්යයි.

පාසල හා ප්‍රජාව අතර සබඳතා ගොඩනැංවීමත් ඒ මඟින් එකිනෙකා අතර දැනුම හා අත්දැකීම් බෙදා හදා ගැනීමටත් මින් අවස්ථාව සැලසේ. සියලු දෙනා ස්වයං පෙලඹවීමක්, ස්වයං මෙහෙයවීමක් ලබමින් පාසලේ පවතින ගැටලු විසඳා ගැනීම මින් සිදු වේ.

### ■ ආදි ශිෂ්‍ය සමිතිය හා සුභ පතන්නෝ

පාසලක් සිය ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමඟ නිරන්තර සම්බන්ධතාවයකින් යුතු ව කටයුතු කිරීම එම පාසලේ සංවර්ධනයට අත්‍යවශ්‍ය වේ. මෙමගින් පාසලේ විදුහල්පතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලය හා වත්මන් සිසු පිරිස සමඟ ද සමීප සබඳතාවක් වර්ධනය වේ. පාසලේ ගොඩනැගිලි හා උපකරණ සපයා ගැනීම, සිසුන්ට දිවා ආහාරය සැපයීම, උපදේශන සේවා ලබා ගැනීම, පාසලේ විවිධ

උත්සවවල දී අවශ්‍ය සහයෝගය ලබාගැනීම ආදි විවිධ අංශවලින් ආදි සිසු සිසුවියන්ගෙන් පාසලට ප්‍රයෝජන ලැබිය හැකි ය. එහෙයින් සෑම විදුහලක් ම මෙම සබඳතා වර්ධනය කර ගැනීමට උනන්දු වේ.

දෙමව්පියෝ, ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ, සුභ පතන්නෝ පාසලේ සම්පත් සංවර්ධනය සඳහා පරිත්‍යාග සැපයීමෙන් හා ශ්‍රමදානවලට සහභාගි වීමෙන් ද, පවිත්‍රතාව, අලංකරණය හා අලුත්වැඩියා කටයුතු වැනි කාර්යයන්හි යෙදීමෙන් ද පාසලට දායකත්වයක් ලබා දෙති. මේ සියලු සබඳතා එම පාසලටත් පාසල අවට ප්‍රජාවටත් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් වේ.

## ■ මහජන නියෝජිතයන් සමඟ සබඳතා පැවැත්වීම

පාසලක දියුණුව සඳහා මහජන නියෝජිතයන්ගේ අනුග්‍රහයෙන් මධ්‍යම රජය හා පළාත් සභාව පාසලේ දියුණු කළ යුතු අංශ සඳහා අවශ්‍ය මුදල්, පාසල් උපකරණ ලබා දේ. මහජන නියෝජිතයන් පාසලට සම්බන්ධ කර ගැනීමෙන් පාසල සංවර්ධනය කර ගැනීමට ඇති අවස්ථා වැඩි වේ.

**සමාජයෙන් පාසලට සැලසෙන සේවා**



1.23 රූපය
පාසලක ශ්‍රමදාන අවස්ථාවක්



1.24 රූපය
පාසලක පැවැත් වූ වෛද්‍ය සායනයක්

පාසල් ප්‍රජා සබඳතා මනාව පැවතීමට පාසල සමාජයට විවෘත විය යුතුයි.

නිදසුන් ලෙස,

- පාසලේ රැස්වීම් ශාලාව, ක්‍රීඩා පිට්ටනිය, ගොඩනැගිලි ප්‍රජාසේවය සඳහා යෙදවීම
- සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම
- කාලීන සෞඛ්‍ය සමාජ හා පාරිසරික ගැටලු සම්බන්ධයෙන් ප්‍රජාව දැනුම්වත් කිරීමේ ව්‍යාපාර

## ප්‍රජාව පාසලේ කටයුතු සඳහා සහාය කර ගන්නා අයුරු

1. ප්‍රජාවෙන් ලබා ගත හැකි භෞතික සම්පත් පාසලේ සංවර්ධනය සඳහා යොදා ගැනීම
2. පාසලේ සංවර්ධනයට යොදා ගත හැකි විවිධ දැනුම් හා කුසලතාවන්ගෙන් හෙබි සම්පත් දායකයන්ගේ සේවය ලබා ගැනීම

නිදසුන් ලෙස, ප්‍රදේශයේ ආයුර්වේද වෛද්‍යවරයා පාසලට ගෙන්වා සාම්ප්‍රදායික අත් බෙහෙත් හා ඖෂධ පිළිබඳ ළමයින් දැනුම්වත් කිරීම.




1.25 රූපය

### ■ ළමා මිතුරු පාසල්

රැකවරණය සහිත වාතාවරණයක සුරක්ෂිත වූ පවිත්‍ර පරිසරයක, සෞඛ්‍යාරක්ෂිත පහසුකම් ඇති පාසල්, ළමා හිතෛෂී හෙවත් 'ළමා මිතුරු පාසලක්' ලෙස සැලකේ. එහි සියලු දෙනා ළමයින්ගේ අයිතිවාසිකම්වලට ගරු කරති. ළමයි දිළිඳු වුවත්, විශේෂ අවශ්‍යතා සහිත වුවත්, රැදුරු බෝවන රෝගවලට ගොදුරු ව සිටියත්, කුමන ජන වර්ගයකට හෝ ආගමික කණ්ඩායමකට අයත් වුවත් සමාන ලෙස සැලකුම් ලබති. ළමයින්ගේ මූලික හිමිකම් සුරැකෙන එබඳු පාසල් ළමා මිතුරු පාසල් ලෙස හඳුනා ගත හැකි ය.

**ළමා මිතුරු පාසල් පරිසරයක හඳුනා ගත හැකි ලක්ෂණ**

★ ජලය හා සෞඛ්‍යාරක්ෂිත පහසුකම් සපයා ඇත
★ සුරක්ෂිත ඉගෙනුම් පරිසරයක් ඇත
★ ප්‍රබෝධවත් පංති කාමර පරිසරයක් ඇත
★ ළමයා කේන්ද්‍ර කරගත් ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රමයක් ක්‍රියාත්මක වේ
★ විවිධ ආකාරවලින් ඉගෙනුමෙහි නිරත වන ළමයින් ගැන සංවේදී ගුරුවරු ඔවුන්ට නිබඳව උදව් කිරීම සඳහා සිය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය වෙනස් කර ගනිති
★ පාසලේ සැලසුම් සකස් කිරීමේ දී හා කළමනාකරණයේ දී ප්‍රජා සහභාගිත්වය ලබා ගනියි

සෑම දරුවෙකු ම සුවිශේෂී දරුවෙකි. ඔවුන්ගේ සුවිශේෂී විභව්‍යතා උපරිමය කරා ගෙන ඒමෙන් රටේ සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් ප්‍රවර්ධනය කර රටට දායාද කිරීමේ භාරධූර කාර්යයට ළමා මිතුරු පාසල උර දෙයි.

උපුටා ගැන්ම : ළමා මිතුරු පාසල, ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

## ක්‍රියාකාරකම 24

1) ඔබ ප්‍රදේශයේ පරිසර විනාශයට තුඩු දී ඇති මිනිස් ක්‍රියාකාරකම් ගැන සොයා බලා ඒවා වළක්වා ගැනීම සඳහා ප්‍රජාව දැනුම්වත් කිරීමට අත් පත්‍රිකාවක් සකස් කරන්න.

2) පාසලක දියුණුව සඳහා සමාජයේ දායකත්වය ලබා ගත හැකි කණ්ඩායම් දෙකකි, ආදි ශිෂ්‍ය සංගමය හා දෙමාපිය කව.
   i. ආදි ශිෂ්‍ය සංගමය මගින් ඉටු කරන කාර්යයන් 3 ක් ලියන්න.
   ii. දෙමාපිය කව මගින් පාසලට ඉටුවන සේවා පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

## සාරාංශය

මෙම ඒකකය අධ්‍යයනය කළ ඔබට

- ආත්මාවබෝධය හා සැලසුම්කරණය ඔබගේ චරිත සංවර්ධනයට ඉවහල් කර ගත හැකි ආකාරය
- පාසල් සංස්කෘතිය හා ඊට අනුගත වීමේ වැදගත්කම
- පාසල් සාමාජිකයෙකු ලෙස ඔබගේ යුතුකම් හා අයිතිවාසිකම්
- පාසල හා බාහිර ප්‍රජාව අතර අන්‍යෝන්‍ය සහයෝගය පාසල හා ප්‍රජාවේ සංවර්ධනයට දායක කර ගත හැකි අයුරු
- පාසලේ යහපත සඳහා බාහිර ප්‍රජාවගේ සහයෝගය ලබාගත හැකි අයුරු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව ලැබෙන්නට ඇත.


# 02 අප ජීවත්වන ප්‍රදේශය

## හැඳින්වීම

ශ්‍රී ලංකාව සොබාදහමේ අපූරු දායාදයන්ගෙන් අනූන දිවයිනකි. මෙහි පවත්නා සරු බිම, වටිනා ස්වාභාවික සම්පත්, හිතකර දේශගුණය, ගුණ ගරුක මිනිසුන් සහ ප්‍රෞඪ ඉතිහාසය අප තුළ අභිමානයක් ජනිත කිරීමට හේතු වෙයි. ඔබ ජීවත්වන ප්‍රදේශය ගැන සිතන්න. ඉහත කී ස්වාභාවික දායාද එකක් හෝ කීපයක හිමිකරුවෙකු වීමේ භාග්‍ය ඔබ ලබා ඇත.

මෙම පරිච්ඡේදයෙන් ඔබ ජීවත්වන ප්‍රදේශය පිළිබඳ අධ්‍යයනයක් කිරීමට ඔබ යොමු කර ඇත. එමෙන් ම ඔබ ප්‍රදේශයේ පිහිටීම, ඔබට උදවුවන ආයතන හා පුද්ගලයන් පිළිබඳ තොරතුරු විමර්ශනය කිරීමට ද මෙම පරිච්ඡේදය ඔබට අවස්ථාව උදා කර දෙනු ඇත.

## 2.1 අප ජීවත්වන ප්‍රදේශයේ පිහිටීම හා විවිධ පරිපාලන රටා




2.1 රූපය - ශ්‍රී ලංකාවේ පරිපාලන ඒකක

## ග්‍රාම නිලධාරී කොට්ඨාසය හඳුනා ගනිමු

අපේ රටේ පරිපාලන බෙදීම් අනුව කුඩා ම පරිපාලන ඒකකය වනුයේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයයි. ගම් එකක් හෝ කිහිපයක් එක් වී ග්‍රාම නිලධාරී කොට්ඨාසය සැකසී ඇත. එය භාර නිලධාරියා ග්‍රාම නිලධාරී ලෙස හැඳින්වේ. ඔහු රජය හා සම්බන්ධ සියලු කටයුතුවල දී ගම් වැසියන් හා ගමේ තොරතුරු සම්බන්ධීකරණය සිදු කරන නිලධාරියා ලෙස ක්‍රියා කරයි.

**ක්‍රියාකාරකම 01**

⋆ පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න

| | |
|---|---|
| 1. තම නිවස අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම<br>අංකය | ..........................<br>.......................... |
| 2. තම පාසල අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම<br>අංකය | ..........................<br>.......................... |

## අප ප්‍රදේශය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

ග්‍රාම නිලධාරී කොට්ඨාස සමූහයක් එක් වී ගොඩනැගෙන පරිපාලන ඒකකය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි. එහි ප්‍රධානියා ප්‍රාදේශීය ලේකම් වේ. තම බල ප්‍රදේශයේ සියලු ම ග්‍රාම නිලධාරී කොට්ඨාසවල රජය හා සම්බන්ධ සියලු රාජකාරී කටයුතුවලට වගකියන බලධාරියා ඔහු වේ.

**ක්‍රියාකාරකම 02**

⋆ ඔබේ පාසල හා නිවස අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මොනවා ද? නම් කරන්න.

# අප ප්‍රදේශය අයත් දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් එක් වීමෙන් ගොඩනැගෙන පරිපාලන ඒකකය දිස්ත්‍රික්කයක් ලෙස හැඳින් වේ. එහි ප්‍රධානියා දිස්ත්‍රික් ලේකම් වේ. මෙවැනි පරිපාලන දිස්ත්‍රික්ක 25 ක් අප රටේ ඇති අතර ඔබ ජීවත්වන ප්‍රදේශය ද මින් එකකට අයත් ය. 2.1 සිතියම මගින් ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක දක්වේ.




**2.1 සිතියම - ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක.**

**ක්‍රියාකාරකම 03**

★ ඉහත සිතියම ඇසුරුකර ගනිමින් තමා ජීවත්වන ප්‍රදේශය අයත් දිස්ත්‍රික්කය ලංකා සිතියමක ලකුණු කරන්න.

# අප අයත් පළාත

ශ්‍රී ලංකාව පළාත් 9 කින් යුක්ත වන අතර එක් පළාතකට දිස්ත්‍රික්ක කිහිපයක් අයත් වේ. අංක 2.2 සිතියම මගින් ශ්‍රී ලංකාවේ පළාත් බෙදීම් දැක්වේ. එය ඇසුරු කර ගනිමින් තම ප්‍රදේශය අයත් පළාත නිවැරදි ව හඳුනා ගන්න.





2.2 සිතියම - ශ්‍රී ලංකාවේ පළාත් බෙදීම

**ක්‍රියාකාරකම 04**

- ඔබ දන්නා පරිපාලන ඒකක ඇසුරින් තම ප්‍රදේශයේ පිහිටීම නිවැරදි ව විස්තර කරන්න.

## 2.2 අප ප්‍රදේශයේ ඇති භෞතික සම්පත්

භෞතික සම්පත් ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වේ. එනම් ස්වාභාවික හා ස්වාභාවික නොවන සම්පත් වශයෙනි. අපට ලැබෙන හිරු එළිය, පිරිසිදු වාතය, පිරිසිදු ජලය, පස, කඳු, තැනිතලා, වනාන්තර, වෙරළ, ගංගා, දිය ඇලි, කලපු ආදිය ස්වාභාවික සම්පත් අතර වේ. ගොඩනැගිලි, යාන වාහන, උපකරණ මිනිසා විසින් නිර්මාණය කළ සම්පත්වලට නිදසුන් වේ. අංක 2.2 රූප මගින් අප සතු භෞතික සම්පත් කිහිපයක් දැක්වේ. මිනිසාගේ පැවැත්මට මේවා අත්‍යවශ්‍ය වන බැවින් මෙම භෞතික සම්පත් පණමෙන් රැක ගැනීම අපගේ පරම යුතුකමකි.



**2.2 රූපය භෞතික සම්පත්**

අප ජීවත්වන ප්‍රදේශයේ මෙවැනි සම්පත් රැසක් දක්නට ලැබේ. හිරු එළිය, වාතය, ජලය, භූමිය, ගොඩනැගිලි සෑම ප්‍රදේශයක ම දක්නට ලැබෙන පොදු සම්පත් අතර වේ. එමෙන් ම ඒ ඒ ප්‍රදේශවලට ආවේණික සම්පත් ද දක්නට ලැබේ. නිදසුන් ලෙස ගංගා, දිය ඇලි, වනාන්තර, කඳු, තැනිතලා, ඛනිජ වර්ග ආදිය පෙන්වා දිය හැකි ය.

## ක්‍රියාකාරකම 05


- ඔබ ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන භෞතික සම්පත් පිළිබඳ ලේඛනයක් පිළියෙල කරන්න.
- ඔබ හඳුනාගත් සම්පත්වල තොරතුරු ඇතුළත් කර නිර්මාණාත්මක අත් පත්‍රිකාවක් පිළියෙල කරන්න.
- ඔබ ප්‍රදේශයේ දක්නට ලැබෙන වෘක්ෂලතා හොඳින් නිරීක්ෂණය කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| ශාක වර්ගයේ නම | විශේෂිත ලක්ෂණ |
|---|---|
| 1. ........................................ | ................................ |
| 2. ........................................ | ................................ |
| 3. ........................................ | ................................ |
| 4. ........................................ | ................................ |

- ඔබ ප්‍රදේශයේ සුලබ ව දක්නට ලැබෙන සතුන් පිළිබඳ නිරීක්ෂණය කර ලේඛනයක් පිළියෙල කරන්න.


## ප්‍රදේශයේ භෞතික සම්පත් ඵලදායී ලෙස භාවිත කරමු.

- භෞතික සම්පත්වලින් ලබා ගන්නා ප්‍රයෝජන කිහිපයක් පහත (2.1) සටහන මඟින් දක්වේ





2.1 - සටහන

අවට ප්‍රදේශයේ පුද්ගල, සමාජ හා ආර්ථික අවශ්‍යතා සඳහා භෞතික සම්පත් භාවිත කරන ආකාරය පහත 2.2 සටහන මගින් ඔබට පැහැදිලි වනු ඇත.




2.2 - සටහන

අප අවට ප්‍රදේශයේ ඇති භෞතික සම්පත් කිහිපයක් මිනිස් අවශ්‍යතා සඳහා යොදා ගන්නා ආකාරය රූප මගින් පහත දක්වා ඇත.



2.3 රූපය

ඔබේ ප්‍රදේශයේ දක්නට ලැබෙන විවිධ භෞතික සම්පත් භාවිත වන අවස්ථා සිහියට නගන්න. ඒවා වඩා කාර්යක්ෂම හා අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කිරීම ඉතා වැදගත් බව සිහියට නගන්න.''මල නොතලා මලින් බඹරුන් රොන් ගන්නා සේ'' සොබා දහමින් ලබා දී ඇති සම්පත් ඒවාට හානියක් නොවන සේ පරිහරණය කිරීම මිනිසා සතු යුතුකමකි. යහපත් පරිසරයක් පවත්වා ගෙන යාම සඳහා එය අත්‍යවශ්‍ය වේ.

### ක්‍රියාකාරකම 06

★ ඔබ ප්‍රදේශයේ භාවිතයට ගන්නා භෞතික සම්පත් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| සම්පත | ප්‍රයෝජනයට ගන්නා අවස්ථා |
|---|---|
| • භූමිය | ................................................................................ |
| • ජලය | ................................................................................ |
| • ඛනිජ වර්ග | ................................................................................ |
| • වෙනත් | ................................................................................ |
| ____________ | ................................................................................ |
| ____________ | ................................................................................ |

## සම්පත් සංරක්ෂණය කරමු

අප ප්‍රදේශයේ ඇති භෞතික සම්පත් මිනිසාගේ පැවැත්මට හා අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා විශාල මෙහෙයක් ඉටු කරයි. එබැවින් පරිසරයේ යහපැවැත්ම සඳහා මෙන් ම අනාගත පරපුර වෙනුවෙන් එකී සම්පත් ආරක්ෂා කිරීම ද අපේ යුතුකමකි. භූමිය, වාතය, ජලය, ගංගා, ඇළදොළ, වනාන්තර, වන ජීවීන් ආදි සම්පත් වර්තමාන මිනිසා විසින් අනිසි අයුරින් පරිහරණය කිරීම නිසා ගැටලු රැසක් පැන නැගී ඇත. එම ගැටලු පරිසරයේ පැවැත්මට මෙන් ම මිනිසාගේ පැවැත්මට ද තර්ජනයක් වී තිබේ. එබැවින් භෞතික සම්පත් මගින් මිනිසාට ලැබෙන මෙහෙය පිළිබඳ ව සිතා බලා ඒවා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය යහපත් ආකල්ප අප සැම දෙනා තුළ ම ගොඩනගා ගැනීම වැදගත් වේ.

**භෞතික සම්පත් සංරක්ෂණයට ගතහැකි ක්‍රියා මාර්ග**

- වනාන්තර සුරැකීම
  උදා : රුක් රෝපණය
- සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ගැනීම
  උදා : පුනර් භාවිතය (නැවත භාවිත කිරීම), ප්‍රතිචක්‍රීකරණය
- සම්පත් නාස්තිය අවම කිරීම
  උදා : ජලය, විදුලිය, ඉන්ධන
- පාංශු සංරක්ෂණය
  උදා : වැටි බැඳීම, ජලය බැසීමේ කානු කැපීම
- දිරාපත් නොවන ද්‍රව්‍ය පසට එකතු නොකිරීම
  උදා : පොලිතීන්
- අපද්‍රව්‍ය ගිනි තැබීම්වලින් වැළකීම
  උදා : පිදුරු, ප්ලාස්ටික්
- ඛනිජ කැනීම් කළ ස්ථාන නැවත ගොඩ කිරීම
  උදා : මැටිවලවල් ගොඩ කිරීම, මැණික් පතල් ගොඩ කිරීම
- විකල්ප ද්‍රව්‍ය භාවිතය
  උදා : දැව වෙනුවට කොන්ක්‍රීට්, ප්ලාස්ටික්

**ක්‍රියාකාරකම 07**

- ඔබ ප්‍රදේශයේ ප්‍රයෝජනයට ගත හැකි එක් භෞතික සම්පතක් තෝරා ගෙන එය සංරක්ෂණයට ගත හැකි ක්‍රියා මාර්ග යෝජනා කරන්න.
- ඔබ කළ යෝජනා අනුව ක්‍රියාත්මක වන ක්‍රියාකාරකමක් චිත්‍රයක් හෝ පෝස්ටරයක් මගින් ඉදිරිපත් කරන්න.

## 2.3 අපේ මානව සම්පත

ප්‍රදේශයේ ජීවත්වන මිනිසුන් අපට සම්පතකි. මිනිසාගේ බුද්ධිමය හැකියා සහ කායික හැකියා වැඩි දියුණු කර ගැනීමෙන් මිනිසා මානව සම්පතක් බවට පත්වී ඇත. අප ප්‍රදේශයේ මෙවැනි මානව සම්පත් රැසක් හඳුනාගත හැකි ය. ගොවි, ගුරු, වෛද්‍ය, හෙද, පෙදරේරු, වඩු, ඉංජිනේරු, කාර්මික, රාජ්‍ය සේවක, පර්යේෂක විද්‍යාඥ, සෞන්දර්යවේදී, මාධ්‍යවේදී ආදි වශයෙන් විශේෂ මානව සම්පත් රැසක් අපට සහාය වේ.


## ක්‍රියාකාරකම 08

- මෙම ඡායාරූපවලින් දැක්වෙන මානව සම්පත් හඳුනාගෙන නම් කරන්න.









- ඔබ ප්‍රදේශයේ සිටින මානව සම්පත් හඳුනා ගෙන ලේඛනයක් සකස් කරන්න.
- ඔබ හඳුනා ගත් මානව සම්පත්වලින් ලැබෙන ප්‍රයෝජන ඇතුළත් වගුවක් පිළියෙල කර ඉදිරිපත් කරන්න.

## මානව සම්පතෙහි අගය වැඩිකරගත හැකි අයුරු

මිනිසා උපතින් විශේෂ වූ හැකියාවලින් යුක්ත වේ. ඒවා බුද්ධිමය හැකියා, කායික හැකියා හා සමාජීය හැකියා වශයෙන් හඳුනා ගත හැකි වේ. මිනිසා සතු සහජ හැකියා දියුණු කර ගැනීම හා ඒවා විධිමත් අයුරින් පුරුදු පුහුණු කිරීම වැදගත් වේ. ඒ සඳහා විවිධ පාඨමාලා හා පුහුණු වැඩසටහන් රැසක් අවට සමාජයේ ක්‍රියාත්මක වේ. ඒ මගින් පුද්ගලයාට තම හැකියා වර්ධනය කර ගෙන අනාගත වෘත්තීය ලෝකය ගොඩනගා ගැනීමට හැකියාව ලැබේ.

මානව සම්පත විධිමත් ව පුහුණු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහත සටහන මගින් දැක්වේ.

රටේ සංවර්ධනය සිදු වේ

↑

ආර්ථික වාසි සැලසේ

↑

වෘත්තිය වශයෙන් දියුණු වේ

↑

වෘත්තිය ඉතා හොඳින් කළ හැකි වේ

↑

වෘත්තීය සුදුසුකම් සපුරා ගත හැකි ය

↑

හැකියා වැඩි දියුණු කරගත හැකි ය

↑

මානව සම්පත පුහුණුවෙන්

සටහන - 2.3

## ප්‍රදේශයේ ආර්ථික කටයුතු

ඔබ ප්‍රදේශයේ ප්‍රදේශවාසීන් සිය ජීවනෝපාය ලෙස විවිධ වෘත්තීන්හි නියැලෙනු ඔබට දැකිය හැකිය. ජීවනෝපායන් බොහෝ විට ඔබ ප්‍රදේශයේ සම්පත් හා බැඳී පවතී. භූමිය පදනම් කරගෙන කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන පිරිස් ඔබ ප්‍රදේශයේ සිටිය හැකි ය. ප්‍රදේශය සතු විවිධ සම්පත් ඇසුරින් කර්මාන්තවල යෙදෙන්නන් ද සිටිය හැකි ය. එම කර්මාන්ත මගින් විවිධ නිෂ්පාදන වෙළෙඳපොළට සැපයෙනු ඇත.

සත්ව පාලනය, වෙළෙඳාම හා වෙනත් රැකියාවල යෙදෙන්නන් ද ඔබ ප්‍රදේශයේ ජීවත්වනවා ඇත. මේ අනුව ඔබ ප්‍රදේශයේ පවතින ආර්ථික කටයුතු පිළිබඳ සිතා බලන්න.

### ක්‍රියාකාරකම 09

- ඔබ ප්‍රදේශයේ ඇති වෘත්තීය සංවර්ධන පාඨමාලා පවත්වන ආයතන හඳුනා ගන්න.
- එම ආයතනවල පැවැත්වෙන පුහුණු පාඨමාලා ඇතුළත් ලේඛනයක් සකස් කරන්න.

- ඉහත තොරතුරු ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- පහත දැක්වෙන වගු සටහන සම්පූර්ණ කරන්න.


| ප්‍රදේශයේ පිහිටි සම්පත් | සම්පත් ආශ්‍රිත නිෂ්පාදන | නිෂ්පාදන ආශ්‍රිත රැකියා |
|---|---|---|
| උදා : මැටි | ගඩොල් | ගඩොල් කැපීම |
| 1 | | |
| 2 | | |
| 3 | | |

## 2.4 ප්‍රදේශවාසීන් සමඟ සාමූහික ව ජීවත්වීම

මිනිස් වර්ගයා ලොව බිහි වූ දා සිට ම සතුන් දඩයම් කිරීමේ දී මෙන් ම විවිධ අභියෝගවලට මුහුණ දීමේ දී ඒ සඳහා තනි තනි ව මුහුණ දීමට හැකියාවක් නොතිබුණි. සතුන් දඩයම් කිරීමට අවශ්‍යවන තීක්ෂණ දෘෂ්ටිය, ඉව දැනීම මෙන් ම ශක්තිමත් හනු හා බාහු ඔවුන් සතු නොවී ය. තියුණු උල් නිය හා දත් නොවී ය. මේ නිසා ආහාර සොයා ගැනීමට මෙන් ම ආරක්ෂා වීමටත් අනෙකාගේ උපකාරය නිතැතින් ම අවශ්‍ය විය.

මිනිසුන් මෙසේ සාමූහික ජීවිතයක් ගත කිරීම නිසා ම මිනිස් සමාජය ගොඩ නැගුණු අතර ඔවුන්ගේ සාමූහික පැවැත්ම දියුණු මානව ශිෂ්ටාචාරයේ ගොඩ නැගීමට හේතු විය.

ඔබ ද ඔබේ අසල්වැසියන් හා ප්‍රදේශවාසීන් සමඟ විවිධ අවස්ථාවල දී එකමුතුව සහයෝගයෙන් කටයුතු කර තිබේ. ශ්‍රමදාන කටයුතුවල දී, ආගමික උත්සවවල දී, අවමංගල්‍යයක දී මෙන් ම හදිසි ආපදාවක දී ද සාමූහික ව කටයුතු කරනු අපට දැකිය හැක. පාසලේ දී මෙන් ම වැඩපොළේ දී ද එකිනෙකාගෙන් ලැබෙන සහාය අපගේ කටයුතු වඩාත් පහසු කිරීමට මෙන් ම කාර්යක්ෂම කිරීමට ද හේතු වෙයි.




2.4 සටහන

ඉහත සටහනට අනුව සාමූහිකත්වය පුළුල් පරාසයක විහිදෙන බව ඔබට අවබෝධ වනු ඇත.




2.5 රූපය - මිනිසුන් සාමූහික ව කටයුතු කරන අවස්ථා

## ක්‍රියාකාරකම 10

- ඔබ ජීවත් වන ප්‍රදේශයේ මිනිසුන් සාමූහික ව කටයුතු කරන අවස්ථා 3ක් ලියන්න.
- ඒවා අතුරින් එක් අවස්ථාවක් තෝරා ගෙන පන්තියේ යහළුවන් සමග එක් වී කෙටි නාට්‍යයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.
- ඔබේ පන්තියේ සියලුම සිසුසිසුවියන් එක් වී පාසලේ යහපත උදෙසා සාමූහික ක්‍රියාකාරකමක යෙදෙන්න. එයින් ඔබ ලද අත්දැකීම් පන්තියේ අනෙක් සිසු සිසුවියන් සමඟ සාකච්ඡා කරන්න.

## සාමූහික ව කටයුතු කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන



සටහන 2.5

**ක්‍රියාකාරකම 11**

- ඔබේ අත්දැකීමක් ඇසුරින් සාමූහිකව කටයුතු කිරීමෙන් වර්ධනය වන ගුණාංග පිළිබඳව පන්තියේ දී සාකච්ඡා කරන්න.

## 2.5 අපට සහයවන්නෝ

සමාජයේ ජීවත්වීමේ දී විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා බාහිර පුද්ගලයන්ගේ සහ ආයතනවල සහාය අපට අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ආයතන සමූහයක් සහ සේවා සපයන්නෝ පිරිසක් සමාජයේ ක්‍රියාත්මක වෙති.

**ක්‍රියාකාරකම 12**

- ඔබ ජීවත්වන ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විවිධ සේවා සපයන රජයේ නිලධාරීන්ගේ ලේඛනයක් පිළියෙල කරන්න.
- එයින් තෝරා ගත් නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් ඉටුවන සේවාවන් දක්වෙන පෝස්ටරයක් නිර්මාණය කරන්න.
- පහත දක්වෙන්නේ ඔබට සහායවන රජයේ සේවකයින් 6 දෙනෙකුගේ සේවාවන් ඇතුළත් විස්තරයකි. එය අවබෝධ කරගෙන අදාළ නිලධාරියා නම් කරන්න.

ගම්වැසියන්ගේ පදිංචිය තහවුරු කිරීම, රජයේ සහනාධාර බෙදීම, ප්‍රදේශයේ නීති විරෝධි කටයුතුවලට එරෙහි ව කටයුතු කිරීම, ගම්වාසීන් පිළිබඳ අවශ්‍ය තොරතුරු රැස් කිරීම ආදි කාර්යයන් රැසක් ඔබ වෙනුවෙන් කරන්නේ ............................

බෝවන රෝග පාලනය, සිසුන්ගේ සෞඛ්‍ය පරීක්ෂාව, වෛද්‍ය සායන හා ජනතාව දැනුවත් කිරීම, එන්නත් ලබා දීමේ වැඩසටහන් ආදිය මෙහෙයවන්නේ ............................

ප්‍රදේශයේ ජනතාවගේ සහනාධාර ලබා දීමට කටයුතු කිරීම, දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ගම් සංවර්ධන ව්‍යාපෘති ආදිය ක්‍රියාත්මක කරන්නේ ............................

මාතෘ හා ළමා සෞඛ්‍යය රැකගැනීමට උපදෙස් දීම, දරුවන් සඳහා පෝෂණ වැඩසටහන් මෙහෙය වීම, ප්‍රදේශයේ මාතෘ හා ළමා සායනවල දී එන්නත් ලබා දීම ආදි කටයුතුවලින් සහාය වන්නේ ............................

රජය පනවන නීතිරීති ආරක්ෂා කිරීම, සාමය රැකීම, බල ප්‍රදේශයේ අපරාධ වැළැක්වීම, හදිසි විපත්වල දී සහන සැලසීම ආදිය මගින් ඔබට සහාය වන්නේ ............................

ඔබට ලැබෙන ලිපි, පාර්සල් බෙදීම, විදුලි පණිවිඩ බෙදීම, ඡන්ද නිල දැන්වීම් පත්‍රිකා බෙදා හැරීම ආදිය මගින් ඔබට සහාය වන්නේ ............................

## අපට උදවුවන ආයතන

මහජනතාවගේ පෞද්ගලික හා රාජකාරී අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සහායවන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන රැසක් ඔබ ජීවත්වන ප්‍රදේශයේ දක්නට ලැබේ. ඉන් තෝරාගත් ආයතන කිහිපයක සේවය අපි අධ්‍යයනය කරමු.

## 1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (Divisional Secretariat)

ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට රාජ්‍ය මට්ටමින් ඉටු කර ගැනීමට අවශ්‍ය සියලු ම සේවා මේ මගින් ඉටු වේ. නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- උප්පැන්න සහතික නිකුත් කිරීම
- ග්‍රාම සේවා සහතිකයට අනුමැතිය ලබා දීම
- බලපත්‍ර නිකුත් කිරීම උදා: දැව කැපීම, ප්‍රවාහනය, ආදායම් බලපත්‍ර, රජයේ ඉඩම් බලපත්‍ර, පරිසර අවසර බලපත්‍ර
- සහනාධාර ලබා දීම
- විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ කටයුතු කිරීම
- හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

**ක්‍රියාකාරකම 13**

- ඔබේ පවුලේ සාමාජිකයන් ඔබ අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉටුකර ගත් සේවා පිළිබඳ අසා ඒවා සටහන් කර ගන්න.

## 2. පළාත් පාලන ආයතන (Local Government Institutions)

පළාත් පාලන ආයතන වර්ග තුනක් දක්නට ලැබේ.

### මහනගර සභා (Municipal Councils)

අතිශය නාගරික, සංකීර්ණ පරිසරයක් සහිත බල ප්‍රදේශ මහනගර සභා ලෙස හැඳින්වේ. මෙවැනි බල ප්‍රදේශ කිහිපයක් අප රටේ ඇත. නිදසුනක් ලෙස කොළඹ, මහනුවර, යාපනය, කුරුණෑගල, නුවරඑළිය, දෙහිවල - ගල්කිස්ස පෙන්වා දිය හැකිය. මෙහි ප්‍රධානියා වන්නේ නගරාධිපතිය. පහත දැක්වෙන්නේ මහනගර සභාව මගින් ඉටුවන සේවාවන් කිහිපයකි.

- වීදි පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම
- ජල මාර්ග ප්‍රතිසංස්කරණය හා කැලිකසළ ඉවත් කිරීම
- මහජන සනීපාරක්ෂාව පවත්වා ගෙන යාම
- පොදු වෙළෙඳපොළ, පුස්තකාල, උද්‍යාන හා ක්‍රීඩාපිටි පවත්වා ගෙන යාම
- පොදු දේපළ ඉදිකිරීම හා පවත්වා ගෙන යාම
- වීදි ලාම්පු නඩත්තු කිරීම

## ක්‍රියාකාරකම 14

- ★ ඔබ අවට ප්‍රදේශය ආසන්නයේ ඇති මහනගර සභාවක නම ලියන්න.
- ★ පහත දක්වෙන සේවාවන්ගෙන් මහනගර සභාවක් මගින් සිදුවන සේවා තෝරා ගෙන දී ඇති කොටුව තුළ '✓' ලකුණ යොදන්න.

- ■ ප්‍රවාහන පහසුකම් ලබා දීම ☐
- ■ නගරයේ ඇති වීදි පිරිසිදු කිරීම හා නඩත්තුව ☐
- ■ කැලිකසළ ඉවත් කිරීම, මහජන සනීපාරක්ෂාව ☐
- ■ ගොඩනැගිලි ඉදිකිරීම ☐
- ■ පොදු වෙළෙඳපොළ, නගර උද්‍යාන, පුස්තකාල පවත්වා ගෙන යාම ☐
- ■ පොදු ස්ථාන සඳහා ජල සම්පාදනය හා ආලෝකය ලබා දීම ☐

## නගර සභා (Urban Councils)

ජනගහනයෙන් හා සංකීර්ණතාවෙන් අඩු එහෙත් නාගරීකරණය වූ ප්‍රදේශ නගර සභා ලෙස හැඳින් වේ. එහි ප්‍රධානියා සභාපති ය. ඔබ අවට ප්‍රදේශයේ ඇති නගර සභාවලින් සිදුවන සේවාවන් කිහිපයක් පහත දක්වේ.

- ■ මහජන සෞඛ්‍ය සේවාවන් සැපයීම
- ■ පුස්තකාල, ක්‍රීඩා භූමි, උයන්, පොදු වැසිකිළි කැසිකිළි පවත්වා ගෙන යෑම
- ■ ජල සම්පාදනය හා ජලය බැස යාම ක්‍රමවත් කිරීම
- ■ මංමාවත්, පොදු ගොඩනැගිලි පාලනය හා නඩත්තුව
- ■ කුණු කසළ බැහැර කිරීම, නගර පිරිසිදු කිරීම

## ප්‍රාදේශීය සභා (Pradeshiya Sabha)

නගර සභාවලට අයත් නොවන ග්‍රාමීය ප්‍රදේශ හා අර්ධ නාගරික ප්‍රදේශ ප්‍රාදේශීය සභාවලට අයත් වේ.

- තම බල ප්‍රදේශයේ මංමාවත් ඉදිකිරීම හා නඩත්තුව
- නාන තොටුපළ, වෙළෙඳ මධ්‍යස්ථාන දියුණු කොට පවත්වා ගෙන යෑම
- කුණු කසළ බැහැර කිරීම හා ප්‍රදේශයේ මංමාවත් පිරිසිදු කිරීම
- නිවාස ඉදිකිරීම අනුමත කිරීම
- සමාජ සුභසාධන කටයුතු පවත්වා ගෙන යාම ආදි සේවාවන් රැසක් මෙමගින් සිදු වේ.

### ක්‍රියාකාරකම 15

★ ඔබ නිවස හෝ පාසල හෝ ආසන්න ප්‍රදේශයේ ඇති ප්‍රාදේශීය පාලන ආයතනයෙන් ඉටුවන සේවාවන් පිළිබඳ සොයා බලා පහත සඳහන් තොරතුරු සම්පූර්ණ කරන්න.

- ප්‍රාදේශීය සභාවේ නම : ..............................................
- පහත සේවාවන් ප්‍රදේශයේ ජනතාවට ලැබේ නම් දී ඇති කොටු තුළ '✓' ලකුණ ද නොවේනම් 'X' ලකුණ ද යොදන්න.

| | |
|---|---|
| මාර්ග පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම | ☐ |
| කුණු කසළ නිසි ලෙස බැහැර කිරීම | ☐ |
| වරිපනම් බදු අය කිරීම | ☐ |
| මාර්ග හා පොදු ස්ථාන ආලෝක කිරීම | ☐ |
| පුස්තකාල හා ළදරු පාසල් පවත්වා ගෙන යාම | ☐ |
| කඩ බදු අය කිරීම | ☐ |

## 3. රෝහල (Hospital)

ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීම සඳහා පැය විසිහතර පුරා ම සේවා සපයන ප්‍රධාන ම ස්ථානය රෝහල වේ. ලෙඩ රෝගවලට හා හදිසි අනතුරුවලට භාජනය වූ විට සුවය ලබා දීම සඳහා රෝහල් වෛද්‍යවරු /වෛද්‍යවරියෝ, හෙදහෙදියෝ ඇතුළු සියලු කාර්ය මණ්ඩල මනා සේවාවක් ඉටු කරති. රජයේ රෝහල් අපට සියලු ම සේවාවන් නොමිලේ සපයයි. එහෙත් එම සේවා නොමිලේ සැපයීම සඳහා රජය අතිවිශාල වියදමක් දරයි.




2.6 රූපය

## 4. ආගමික සිද්ධස්ථාන (Religious Places)

ශ්‍රී ලංකාවේ විවිධ ජනවර්ග හා ආගමික කොටස් වාසය කරති. එබැවින් විවිධ ආගමික සිද්ධාස්ථාන අප අවට ප්‍රදේශයේ දක්නට ලැබේ.

දිවයිනේ එක් දෙසකට ගමන් අරඹන ඔබට එක් පසකින් සෙත් පිරිත් සජ්ඣායනා කරන හඬ ද තවත් පසෙකින් ශුද්ධ වූ කුරානය පාරායනය කරන හඬ ද ඇසේ. විටෙක පල්ලියේ ගීතිකා නාදය ගුවනට මුසුවන විට තවත් අතකින් කෝවිලේ සීනු නාදයට සවන් යොමු කළ හැකි ය. විවිධ ආගමික ජනයා සහයෝගයෙන් හා සමාදානයෙන් වසන අප රටේ ජාතික අනන්‍යතාව ඉන් පිළිබිඹු කරයි.



2.7 රූපය - විවිධ ආගමික සිද්ධස්ථාන

## සිද්ධස්ථාන මගින් සිදුවන සේවා


* දහම් දැනුම ලබා දීම
* ආචාර ධර්ම ඉගැන්වීම මගින් මනා හික්මීමක් ඇති කිරීම
* ආගමික වත් පිළිවෙත්, පූද පූජා පැවැත් වීම
* පෞද්ගලික ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සිදු කිරීම
* ආධ්‍යාත්මික ගුණවගාව වර්ධනය කර ගැනීමට උපකාරී වීම
* මංගල අවමංගල කටයුතුවල දී ආගමානුකූල කටයුතු සිදු කිරීම
* පොදු කටයුතුවල දී නායකත්වය ලබා දීම
* ජාතික අවශ්‍යතාවල දී මුල් වී කටයුතු කිරීම
* අවවාද අනුශාසනා ලබා දීම
* ජනවර්ග අතර සමගිය ඇති කිරීම

### ක්‍රියාකාරකම 16

* ඔබ ප්‍රදේශයේ ඇති විවිධ ආගමික සිද්ධස්ථානවල ලේඛනයක් සකසන්න.
* එම සිද්ධස්ථානවලින් සිදුවන සේවා සඳහා නිදසුන් කිහිපයක් ලියන්න.
* ඔබේ පන්තියේ සිසුන් සමග එක් වී ආගමික සිද්ධස්ථානයක් පිරිසිදු කිරීම හෝ එහි ඇති අවශ්‍යතාවක් සඳහා ශ්‍රමදානයක් සංවිධානය කරන්න.

## 5. සමිති සමාගම් (Societies)

ජනතාවගේ සමාජීය, ආර්ථික, සංස්කෘතික මෙන් ම පාරිසරික ආදී අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සමාජයේ සමිති සමාගම් ක්‍රියාත්මක වේ. මේවා රාජ්‍ය හා රාජ්‍ය නොවන, ස්වේච්ඡා සමිති වශයෙන් වර්ග කර දැක්විය හැකි ය. එවැනි නිදසුන් කිහිපයක් පහත දැක්වේ.




සටහන 2.6

මෙම සියලු ම සමිතිවල නිලධාරියෝ ද සාමාජිකයෝ ද තම ප්‍රදේශයේ ජනතාවගේ පොදු අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා කටයුතු කරති. මෙම සමිති මගින් ප්‍රදේශයේ ජනතාව අතර අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කිරීම, සහයෝගයෙන් හා සාමූහික ව කටයුතු කිරීම, පොදු ගැටලු විසඳා ගැනීමට සහාය වීම ආදි මෙහෙවර රැසක් ඉටු කෙරේ.

### ක්‍රියාකාරකම 17

★ ඔබ ප්‍රදේශයේ ජනතාව එකතු වී පිහිටුවා ගෙන ඇති සමිති කිහිපයක් නම් කරන්න.

★ ඉන් එක් සමිතියක් තෝරා ගෙන එමගින් ජනතාවට සිදුවන සේවය පැහැදිලි කරන්න.

## ප්‍රදේශයේ ඇති සමිති සමාගම්වලින් සිදුවන සේවා

| සමිතිය | සිදුවන සේවා |
|---|---|
| සමුපකාර සමිතිය | සහනදායි වෙළෙඳාම/ කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීම |
| ගොවි සමිති | උපදෙස් සැපයීම/ සහනාධාර ලබා දීම/ සුභ සාධක සේවා සැපයීම |
| ධීවර සමිති | මිල දී ගැනීම්/ සුභසාධක සේවා සැපයීම |
| ග්‍රාම සංවර්ධන සමිති | ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදු කිරීම |
| අවමංගල සමිති | අවමංගල සේවා/ සුභ සාධක සේවා සැපයීම |
| ක්‍රීඩා සමිති | ක්‍රීඩා උත්සව සංවිධානය |

### ක්‍රියාකාරකම 18

★ ඔබේ ගුරුතුමිය / ගුරුතුමා සමඟ සාකච්ඡා කර පන්තියේ සියලුම සිසුන් එක් වී ''ළමා සමාජයක්'' පිහිටුවා ගන්න.

★ ඔබ පිහිටුවා ගත් ළමා සමාජය මගින් සහෝදර සිසු සිසුවියන්ගේ හැකියා සහ දක්ෂතා දියුණු කිරීමට වැඩසටහනක් ක්‍රියාවට නංවන්න.

## අපට සේවා සපයන ආයතනවල යුතුකම්

- තම සේවාවන් නිසි අයුරින් ලබා දීම
- කාර්යක්ෂම ව කටයුතු කිරීම
- නිවැරදි උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දීම
- අපක්ෂපාතීව කටයුතු කිරීම
- සාධාරණ ව කටයුතු කිරීම
- ජනතාව සමග මිත්‍රශීලීව කටයුතු කිරීම
- අයථා ලෙස කටයුතු නොකිරීම

## සේවා ලබන අපේ යුතුකම්

- බදු මුදල් ගෙවීම් නිසි පරිදි සිදු කිරීම
- සේවා සැපයීමේ දී අවශ්‍යවන සහභාගීත්වය නිසි අයුරින් ලබා දීම
- උපදෙස් හා මග පෙන්වීම් නිවැරදිව අනුගමනය කිරීම
- සේවා සපයන ආයතන හා එහි දේපළ රැක ගැනීම
- අයථා අයුරින් සේවා ලබා නොගැනීම
- සේවා සපයන්නන් සමග මිත්‍රශීලී ව කටයුතු කිරීම
- ඔවුන් කරන සේවාවට ගරු කිරීම හා ස්තුති කිරීම

### ක්‍රියාකාරකම 19

- ඔබ ප්‍රදේශයට සේවා සපයන ආයතනයක් තෝරා ගෙන ඉන් ලැබෙන සේවා වෙනුවෙන් ඔබ ඉටුකළ යුතු යුතුකම් සාකච්ඡා කරන්න.

**සාරාංශය**

පුරවැසියෙකු ලෙස ඔබ විසින් මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් තමන් අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, දිස්ත්‍රික්කය හා පළාත හඳුනාගන්නා ලදි. ප්‍රදේශයේ ඇති භෞතික සම්පත් හඳුනාගෙන සමාජ ආර්ථික අවශ්‍යතා අනුව ඒවා යොදාගෙන ඇති ආකාරය ද අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු ආකාරය ද අවබෝධ විය. ප්‍රදේශයේ ඇති මානව සම්පත අගනා ම සම්පතක් වන අතර එය බුද්ධිමය හා කායික හැකියා අනුව වර්ග කළ හැකි ය. එහි ගුණාත්මකභාවය පුහුණුව මගින් වැඩිදියුණු කළ හැකි ය.

ප්‍රදේශයේ ආර්ථික කටයුතු කෘෂි කාර්මික, කාර්මික හා සේවා වශයෙන් වර්ග කළ හැකිය. මෙම කටයුතු බොහෝවිට ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් පදනම් කරගෙන ගොඩනැගී ඇති බව දැන් ඔබට වටහා ගත හැකි ය.

ප්‍රදේශවාසීන්ගේ සාමූහිකත්වය පවුලේ මෙන් ම ප්‍රදේශයේ ද දියුණුවට හේතු වේ. මේ සඳහා විවිධ අවස්ථා දක්නට ලැබෙන අතර එමගින් වැඩ කටයුතු පහසුවන අතර ප්‍රයෝජන රැසක් ද අත්පත් වේ.

ප්‍රදේශවාසීන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට සහාය වන විවිධ පුද්ගලයන් හා සංවිධාන රැසක් දක්නට ලැබේ. ආගමික ආයතන, රාජ්‍ය ආයතන හා පළාත් පාලන ආයතන ප්‍රධාන තැනක් ගනී. රාජ්‍ය නිලධාරීන් හා අනෙකුත් සහායක පුද්ගලයින් රැසක් ඒ හා සම්බන්ධ වී ඇත. ඒ මගින් ප්‍රදේශයේ අවශ්‍යතා රැසක් ඉටු වේ. ඉන් ප්‍රදේශයේ ජනතාවගේ සමාජ ආර්ථික කටයුතු සඳහා මෙන්ම ආධ්‍යාත්මික දියුණුව සඳහා මග සැලසේ. මෙයට අමතර ව සමිති සමාගම් ද විවිධ කටයුතු සඳහා දායක වේ. මෙලෙසින් සේවා ලබන පුද්ගලයින් හා සේවා ලබන ආයතන අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකිරීම වැදගත් වේ. එමගින් පුද්ගලයින් සංවර්ධනය වන අතර සමාජය ද දියුණුවට පත් වන බව මෙම ඒකකය අධ්‍යයනය කිරීමෙන් ඔබට වැටහෙන්නට ඇත.

# 03 යහපත් පුරවැසියෙකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග

## හැඳින්වීම

යහපත් පුරවැසියකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය ගුණාංග වර්ධනය කර ගැනීම පුද්ගලයාගේ සංවර්ධනයට මෙන් ම සමාජයේ සංවර්ධනයට ද හේතු වේ. ඒ සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග අතර ආචාරශීලී ලෙස භාෂාව හැසිරවීම හා විනය ගරුක හැසිරීම ප්‍රමුඛ වේ. සමාජයේ සරු දේ මෙන් ම නිසරු දේ ද පවතී. නිසරු දේ බැහැර කරමින් ජීවිතයට සරු දේ එක් කර ගැනීම හොඳ පුරවැසියකුගේ ගුණාංගයකි. මාතෘ භූමිය සතු වූ සම්පත් මෙන් ම පොදු දේපළ ද සුරකිමින් උපන් දේශයේ අභිමානය රැක ගැනීමට කැපවීම යහපත් පුරවැසියකුගේ වගකීම වේ.

ඉහත ගුණාංගවලට අමතර ව නීති ගරුකවීම හා යුක්තිගරුක වීම වැනි යහපත් ගුණාංග මෙන් ම තවත් බොහෝ ගුණාංග අප විසින් ප්‍රගුණ කළ යුතු ය. එම ගුණාංග හඳුනාගනිමින් ඒවා ජීවිතයට එක් කර ගැනීමට අපි කටයුතු කරමු. එසේ කිරීමෙන් ලොව හොඳ ම පුරවැසියන් ජීවත් වන රට ශ්‍රී ලංකාව බව ලෝකයට පෙන්වා දෙමු.

## 3.1 ආචාරශීලී ව භාෂාව හසුරවමු

පන්ති කාමරයේ මෙන් ම පාසල තුළ දී මිතුරු මිතුරියන් රැසක් ඇසුරු කිරීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. එසේ ම නිවසේ දී ද බාහිර සමාජයේ දී ද විවිධ අය ඇසුරු කරන්නට ඔබට සිදු වේ. ඔබ ඇසුරු කරන අය පිළිබඳව මොහොතක් සිතා බලන්න. මුලින් ම ඔබ එකිනෙකා හඳුනාගත් ආකාරය මතකයට නගන්න. ඔවුන්ගේ නම, ගම, වයස, සහෝදර සහෝදරියන් පිළිබඳ තොරතුරු ආදි පෞද්ගලික විස්තර ඔබ විමසන්නට ඇත. එසේ ම ඔවුන් ද පෙරළා ඔබෙන් තොරතුරු විමසන්නට ඇත. ඒ මොහොතේ ඔබ ඔවුන්ට සුහද ලෙස ප්‍රියමනාප වචනයෙන් කතා කළ බව ඔබට මතක ඇත. ඔවුන් ද ඔබට ආදරයෙන් හා ගෞරවයෙන් ආචාරශීලී ව කතා කළ නිසා ම එකිනෙකා අතර මනා බැඳීමක් ගොඩ නැගෙන්නට ඇත. එහෙත් එසේ කතා නොකළා නම් ඔබ එකිනෙකා අතර සමීප සම්බන්ධයක් ඇති නොවන්නට ඉඩ තිබුණි. එවිට ඔබට සිටින්නේ සුළු මිතුරන් පිරිසකි. ඔබ මිතුරන් අතර හොඳ මිතුරෙකු වීමටත් පවුලේ සුහදශීලි සාමාජිකයෙකු ලෙස සිත් දිනා ගෙන කටයුතු කිරීමටත් ආචාරශීලී ව භාෂාව හැසිරවීමට හුරු විය යුතු ය.

**ආචාරශීලී කථනයේ අංග ලක්ෂණ**

- ★ සංවරශීලී ව කතා කරයි
- ★ නිවැරදි ව හා නිරවුල් ව අදහස් දක්වයි
- ★ අන් අයට ගෞරවයෙන් සලකයි
- ★ නිවැරදි ඉරියව්වල පිහිටා කතා කරයි
- ★ අන් අයට සවන් දෙමින් ඉවසීමෙන් කතා කරයි
- ★ භාෂාව විකෘති නොකරයි
- ★ මුහුණට මුහුණ බලා කතා කරයි
- ★ තැන නොතැන හඳුනා ගෙන කතා කරයි

භාෂාව හැසිරවීමේ දී ඔබ කතා කරන්නේ කාට ද? ඔබ සමඟ හෝ අසල සිටින්නේ කවුරුන් ද? යන්න පිළිබඳවත් ඒ අවස්ථාව කුමක් ද? යන්නත් එම ස්ථානය කුමක් ද? යන්න පිළිබඳවත් මනා අවබෝධයක් ඔබ තුළ තිබීමෙන් සාර්ථක ලෙස භාෂාව හැසිර විය හැකි ය.

**අවස්ථාව, ස්ථානය හා පුද්ගලයා අනුව භාෂාව හැසිරවිය යුතුයි.**

- **අවස්ථාව අනුව**

- ★ මංගල උත්සව හා ප්‍රිය සම්භාෂණ අවස්ථා
- ★ ක්‍රීඩා හා විශේෂ උත්සව අවස්ථා
- ★ අවමංගල උත්සව අවස්ථා
- ★ වාද විවාද, සාකච්ඡාමය අවස්ථා
- ★ පොදු සන්නිවේදන අවස්ථා (ගුවන්විදුලි, රූපවාහිනි, පුවත්පත්, සඟරා, ශබ්ද විකාශන)

- **ස්ථානය අනුව**

- ★ ආගමික ස්ථාන (පන්සල, පල්ලිය, කෝවිල)
- ★ නිවස, පාසල, මහා මාර්ගය, බස්රථය, දුම්රිය

- **පුද්ගලයා අනුව**

- ★ පූජ්‍ය, පූජක පක්ෂය
- ★ අම්මා, තාත්තා
- ★ ගුරුවරුන්, වැඩිහිටියන්
- ★ යහළුවන්, අමුත්තන්

ආචාරශීලී භාෂා භාවිතයෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන රැසකි. එසේ ම ආචාරශීලී ලෙස භාෂාව භාවිත නොකිරීමෙන් අත්වන අවාසි ද බොහෝ ය. පහත වගුව කියවා ඔබත් මෙම අත්දැකීම් ලබා ඇතිදැයි සිතා බලන්න.

| **ආචාරශීලී ලෙස භාෂාව භාවිතයෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල** | **ආචාරශීලී බවින් තොර භාෂා භාවිතය නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵල** |
|---|---|
| ▪ සැමගේ ගෞරවයට ලක් වීම.<br>▪ හිතවත්කම් වැඩි වීම.<br>▪ නායකත්වයට සුදුස්සෙකු වීම.<br>▪ අන් අයගේ ප්‍රසාදය දිනා ගැනීම.<br>▪ යහපත් පුද්ගල සම්බන්ධතා දැඩිව ගොඩනැගීම.<br>▪ ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථා වැඩියෙන් ලැබීම. | ▪ යහපත් පුද්ගල සම්බන්ධතා බිඳ වැටීම.<br>▪ සමාජයෙන් ප්‍රතික්ෂේප වීම.<br>▪ හිතමිතුරන් අඩු වීම.<br>▪ ආර්ථික පාඩු සිදු වීම.<br>▪ නායකත්වය ලැබීමේ අවස්ථා අවම වීම. |

ඇනුම්පද නොකියම්
බැනුම් කැත බස් නොකියම්
නිකම් බස් නොකියම්
තරම් පමණට වදන් තෙපලම්

**(සිරිත් මල්දම ගුරු මුහන්දිරම් ඇම්. ඇල්. සිල්වා)**

**ක්‍රියාකාරකම 1**

පහත දැක්වෙන අවස්ථාවන්ට උචිත භාෂා රටා යොදා ගනිමින් ආචාරශීලී ව අදහස් හුවමාරු කරන ආකාරය ප්‍රදර්ශනය වන ලෙස පන්තියට භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීම සඳහා සංවාදයක් ගොඩ නඟන්න.

- ★ පවුලේ ආගමික කටයුත්තක් සඳහා ආගමික ස්ථානයකට ගොස් පූජ්‍ය හෝ පූජකතුමෙකු සමග කතා කරන අවස්ථාවක්
- ★ කලක් ළඟින් ඇසුරු කළ මිත්‍රයෙකු හදිසියේ හමු වූ අවස්ථාවක්
- ★ තරගයක විනිශ්චය සම්බන්ධ ගැටලුකාරී අවස්ථාවක දී ඒ පිළිබඳ තරග තීරකගෙන් විමසීම දක්වන අවස්ථාවක්

## 3.2 අන් මත ගරු කරමින් සාකච්ඡා කර එකඟතාවට එළඹෙමු

සමාජයේ ජීවත් වන අපට තනි ව ජීවත් විය නොහැකි ය. එබැවින් විවිධ පුද්ගලයන් සමග සම්බන්ධතා ඇතිකර ගැනීමට හා අදහස් හුවමාරු කර ගැනීමට අපට සිදු වේ. අප එකිනෙකා අතර අදහස් හුවමාරු කර ගැනීමේ දී අනෙකාගේ අදහස්වලට හොඳින් සවන් දීමෙන් ඔහු හෝ ඇය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකි වේ. තමාගේ අදහස් අන් අයට මනාව ප්‍රකාශ කිරීමත් ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ දීමත් ඉතා වැදගත් වේ. සවන්දීමේ දී අවධානයෙන් යුතු ව සවන්දීම නිසා අදහස් ප්‍රකාශ කරන්නාට අනෙක් පුද්ගලයා පිළිබඳ ප්‍රසන්න හැඟීමක් ඇති වේ. අදහස් හුවමාරුවේ දී ඇතැම් විට තමාගේ අදහසට එරෙහි වන මත ප්‍රකාශ වීමට පුළුවන. එහෙත් එය ඉවසා සිටීමට තරම් ශක්තියක් ඔබට තිබිය යුතු ය. යම් කරුණක් සම්බන්ධ ව ඔබ තුළ ඇති දැනුමට වඩා පුළුල් දැනුමක් අනෙක් පුද්ගලයාට තිබිය හැකි ය. එම දැනුම හා කරුණුවලින් ඔබ දැරූ අදහස්වලට වඩා නව, ඵලදායී මතයක් නිර්මාණය කිරීමට ඔබට හැකි වනු ඇත. එසේ ම අන් අය සමග යහපත් සබඳතා පවත්වා ගැනීමට නව අදහස් හුවමාරුව ඉතා වැදගත් වේ. වැරදි අවබෝධය නිසා ඇතැම් විට ගැටලුමය හා ගැටුම්කාරී තත්වයක් පැන නැඟීමට හැකි ය. එහෙත් සාකච්ඡා මඟින් එකඟතාවන්ට එළඹෙමින් කටයුතු කිරීම පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතු වේ.

- සවන් දීම යනු හුදෙක් අසා සිටීමයි.
- සක්‍රීය සවන්දීම යනු අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව අසා සිටීමයි.

  සක්‍රීය ව සවන් දුන් පුද්ගලයකු පහත දැක්වෙන ප්‍රතිචාර එකක් හෝ කිහිපයක් දක්වනු ඇත.

  උදාඃ ප්‍රශ්න කිරීම, පිළිතුරු දීම, යෝජනා කිරීම, අනුමත කිරීම

| සක්‍රීය ව සවන් දීමෙන් | සක්‍රීය ව සවන් නොදීමෙන් |
|---|---|
| පණිවිඩ නිවැරදි ලෙස අවබෝධ කර ගනී | පණිවිඩ නිවැරදි ලෙස අවබෝධ කර නොගනී |
| පණිවිඩයට උචිත ප්‍රතිචාර දක්වයි | අපේක්ෂිත ප්‍රතිචාරය නොලැබේ |
| තමා පිළිබඳවත් අන් අය පිළිබඳවත් විශ්වාසය ගොඩ නැගේ | සැකය හා අවිශ්වාසය ගොඩ නැගීමට ඉඩ ඇත |
| යහපත් සමාජ සබඳතා ගොඩ නැගේ | සමාජ සම්බන්ධතා වර්ධනය නොවී හුදකලා වීමට සිදුවේ |
| එකිනෙකා හා සම්මුතිවලට එළඹීමට අවස්ථා උදා වේ | එකඟතා හා සම්මුතිවලට එළඹීමේ අවස්ථා මඟහැරේ |
| සාකච්ඡා මඟින් තීරණවලට එළඹීම නිසා ගැටුම් අවස්ථා අඩු කරයි | එකඟතාවක් ඇති වීම වෙනුවට ගැටලු හා ගැටුම් පැන නැගේ |

**සක්‍රීය සවන්දීමක් සිදුවන්නට නම්**

- ⋆ නිරවුල් ව භාෂාව භාවිත කිරීම
- ⋆ අවධානයෙන් යුතු ව සවන් දීම
- ⋆ අවබෝධයෙන් යුතු ව සවන් දීම අවශ්‍ය වේ.

**ඵලදායී සන්නිවේදනය මගින් යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා සංවර්ධනයට ප්‍රගුණ කළ යුතු ගුණාංග**

- තම අදහස් නිරවුල් ව හා උචිත ලෙස ඉදිරිපත් කිරීම
- අන්‍ය මත ඉවසීම
- අන් අයගේ ඉදිරිපත් කිරීම් අගය කිරීම
- නොගැළපෙන අදහස් ඵලදායි සංවාදයකින් සමනය කිරීම
- අන්‍ය අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම
- එකඟතාවලට හෝ සම්මුතිවලට එළඹෙන්නට වෑයම් කිරීම
- නිසි අවස්ථාවේ තම මතය ඍජුව ඉදිරිපත් කිරීම
- විවෘතව අදහස් දැක්වීම
- සාකච්ඡාවෙන් එකඟවූ මතයට අනුව කටයුතු කිරීම

## ක්‍රියාකාරකම 2

01. සක්‍රිය ව සවන් නොදීමෙන් ඔබ අත්දුටු සිදුවීමක් කෙටියෙන් ලියන්න.
02. සක්‍රිය ව සවන් දීමේ කුසලතා හුරු කිරීමෙන් ඔබට අත්වන ප්‍රයෝජන ලැයිස්තුවක් සකස් කරන්න.
03. "කළුවා මාරපන ගියා වගෙයි" යන කතාව වැඩිහිටියෙකුගෙන් අසා දැනගන්න. කළුවාගේ සවන්දීම පිළිබඳව ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

# 3.3 මනා විනයකින් හා ශික්ෂණයකින් යුතුව කටයුතු කරමු



3.3 - රූපය

**සිදුවීම** : බස්රථයක් හා දුම්රියක් ගැටීමෙන් සිදු වූ අනතුරක්

**දිනය** : 2005 අප්‍රේල් 25

**ස්ථානය** : කුරුණෑගල-අලව්ව මාර්ගයේ අලව්ව නගරයට ආසන්න යාංගල්මෝදර දුම්රිය හරස් මාර්ගය

**අනතුරින් එදින මියගිය සංඛ්‍යාව** : හතලිස් එකයි (41)

**ආබාධිත වූ සංඛ්‍යාව** : තිස් පහකට අධිකයි

**අනතුරට හේතුව** : වසා තිබූ දුම්රිය ගේට්ටුව අතරින් යෑමට උත්සාහ කරද්දී බස් රථය දුම්රියේ ගැටීම

**දඬුවම** : රියදුරුට හා කොන්දොස්තරට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම කිරීම.

ශ්‍රී ලංකාවේ සිදු වන රිය අනතුරු පිළිබඳ තොරතුරු නොයෙක් විට ඔබ අසා ඇත. දිනපතා ම මෙවැනි සිදුවීම් පිළිබඳ වාර්තා මාධ්‍යවලින් නිතර ඔබ දැක හෝ අසා ඇත. ඇතැම් අනතුරු නොසැලකිලිමත්කම හා හික්මීමක් නොමැතිකමින් ද සිදු වේ. ඉහත 3.3 රූප සටහනේ රිය අනතුර සිදු වූයේ රියදුරාගේ අනවශ්‍ය හදිසිය හා විනයක්, හික්මීමක් නොතිබීම නිසා බව තහවුරු විය. එයින් සිදු වූ ජීවිත විනාශය මුදලින් තක්සේරු කළ නොහැකි ය. ඇතැම් පවුලක සිටි එකම දරුවා එයින් මියගිය බව ද වාර්තා විය. එසේම මව්වරුන් හා පියවරුන් ගණනාවක් මිය යෑමෙන් පවුල් ගණනාවක දරුවෝ අසරණ තත්වයට පත් වූහ.

එදා මිය ගියේත්, ආබාධිත වූයෙත් අපේ රටේ වටිනා මිනිස් ජීවිත සමූහයකි. සමාජයේ එක් අයෙකුගේ ක්‍රියා කලාපය මුළු සමාජයටම විවිධ ආකාරයෙන් බලපාන බව මෙයින් මනාව පැහැදිලි වේ. ඒ නිසා සෑම පුද්ගලයෙකු ම මනා විනයකින් හා ශික්ෂණයෙන් යුතු ව ජීවත් වීම මුළු සමාජයට ම යහපතකි.

## 'විනය' හා 'ශික්ෂණය' යනු කුමක්ද?

විනය යන්නෙන් අදහස් වන්නේ සමාජ සම්මතයන්ට අනුව කටයුතු කිරීම හා නීති රීති අනුගමනය කිරීම යි. හික්මීම යනු 'ශික්ෂණය' යි. එනම් නීතිරීති, ව්‍යවස්ථාව හා සිරිත් විරිත් අනුව කටයුතු කිරීමයි. එකිනෙකාට ගෞරව දැක්වීම, ආදරය කිරීම, වරද පිළිගැනීම, සමාව ඉල්ලීම සිදුවන්නේ විනයක් හා ශික්ෂණයක් ඇති විට ය.

**විනය හා ශික්ෂණය සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග :**

- නීතිරීති හා ව්‍යවස්ථාව අනුගමනය කිරීම
- එකිනෙකා කෙරෙහි ගෞරවය දැක්වීම
- සාරධර්ම ගරු කිරීම
- කාරුණික බව
- මානව දයාව
- සහයෝගී බව
- මිත්‍රශීලී බව
- යුක්තිගරුක බව
- අවංක බව
- ඉවසීම
- සත්‍යගරුක බව

## පවුලේ දී හා සමාජයේ දී විනය හා ශික්ෂණයෙන් යුතුව කටයුතු කිරීම

**පවුලේ දී**

- ★ සහෝදර සහෝදරියන් සමඟ සුහද ව හා සමානාත්මතාවෙන් කටයුතු කිරීම
- ★ දෙමාපියන්ට කීකරු වීම, ගරු කිරීම හා සහයෝගය දැක්වීම
- ★ වැඩිහිටියන්ට ගෞරවයෙන් සැලකීම
- ★ ආචාරශීලී ව කතා කිරීම
- ★ විනීත ව හැසිරීම
- ★ වැඩිහිටියන්ගේ සංවාදවලට අනවසරයෙන් මැදිහත් නොවීම
- ★ ගුවන් විදුලිය, රූපවාහිනිය හා පරිගණකය,අන්තර්ජාලය,දූරකථනය භාවිතයේ දී මනා සංවරයෙන් හා සංයමයෙන් යුක්ත වීම

**සමාජයේ දී**

- ★ අසරණයින්ට, ආබාධිතයින්ට, වැඩිහිටියන්ට සහාය වීම
- ★ පොදු දේපළ පරිහරණයේ දී අරපරෙස්සමින් කටයුතු කිරීම
- ★ එකිනෙකා කෙරෙහි ගරුත්වයෙන් කටයුතු කිරීම
- ★ සෑම ආගමකට ම ගෞරව දැක්වීම
- ★ විවිධ ආගමික උත්සවවල දී ගෞරවාන්විත ව හැසිරීම
- ★ තැනට සුදුසු හැසිරීම් සහ ඇඳුම් පැලඳුම් තෝරා ගැනීම
- ★ විවිධ උත්සවවල දී විනයානුකූලව හැසිරීම (ජාතික උත්සව / මංගල උත්සව / අවමංගල උත්සව)

**මනා විනය හා ශික්ෂණය සඳහා පවත්වා ගත යුතු ජීවන පුරුදු**

**මහාමාර්ගයේ දී**

- ★ මාර්ග නීතිරීති පිළිපැදීම
- ★ තමාගේ හා අන් අයගේ ආරක්‍ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් මාර්ග භාවිතය
- ★ මාර්ගය පොදු දේපළක් සේ සලකා පරිහරණය කිරීම
- ★ ඉවසිලිවන්ත ව කටයුතු කිරීම
- ★ අන් අයට ආදර්ශවත් ව කටයුතු කිරීම
- ★ විනය හා ශික්ෂණයෙන් යුතු ව කටයුතු කිරීමෙන් තම අභිමානය රැක ගැනීම

**පාසලේ දී**

- ★ හොඳින් ඉගෙනුම් කටයුතුවල නිරත වීම
- ★ පාසලේ සම්පත් ආරක්‍ෂා වන පරිදි පරිහරණය කිරීම
- ★ පාසලේ ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම
- ★ පාසල් නීතිරීති පිළිපැදීම
- ★ විදුහල්පතිට සහ ගුරුවරුන්ට කීකරු වීම හා ගෞරව කිරීම
- ★ නිල ඇඳුම, පාසල් ලාංඡනය, පාසල් කොඩිය හා ජාතික කොඩියට ගරු කිරීම, ආරක්‍ෂා කිරීම
- ★ විනීත ව හැසිරීම

**මනා විනයක් හා ශික්ෂණයක් පවත්වා ගැනීමේ වැදගත්කම**

- ★ තම අභිමානය සහ ගරුත්වය ආරක්ෂා වීම
- ★ සතුටින් සැහැල්ලු ජීවිතයක් ගත කළ හැකි වීම
- ★ අන් අයගේ ගෞරවයට හා ආදරයට පාත්‍ර වීම
- ★ ජාතික හා ආගමික සහජීවනයක් ගොඩනැගීම
- ★ සමාජයට සම්බන්ධ යහපත් පුරවැසියෙකු බවට පත්වීම
- ★ එකිනෙකා අතර විශ්වාසය තහවුරු වීම
- ★ සමාජයේ ගැටුම් අවම වීම
- ★ රිය අනතුරු, හදිසි අනතුරු අවම වීම
- ★ දඬුවමට හා අවමානයට ලක් නොවීම
- ★ සාමකාමී සමාජයක් බිහි වීම
- ★ සමාජ සාරධර්ම හා ගුණධර්ම අගයන සමාජයක් බිහි වීම

**ක්‍රියාකාරකම 3**

- පාසල, මහා මාර්ගය, නිවස යන ස්ථානවල දී මනා විනයකින් හා ශික්ෂණයකින් යුතු ව හැසිරිය යුතු ආකාර ලැයිස්තු ගත කරන්න.

## 3.4 සරු නිසරු දේ හඳුනා ගනිමු

ඔබ ජීවත් වන සමාජය තුළ හොඳ සහ නරක පැතිර පවතී. ඔබ ඇසුරු කරන අය අතර හොඳ අය මෙන් ම නරක අය ද සිටිය හැකි ය. හොඳ අය ඇසුරු කිරීමෙන් ඔබට හොඳ ප්‍රතිඵල අත් වෙයි. නරක අය ඇසුරු කිරීමෙන් අයහපත් ප්‍රතිඵල ලැබෙයි. සමහර විට එක ම පුද්ගලයාගේ පවා හොඳ නරක දෙක ම පවතී. ඔබ වටා තිබෙන දේ දිහා හොඳින් විමසා බලා කටයුතු කිරීමෙන් අනාගතය සරු කරගන්න ඔබට පුළුවන. ඔබේ ජීවිතයට වැදගත් වන සරු දේ මොනවා ද? ඔබ අත්හළ යුතු නිසරු දේ මොනවා ද? කියා විමසා බලමු.

**සමාජයේ ක්‍රියාත්මක වන සරු දේ** | **ඉන් අත්වන ප්‍රතිඵල**

| සමාජයේ ක්‍රියාත්මක වන සරු දේ | ඉන් අත්වන ප්‍රතිඵල |
|---|---|
| අධ්‍යාපනය ලැබීම | දැනුම ලැබීම<br>උගතෙකු වීමට හැකිවීම<br>යහපත් ජීවිතයකට පදනම ලැබීම |
| ආගම හැදෑරීම හා ඒ අනුව කටයුතු කිරීම | විනයවත් ජීවිතයක් ගත කළ හැකිවීම<br>මානසික ප්‍රබෝධය ඇති වීම<br>අභිමානවත් සංවරශීලී පුද්ගලයින් බවට පත් වීම |
| නිරෝගී, සෞඛ්‍ය සම්පන්න ජීවිත ගත කිරීම හා නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම | නිරෝගී පුද්ගලයෙකු වීම<br>සතුටින් ජීවත් වීමට හැකිවීම |
| ගැළපෙන ඇඳුම් තෝරා ගැනීම | සමාජයේ පැසසුමට ලක් වීම<br>සුව පහසුවෙන් සිටීමට හැකි වීම |
| සන්නිවේදන මාධ්‍ය (දුරකථන, අන්තර්ජාලය, මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය) විචාරශීලී ව (තෝරා බේරා ගෙන) භාවිත කිරීම | කාලය ඉතිරි වීම<br>දැනුම විනෝදය ලැබීම<br>සිතීමට මග පෑදීම<br>දැනුම අලුත් වීම |
| විපතේ දී අත් නොහරින පරාජයේ දී ධෛර්යවත් කරන ජයග්‍රහණයේ දී සතුටු වන යහපත් ගුණ ඇති මිතුරන් ඇසුරු කිරීම | දුක සැප බෙදා හදා ගැනීම<br>ආදර්ශ හා උපදෙස් ලැබීම<br>ආරක්‍ෂාව ලැබීම<br>සමාජ ප්‍රශංසාවට ලක් වීම |

**සමාජයේ ක්‍රියාත්මක වන නිසරු දේ හඳුනා ගනිමු.**

- ★ අධ්‍යාපනයෙන් බැහැර වීම
- ★ තමන්ට නොගැළපෙන මිතුරන් ඇසුරු කිරීම (පාපී මිතුරන් ඇසුරු කිරීම)
- ★ ආගමික හැදියාවකින් තොර ව කටයුතු කිරීම
- ★ වෙළෙඳ ප්‍රචාරණයට රැවටීම
- ★ අන්ධ භක්තියෙන් කටයුතු කිරීම
- ★ විනය විරෝධී ක්‍රියාවල යෙදීම
- ★ නීති විරෝධි කටයුතුවල යෙදීම
- ★ සංස්කෘතියට නොගැළපෙන විලාසිතා භාවිතය
- ★ නුසුදුසු ආහාරපාන භාවිතය
- ★ නිසරු මාධ්‍ය වැඩසටහන්, අන්තර්ජාල දර්ශන නැරඹීම, සවන් දීම හා භාවිතය

- ★ වැරදි කර්මාන්තවලින් ආදායම් ලැබීම
- ★ මත් ද්‍රව්‍ය, මත් වතුර, දුම්වැටි ආදි දේ පරිහරණය හා පරිහරණය කරන්නන් ඇසුරු කිරීම

ඇතැම් දේ තුළ සරු හා නිසරු යන දෙක ම පවතී. උදාහරණයක් ලෙස ජංගම දූරකථනය අපට ඵලදායී, බහුකාර්යය උපකරණයක් ලෙස යොදා ගත හැකි යි. එම උපකරණය ම අනවශ්‍ය ලෙස භාවිත කිරීමෙන් නිසරු ප්‍රතිඵල අත් වෙයි. එලෙස ම පරිගණකය, රූපවාහිනිය, ගුවන් විදුලි යන්ත්‍රය, සිනමාව ආදී සියල්ලක් ම සරු ලෙස යොදා ගැනීමටත්, නිසරු ලෙස භාවිත කිරීමටත් හැකි වේ. වෙළෙඳපොළේ ඇති ආහාර පාන අපේ සිත් ඇද ගන්නා විලාසයෙන් තිබුණත් ඒවායේ ඇති ගුණය, සෞඛ්‍ය ආරක්ෂිත බව, ඔබේ ජීවිතයට බලපාන ආකාරය පිළිබඳ අවධානය යොමු කළ යුතු ය. සමාජය තුළ ඇති නිසරු දේ ඔබේත් සමාජයෙත් පරිහානියට බලපාන බව සිහි නුවණින් යුතු ව සලකා බලා කටයුතු කිරීමට හුරු වෙමු.

## ක්‍රියාකාරකම 4

සමාජයේ ක්‍රියාත්මක වන සරුදේ ක්‍රියාත්මක කිරීමෙන් ඔබේ ජීවිතයට ළඟා කර ගත හැකි ප්‍රතිඵල හා නිසරු දේ ක්‍රියාත්මක කිරීමෙන් අත්වන අයහපත් ප්‍රතිඵල දක්වමින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| සමාජයේ ක්‍රියාත්මක වන සරු දේ | සරු දේ ක්‍රියාත්මක කිරීමෙන් අත්වන ප්‍රතිඵල | සමාජයේ ක්‍රියාත්මක වන නිසරු දේ | නිසරු දේ ක්‍රියාත්මක කිරීමෙන් අත්වන ප්‍රතිඵල |
|---|---|---|---|
| 1. පොත් කියවීම<br>2. කවි ලිවීම<br>3. නව නිපැයුම් සිදු කිරීම<br>4. ක්‍රීඩා කිරීම<br>5. මුද්දර එකතු කිරීම<br>6. අන්තර්ජාලය භාවිතය<br>7. රූපවාහිනිය හා ගුවන් විදුලිය භාවිතය<br>8. දේශිය දේ අගය කිරීම<br>9. දේශීය උරුමයන් රැකගැනීම | 1<br>2<br>3<br>4<br>5<br>6<br>7<br>8<br>9 | 1<br>2<br>3<br>4<br>5<br>6<br>7<br>8<br>9 | 1<br>2<br>3<br>4<br>5<br>6<br>7<br>8<br>9 |

## 3.5 අපේ සම්ප්‍රදායන් හා නීති රීති ගරු කරමු

අපේ සමාජ ජීවිතයේ විවිධ අවස්ථාවලට සම්බන්ධ ව පවතින සම්ප්‍රදායන් තිබේ. එමෙන් ම යහපත් පාලනයක් පවත්වා ගැනීම සඳහා පනවා ඇති නීති රීති රාශියක් ද තිබේ. මේ අංශ දෙකෙන් ම සමාජ යහපත හා පුද්ගලයන්ගේ යහපත උදා වෙයි. ජාතික කොඩිය හා පාසල් කොඩිය ඔසවන අවස්ථාවල දී මෙන්ම ජාතික ගීය හා පාසල් ගීය ගායනා කරන විට අප සියලු දෙනා ඊට ගරු කළ යුතු ය. එයට හේතුව එය අපේ සම්මතයක් හා සම්ප්‍රදායක් බවට පත් වී ඇති බැවිනි. එහි දී අපි සියලු දෙනා  සමාජ සම්ප්‍රදායන් හා නීතිරීති ගරු කරන සම්මතයන්ට අනුව කටයුතු කරන කණ්ඩායමක් බවට පත් වෙමු.

වයඹ පළාතේ නවෝදයා මහා විද්‍යාලයේ 6 ශ්‍රේණියේ ළමයින් විසින් 'සමාජ සම්ප්‍රදායන් හා නීති රීති ගරු කරමු' යන මාතෘකාව යටතේ ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක් පවත්වන ලදී. මේ සඳහා හිරු හා සඳු ලෙසින් ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් වැඩසටහන පැවත්වීය. පාසලේ පුරවැසි අධ්‍යාපනය හා ඉතිහාසය විෂයභාර ගුරුතුමන්ලා විසින් වැඩසටහන මෙහෙයවන ලදී.

**හිරු කණ්ඩායම** **සඳු කණ්ඩායම**



සම්ප්‍රදාය යන්න පැහැදිලි කර උදාහරණ 03 ක් කියන්න.



අතීතයේ සිට නැවත පැවත එන සමාජ සම්මතයන් සම්ප්‍රදායන් ලෙස හැඳින්වෙනවා. උදාහරණ ලෙස

1 තම සමාජයේ ඇති සිරිත් විරිත් ගරු කිරීම.

2 වැඩිහිටියන්ට ගරු කිරීම

3 තම සංස්කෘතික උරුමයන් රැක ගැනීම



"නීතිය" යනු කුමක් ද? උදාහරණ කිහිපයක් කියන්න



පුද්ගල හා පොදු සමාජ යහපත සඳහාත් පුද්ගලයන්ගේ බාහිර හැසිරීම පාලනය කිරීම සඳහාත් රජය පනවා ඇති කොන්දේසි නීති ලෙස හැඳින්විය හැකි ය. උදා: මාර්ග නීති, අපරාධ සම්බන්ධ නීති ආදිය. නීතියක් උල්ලංඝනය කළ හොත් ඊට දඬුවමක් ඇත. නීතිය සැමට ම පොදුයි.



රීතිය යනු කුමක් ද?

රීති යනු නොකළ යුතු බවට සම්මතයේ ඇති කොන්දේසි සමූහයකි



සිරිත් විරිත් කියන්නේ මොනවා ද?
උදාහරණ 03 ක් දෙන්න





සිරිත් යනු අප අනුගමනය කළ යුතු දේ ය. විරිත් යනු අප විසින් නොකළ යුතු දේ ය.

සිරිත්

1 ආගමික කටයුතු සිදු කිරීම
2 දෙමාපියන් නැමදීම හා ගුරුවරුන් නැමදීම
3 සංවරව කතාබස් කිරීම

විරිත්

1 හිස කෙස් සැපීම හා නියපොතු සැපීම
2 දෙදෙනෙකුගේ රහස් කතාවට හොරෙන් සවන්දීම
3 තමන්ට නුසුදුසු ඇඳුම් පැලඳුම්වලින් සැරසීම



සම්ප්‍රදායන් අනුගමනය කිරීමෙන් ඇතිවන වාසි හතරක් කියන්න?



1 සාමකාමී පරිසරයක් ඇති වීම
2 අන්‍යෝන්‍ය ගෞරවය ඇති වීම නිසා ගැටුම් අවම වීම
3 එකිනෙකා අතර ආදරය හා විශ්වාසය ඇති වීම
4 යහපත් පාලනයක් සඳහා පරිසරයක් ගොඩ නැගීම

නීති රීති අනුගමනය කිරීමෙන් ඇතිවන වාසි 03 ක් කියන්න.





1 යහපත් නායකයන් බිහි වීම
2 නීති ගරුක සමාජයක් බිහි වීම
3 සාමකාමී සමාජ පරිසරයක් ඇති වීම

සියලු දෙනා ම හොඳින් ප්‍රශ්නෝත්තර තරගයට සහභාගි වුණා. පිළිතුරු සියල්ල නිවැරදියි. මේ තරගයෙන් කණ්ඩායම් දෙකේ සියලු දෙනා ම සම ලකුණු ලබා ගෙන තිබෙන නිසා කණ්ඩායම් දෙක ම අද මේ තරගයෙන් ජයග්‍රහණය කරනවා. මේ තරගයේ දී සමාජයේ පවතින සම්ප්‍රදායන් හා නීති රීති පිළිබඳ ව ඔබට දැනුමක් ලැබෙන්න ඇති.

සම්ප්‍රදායන් හා නීති රීතිවලට ගරු කිරීම හා ඒවා පිළිපැදීම අප සියලු දෙනාගේ ම වගකීමක් වන අතර එය සමාජ යහපතට හේතු වේ.

## ක්‍රියාකාරකම 5

1. මහමග දී රියදුරන් හා පදිකයින් පිළිපැදිය යුතු නීති රීති ඇතුළත් පොත් පිංචක් සකස් කරන්න.

2. නිවෙසේ දී හා පාසල තුළ දී අනුගමනය කරන සම්ප්‍රදායන් ලැයිස්තුවක් සකස් කරන්න.

## 3.6 සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කරමු

ස්වභාව ධර්මයෙන් අපට ලැබී ඇති දායාද **සම්පත්** ලෙස හැඳින්විය හැකි ය. අප ප්‍රයෝජනයට ගන්නා එවන් සම්පත්වලට නිදසුන් පහත දැක්වේ.

- හිරු එළිය
- වාතය
- ජලය
- වනාන්තර
- භූමිය
- ඛනිජ සම්පත්
- වන සතුන්

මෙම ස්වාභාවික සම්පත් මිනිසාගේ පැවැත්මට මෙන් ම අප අවට පරිසරයේ පැවැත්මට ද ආධාර වේ. එමෙන් ම විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා පරිසරයේ ඇති විවිධ සම්පත් අපි ප්‍රයෝජනයට ගන්නෙමු. වාතය, ජලය, හිරු එළිය වැනි සම්පත් අපේ දිවි පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන සම්පත් ය.

ස්වභාව ධර්මයේ දායාද වන භූමිය, වනාන්තර, ඛනිජ සම්පත් ආදිය භාවිත කර අපට අවශ්‍ය විවිධ දෑ නිපදවා ගන්නෙමු. ඔබේ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා නිවසේ දී හා පාසලේ දී භාවිත කරන විවිධ උපකරණ පිළිබඳ සිතා බලන්න. ඒවා සියල්ල පරිසරයේ ඇති සම්පත් භාවිත කර මිනිසා, නිර්මාණය කළ සම්පත් ය.

මිනිසා, නිර්මාණය කළ සම්පත්වලට නිදසුන් ඃ

- ලීබඩු
- පිඟන් භාණ්ඩ
- පරිගණක හා විදුලි උපාංග
- වීදුරු භාණ්ඩ
- උළු ගඩොළු
- වාහන

මෙම රූපයේ දැක්වෙන දෑ කෙරෙහි අවධානය යොමු කරන්න. ඒවා නිර්මාණය කිරීම සඳහා භාවිත කර ඇති සම්පත් පිළිබඳ සිතා බලන්න.






3.4 රූපය

## සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කළ යුත්තේ ඇයි?

අප ප්‍රයෝජනයට ගන්නා බොහෝ සම්පත් සීමිත බව ඔබ දන්නවා ද?

ජලය අපට අත්‍යවශ්‍ය සම්පතකි. පානය සඳහා මෙන් ම එදිනෙදා අවශ්‍යතා සඳහා ජලය ප්‍රයෝජනවත් වේ. එමෙන් ම ආහාර බෝග වගාව, කර්මාන්ත සහ තවත් විවිධ අවශ්‍යතා සඳහා ජලය ප්‍රයෝජනවත් වේ. පෘථිවි තලයෙන් වැඩි කොටසක් ජලයෙන් වැසී තිබුණ ද පානය සඳහා සුදුසු ජලය ඇත්තේ ඉතා සීමිත ප්‍රමාණයකි. මිනිසාගේ විවිධ ක්‍රියාකාරකම් නිසා ජලය අපවිත්‍ර වී ඇති අවස්ථා ගැන නිතර අපට අසන්නට ලැබේ. එහෙත් ඒවා පෘථිවිය මත හට ගන්නට වසර දහස් ගණනක් ගත වේ. මේ නිසා ජලය අරපිරිමැස්මෙන් යුතු ව ප්‍රයෝජනයට ගැනීමටත්, ජලය අපවිත්‍ර වීම වළක්වා ගැනීමටත් අප උනන්දු විය යුතු ය.

භූමිය ද සීමිත සම්පතකි. කඳු, ජලාශ, වගුරුබිම් ආදිය හැරුණු විට මිනිස් වාසය සඳහා මෙන් ම ආහාර භෝග වගාව වැනි විවිධ අවශ්‍යතා සඳහා යොදා ගත හැකි බිම් සීමා සහිත වේ.

අපේ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා යොදා ගන්නා ඛනිජ තෙල්, ගල් අඟුරු, යකඩ, තඹ, ටින්, වැලි, මැටි ආදි ඛනිජ සම්පත් ද සීමිත සම්පත් ය. එමෙන් ම එම සම්පත් ප්‍රයෝජනයට ගනිද්දී ක්ෂය වී යයි. සරල උදාහරණයක් මඟින් මෙය ඔබට පැහැදිලි කර ගත හැකි ය. මෝටර් රථයකට පෙට්‍රල් වැනි ඉන්ධනයක් යෙදූ විට එය දහනය වී, නිපදවෙන බලයෙන් රථය ධාවනය වේ. දහනය වූ ඉන්ධන ප්‍රමාණය කිසිදු ආකාරයකින් නැවත ආපසු නොලැබේ. ගල් අඟුරු වැනි සම්පත් ද එසේ ක්ෂය වන සම්පත්වලට නිදසුන් ය. එහෙත් ඒවා පෘථිවිය මත හට ගන්නට වසර දහස් ගණනක් ගත වේ. මේ නිසා අපි මෙම සම්පත් අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කරමු.

කර්මාන්ත අංශයේ ඇති වන දියුණුව ද සම්පත් ප්‍රයෝජනයට ගන්නා ප්‍රමාණය ඉහළ යාමට තවත් හේතුවකි. ජනගහනය වැඩි වීමත්,මිනිස් අවශ්‍යතා වැඩිවීමත් නිසා සම්පත් ප්‍රයෝජනයට ගන්නා ප්‍රමාණය දිනෙන් දින ඉහළ යයි.

පෘථිවිය මත බොහෝ සම්පත් සමාන ව ව්‍යාප්ත වී නැත. වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිළිබඳ ගවේෂණ සිදු කෙරේ. ගල් අඟුරු ශ්‍රී ලංකාවෙන් මෙතෙක් සොයා ගෙන නැත. මේ නිසා සමහර ඛනිජ සම්පත් වෙනත් රටවලින් ආනයනය කර ගැනීමට සිදු වේ. ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට ද සිදු වේ.

මේ නිසා අපගේ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සම්පත් අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කිරීමට අප පුරුදු පුහුණු විය යුතු ය. එසේ ම අනාගත පරපුරට ඒවා ඉතිරි කර තැබීමත් අපගේ යුතුකම හා වගකීම ලෙස සැලකිය යුතු ය.

**සම්පත් අපතේ යෑම වැළැක්වීමට පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබට දායක විය හැකි ආකාරය**

| සම්පත | නාස්තිය වැළැක්වීම සඳහා ඔබට කළ හැකි දේ |
|---|---|
| ජලය | ■ අවශ්‍ය ප්‍රමාණයට ජලය ගලා එන පරිදි ජල කරාමය විවෘත කිරීම<br>■ ජල කරාමය භාවිතයෙන් පසු හොඳින් වසා තැබීම<br>■ සේදීම සඳහා ජලය ලබා ගන්නා විට භාජනයක් භාවිත කිරීම |
| විදුලිය | ■ පාවිච්චියට නොගන්නා අවස්ථාවේ දී විදුලි උපකරණ ක්‍රියා විරහිත කර තැබීම<br>■ විදුලි ස්ත්‍රික්ක භාවිත කිරීමේ දී එක්වර රෙදි හැකිතාක් මැද ගැනීම<br>■ කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ විදුලි පහන් භාවිතය |
| මේස පුටු වැනි උපකරණ | ■ මල බැඳීම වැළැක්වීමට ආලේපන යෙදීම<br>■ ජලයට හා තෙතමනයට නිරාවරණය නොකිරීම |

සම්පත් නාස්තිය වළක්වා ගැනීම නිසා අත්වන වාසි

- මුදල් ඉතිරි වීම
- අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සම්පත් ඉතිරි වීම
- පරිසරයට සිදු වන හානි අවම වීම

**ක්‍රියාකාරකම 6**

(1) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ඔබේ නිවසේ භාවිත කරන උපකරණ 3 ක් සඳහන් කරන්න | එය නිපදවීම සඳහා යොදා ගෙන ඇති සම්පත් මෙම තීරුවේ සටහන් කරන්න. |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

## 3.7 පොදු දේපළ සුරකිමු

එදිනෙදා ජීවිතයේ දී අපට විවිධ අවශ්‍යතා ඉටු කර ගැනීමට සිදු වේ. ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම් හා ඖෂධ අපගේ මූලික අවශ්‍යතා වේ. අධ්‍යාපනය ලැබීම, ලෙඩ රෝගවලට ප්‍රතිකාර ලබා ගැනීම, ගමන් බිමන් යාම, විවේකය ගත කිරීම ආදිය ද අපගේ අවශ්‍යතා අතර වේ. තවත් විවිධ අවශ්‍යතා අපට එදිනෙදා ජීවිතයේ දී ඉටු කර ගැනීමට සිදු වේ. මෙම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා පවත්වා ගෙන යන සේවා පිළිබඳ ඔබ මඳක් සිතා බලන්න.

ඔබට අධ්‍යාපනය ලබා දීම සඳහා පාසල් පිහිටුවා ඇත. ලෙඩ රෝගවලට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල් පිහිටුවා තිබේ. ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා බස් රථ සේවා පවත්වා ගෙන යයි. විවේකය ගත කිරීම සඳහා විවිධ පහසුකම් සපයා ඇත. මේ අයුරින් ඔබේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා පිහිටුවා ඇති ආයතන හා පවත්වාගෙන යන සේවා පිළිබඳ සිතා බලන්න.

මෙම සේවාවන්ට අයත් ගොඩනැගිලි, භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර, විවිධ උපකරණ පොදු දේපළ වේ.

**සියලු ම පුරවැසියන්ගේ දායකත්වයෙන් ගොඩනැගුණු, සියලු ම පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගත හැකි සේවා ස්ථාන හා ඒවාට අයත් භාණ්ඩ පොදු දේපළ වේ.**

**පොදු දේපළවල ලක්ෂණ**

- **මහජන සුභ සිද්ධිය හා මහජනයාට සේවා සැපයීම අරමුණු කර ගෙන පවත්වාගෙන යාම.**
- **ලාභ අපේක්ෂාවෙන් තොර ව රජය මගින් සපයා තිබීම.**
- **පොදුවේ සැමට පරිහරණය කළ හැකි වීම.**



3.5 රූපය



3.6 රූපය

ඔබේ පාසලේ තිබෙන ගොඩනැගිලි, මේස, පුටු, පරිගණක යන්ත්‍ර, පුස්තකාල පොත්, විද්‍යාගාර උපකරණ, ක්‍රීඩා උපකරණ ආදි සියල්ල පොදු දේපළ වේ. ඒවා ඔබේ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා රජය මඟින් ලබා දී ඇති දේ ය. ඔබේ අධ්‍යාපන කටයුතු සඳහා මෙන් ම ඔබේ හැකියා සහ දක්ෂතා වර්ධනය කර ගැනීමට මේවා පරිහරණය කිරීමට ඔබට අයිතියක් ඇත. එමෙන්ම ඒවා සුරක්ෂිත ව පරිහරණය කර, අනාගත සිසු පරපුරට එම සම්පත් උරුම කර දීම ඔබගේ වගකීම හා යුතුකම වේ.

රෝහලක තිබෙන ගොඩනැගිලි, උපකරණ හා විවිධ භාණ්ඩ අපට සේවා සැපයීම සඳහා ප්‍රයෝජනවත් වන පොදු දේපළ වේ. ඒවා ආරක්ෂා කිරීමත්, එම ස්ථාන පිරිසිදු ව තබා ගැනීමත් ඉන් සේවා ලබා ගන්නා අයගේ යුතුකමක් ලෙස සලකා කටයුතු කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ මාර්ග නවීකරණයටත්, අධිවේගී මාර්ග ඉදිකිරීමටත් රජය පියවර ගෙන තිබේ. ඉක්මනින් හා ආරක්ෂා සහිත ව ගමන් බිමන් යාමට හා භාණ්ඩ ප්‍රවාහනයට පහසුකම් සැලසීම එහි අරමුණයි.

මහා මාර්ගවල ආරක්ෂිත වැට, මාර්ග සංඥා පුවරු ආදිය ඉදිකර ඇත්තේ මාර්ගය ප්‍රයෝජනයට ගන්නා අයගේ ආරක්ෂාව සඳහා ය. ඒවා ආරක්ෂා කිරීම පුරවැසියන් වශයෙන් සැමගේ වගකීම වේ.

එමෙන් ම මහා මාර්ගය ගමනා ගමනයට බාධා වන පරිදි වෙනත් කටයුතුවලට යොදා ගැනීම කිසිවිටෙකත් නොකළ යුතු ය. එසේම මාර්ගය ප්‍රයෝජනයට ගන්නා රියැදුරන් හා පදිකයන් තම ආරක්ෂාව මෙන් ම සෙසු අයගේ ආරක්ෂාව ගැන ද විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

අපේ එදිනෙදා කටයුතු පහසුවෙන් ඉටුකර ගැනීම සඳහා විදුලි බලය භාවිතයට ගන්නෙමු. විදුලි බලාගාර, විදුලිය සැපයීමට සම්බන්ධ උපකරණ ආදිය සුරැකීම කෙරෙහි සැම පුරවැසියෙකුගේ ම අවධානය යොමු විය යුතු ය.

බස්රථ, බස් නැවතුම්පොළ, දුම්රිය, දුම්රිය ස්ථාන, ක්‍රීඩා පිට්ටනි, ළමා උද්‍යාන, පුස්තකාල ආදිය ද පොදු දේපළ වේ. එම දේපළ ආරක්ෂා කිරීමත්, එම ස්ථාන පවිත්‍ර ව තබා ගැනීමටත් යහපත් පුරවැසියෙකු වශයෙන් දායක විය යුතු ය.

ග්‍රාමීය ප්‍රදේශවල පොදු අවශ්‍යතා සපුරාලීම සඳහා පොදු ළිං, නළ ළිං, වැව් හා වාරිමාර්ග ආදිය ඉදිකර තිබේ. මෙයට අමතර ව සමාජයේ පොදු අවශ්‍යතා ඉටුකරලීම සඳහා ආධාර වන පොදු සේවාවන්ට අයත් දේපළ කොතෙකුත් තිබෙන්නට පිළිවන. මේවා ආරක්ෂා කර ගනිමින් ප්‍රයෝජනයට ගැනීම සැම යහපත් පුරවැසියෙකු ම සතු ගුණාංගයක් වන්නේ ය.

### පොදු දේපළ සුරැකීම නිසා අත්වන ප්‍රයෝජන

- ජනතාවට අවශ්‍ය සේවා කාර්යක්ෂම ව සැපයීමට හැකි වීම
- නැවත අලුත් වැඩියාව සහ නඩත්තුව සඳහා යන වියදම් ඉතිරි වීම නිසා එම මුදල් තව දුරටත් සංවර්ධනයට දයක කරගත හැකි වීම
- හොඳ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීමට අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කර ගැනීම
- ඒවා අනාගත පරපුරට ද ප්‍රයෝජනයට ගත හැකි පරිදි ආරක්ෂා වීම

### පොදු දේපළ සුරැකීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග

- පොදු දේපළ ආරක්ෂා කිරීම අප සැමගේ වගකීමක් හා යුතුකමක් ලෙස සලකා කටයුතු කිරීම
- පොදු දේපළ අයුතු ලෙස භාවිත කිරීමෙන් වැළකීම
- භාවිත කිරීමේ දී කැඩී බිඳී යෑමෙන් ආරක්ෂා කිරීම
- අන් අයට ද භාවිත කිරීමට අවස්ථාව ලබා දීම
- පොදු දේපළක් පෞද්ගලිකව අත්පත් කර නොගැනීම
- පොදු දේපළ භාවිත කිරීමේ දී එය නඩත්තු කරන ආයතනයට නියමිත ගෙවීම් කිරීම
- ඔබට වැළැක්විය නොහැකි ලෙස පොදු දේපළවලට හානි වන අවස්ථාවක එය ඊට වගකිය යුතු ආයතනයට දැනුම් දීම
- පොදු දේපළවල වැදගත්කම පිළිබඳ අන් අය දැනුවත් කිරීම

#### ක්‍රියාකාරකම 7

- පහත දැක්වෙන වගුව I, II, III, IV තීරුවල ශීර්ෂ පාඨ හොඳින් කියවා වගු සටහන සම්පූර්ණ කරන්න.

| I තීරුව | II තීරුව | III තීරුව | IV තීරුව |
|---|---|---|---|
| ඔබ එදිනෙදා ප්‍රයෝජනයට ගන්නා පොදු දේපළ | එම දේපළ ඇසුරින් ඔබට සැපයෙන සේවා | එම දේපළ විනාශ වුවහොත් ඔබට ඇතිවන දුෂ්කරතා | එම දේපළ ආරක්ෂා ගැනීම සඳහා ඔබට ගත හැකි පියවර |
| | | | |
| | | | |
| | | | |
| | | | |

- පොදු දේපළ සුරැකීමේ වැදගත්කම දැක්වෙන පෝස්ටරයක් නිර්මාණය කරන්න.

- පොදු දේපළවලට හානි පැමිණෙන අවස්ථාවල දී ඒ පිළිබඳ ව දැනුම් දිය යුතු ආයතනවල දුරකථන අංක ලේඛනයක් සකස් කරන්න.
- ඔබේ පාසලේ ජල නළ හා කරාමවලින් කාන්දුවීම් සිදුවන අවස්ථා හඳුනා ගෙන ඒවා වළක්වා ගැනීමට එවැනි අවස්ථා පිළිබඳ ඔබේ පුරවැසි අධ්‍යාපනය විෂයභාර ගුරුතුමාට / ගුරුතුමියට වාර්තා කරන්න.
- පාසලේ තෝරාගත් ස්ථානයක පොදු දේපළවලට හානි සිදුවී ඇති අවස්ථා හඳුනා ගෙන ඒවා අවම කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

## 3.8 "පරිසරය සුරකිමු"

අප අවට ඇති වටපිටාව අපේ පරිසරයයි. වායු ගෝලය, මුහුදු, දිය ඇලි, ගංගා, වන සතුන් හා ස්වාභාවික ව වැවුණු ගස්වැල් 'ස්වාභාවික පරිසරය' ට අයත් වන දෑය. මේවා ස්වභාව ධර්මයෙන් අප ලද දායාදයන් ය. එමෙන් ම මේවා මිනිසාගේ බලපෑමකින්, මැදිහත්වීමකින් තොර ව, නිර්මාණය වූ ඒවා ය.

**මිනිසාගේ බලපෑමකින් තොර ව ස්වාභාවික ව නිර්මාණය වූ පරිසරය භෞතික පරිසරයයි.**

භෞතික පරිසරයට අයත් දර්ශනීය ස්ථාන කිහිපයක ඡායාරූප මෙහි දැක්වේ.



3.7 රූපය

මිනිසා ද පරිසරයේ ම කොටසක් වේ. අවට පරිසරයයේ මිනිසා ගොඩනැගූ ලද විවිධ දේ ඔබට දැකගත හැකිය. උද්‍යාන, ගොඩනැගිලි, මංමාවත්, පොකුණු, වැව් ආදිය ඊට නිදසුන් ය. ඒවා 'නිර්මිත පරිසරය' ලෙස හැඳින්වීමට හැකි ය.

**මිනිසා, ස්වාභාවික පරිසරයෙහි නිර්මාණය කළ දෑ නිර්මිත පරිසරයට අයත් වේ.**

එවන් නිර්මාණ කිහිපයක ඡායාරූප මෙහි දැක්වේ.



හම්බන්තොට වරාය



නෙලුම් පොකුණ



බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව



කොළඹ මාතර අධිවේගී මාර්ගය

3.8 රූපය

අපේ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා අපි පරිසරය හා එහි ඇති සම්පත් ප්‍රයෝජනයට ගන්නෙමු. ජන සංඛ්‍යාව වැඩි වීමත්, අවශ්‍යතා වැඩි වීමත් නිසා පරිසරයට අපෙන් වන බලපෑම් ක්‍රමයෙන් වැඩි වී ඇත.

මේ නිසා ජලය, ගොඩ බිම හා වායුගෝලය යන පරිසර අංගවලට බෙහෙවින් හානි පැමිණෙන අවස්ථා ද ඇති වී තිබේ. මෙම පරිසර අංග දූෂණය වීමට බලපාන හේතු කිහිපයකට නිදසුන් පහත දැක්වේ.

| පරිසර අංගය | දූෂණයට හේතු |
|---|---|
| ජලය | ■ අපද්‍රව්‍ය ජලයට බැහැර කිරීම<br>■ වගා කටයුතු සඳහා අධික ලෙස රසායනික පොහොර භාවිතය<br>■ කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය |
| ගොඩබිම | ■ අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීම<br>■ වගා කටයුතු සඳහා රසායනික පොහොර භාවිතය<br>■ කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය<br>■ වනාන්තර විනාශ කිරීම |
| වායුගෝලය | ■ කර්මාන්ත ශාලාවලින් පිටවන දුම්<br>■ රථවාහනවලින් පිටවන දුම් |
| ශබ්ද දූෂණය | ■ ශබ්ද විකාශන යන්ත්‍රවලින් නිකුත් කෙරෙන අධික ශබ්ද<br>■ රථවාහන නළා ශබ්ද<br>■ පිපිරීම් නිසා ඇති ශබ්ද |









පරිසරයට සිදුවන හානි පිළිබඳ ඔබ නොයෙක් විට අසා ඇත. මිනිසා පරිසරයට කරන හානි නිසා පානය සඳහා පිරිසිදු ජලය සපයා ගැනීම පවා වර්තමානයේ ගැටලුවක් වී තිබේ. දූෂිත ජලය භාවිතය නිසා නොයෙකුත්

ලෙඩ රෝග ඇතිවේ. එමෙන් ම ජලය දූෂණය වීම නිසා මත්ස්‍ය සම්පත ඇතුළු ජලජ ජීවීහු ද විනාශ වෙති.
වායු ගෝලය දූෂණය වීම නිසා නොයෙකුත් ලෙඩ රෝග ඇති වීම, වායු ගෝලයේ උෂ්ණත්වය ඉහළ යාම, ඕසෝන් ස්තරයට හානි වීම ආදි භයානක ප්‍රතිඵලවලට මුහුණ දීමට සිදු වී තිබේ.

**යහපත් පුරවැසියෙකු වශයෙන් පරිසරය සුරැකීම සඳහා දායක විය හැකි ආකාර**

- පරිසරය පිළිබඳ සංවේදී වීම
- අපද්‍රව්‍ය ජලයට බැහැර කිරීමෙන් වැළකීම
- ජලාශ අවට ප්‍රදේශ පිරිසිදුව තබා ගැනීමට සහාය වීම
- රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතයට යොමු වීම
- කෘෂි රසායන ද්‍රව්‍ය වෙනුවට දේශීය ක්‍රමවේද භාවිතය
- පරිසරයට හානි කර අපද්‍රව්‍ය නිසි කළමනාකරණයකින් යුතු ව බැහැර කිරීම

  උදා - භාවිතයෙන් ඉවත් කළ පරිගණක උපාංග, ප්‍රතිදීප්ත විදුලි පහන්, ජංගම දූරකථන බැටරි ආදිය
- ගොඩබිම මත සැලසුමකින් තොර ව අපද්‍රව්‍ය බැහැර කිරීමෙන් වැළකීම
- අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා හඳුන්වා දී ඇති වැඩ සටහන්වලට සහාය දැක්වීම
- දිරා යන අපද්‍රව්‍ය කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගැනීම
- ශබ්ද විකාශන යන්ත්‍ර, ගුවන් විදුලි යන්ත්‍ර ආදිය භාවිතයේ දී අන් අයට කරදරයක් නොවන පරිදි භාවිත කිරීම

පරිසරයේ කොටස්කරුවන් වශයෙන් පරිසර සංරක්ෂණයට උරදීම අප සැමගේ යුතුකමක් හා වගකීමක් වේ. එසේ කිරීමෙන් සුන්දර පරිසරයක ජීවත් වීමට අප සියලු දෙනාට ඇති ප්‍රාර්ථනාව සඵල කර ගත හැකි ය. එම සුන්දර පරිසරය අනාගත පරපුරට ද උරුමකර දීමට අපට හැකි වනු ඇත.

**ක්‍රියාකාරකම 8**

- පාසල් පරිසරයේ සංවර්ධනය කළ යුතු ස්ථානයක් තෝරා එම ස්ථානය විධිමත් ව පවත්වා ගෙන යාම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න.

- ඔබේ ගුරුතුමා/ගුරුතුමියගේ උපදෙස් ලබා ගෙන සෙසු ළමයින්ගේ සහයෝගයෙන් එම යෝජනා කිහිපයක් ක්‍රියාත්මක කර තෝරාගත් ස්ථානය විධිමත් ව පවත්වා ගෙන යාමට කටයුතු කරන්න.

## 3.9 අපේ දේශීය දේ අභිමානයෙන් සුරකිමු

"අපේ මව්බිම" නමින් පැවති රූපවාහිනී සංවාද වැඩසටහනක දී පළ වූ අදහස් කිහිපයකි මේ.

"ශ්‍රී ලංකාව පුදුම රටක්. හිම මිදෙන එක ඇර ලෝකයේ වෙන ඕනෑ ම රටක තියෙන දේශගුණයක් ලංකාවේ තියෙනවා. ඒ නිසා සීත රටක වැවෙන ඕනෑ ම භෝගයක් නුවරඑළිය ප්‍රදේශයේ වගා කළ හැකියි. යාපනය, මන්නාරම ප්‍රදේශවල උණුසුම් දේශගුණ තත්වයක් තියෙනවා. අනෙක් ප්‍රදේශවල අතරමැදි දේශගුණයක් දක්නට ලැබෙනවා. ගංගා, ඇළ දොළ, වැව් පොකුණු පමණක් නොව දිය ඇලි ද රාශියක් තිබෙනවා."

"ඇමරිකාවේ නිව්යෝක් නගරයේ ඉඳලා කිලෝමීටර් 30 ක් විතර ඈතට යන තුරු කොළපාට එක ම එක ගහක්වත් දකින්න නෑ. ඊට එහා තියෙන ගහකොළත් කොළපාට වෙන්නේ අවුරුද්දේ භාගයක් විතරයි. අවුරුද්ද පුරා අව්ව වැටෙන දහවලක් ඔවුන්ට ලැබෙන්නේ නෑ. ඒ රටවල අයට කොළපාටින් පිරුණු අපේ රට දකිනකොට ඇස් අදහා ගන්නත් බැහැ."

"සමහර රටවල අධික උෂ්ණත්වය නිසා මිනිසුන් හා සතුන් මිය යනවා. ඒ වගේ ම අධික සීතලෙන් ද මිනිසුන් හා සතුන් මිය යනවා. ඒත් අපේ රටේ දරන්න බැරි උෂ්ණත්වයක්වත්, දරන්න බැරි සීතලක්වත් නෑ. මිනිසුන් මරන දේශගුණයක් නෑ. මිනිසුන් ජීවත් කරවන දේශගුණයක් විතරයි තියෙන්නේ. අපේ රටේ කෙසෙල්, ගස්ලබු, මිදි වගේ හැම පලතුරක් ම අවුරුද්ද පුරා

ම තියෙනවා. පොල්, පුවක් ගස්වල හැමදා ම ගෙඩි. හැම තැන ම හැම තත්පරයක ම කුරුල්ලන්ගේ හඬ අහන්න පුළුවන්. කුරුඳු, එනසාල්, කරාබු නැටි, පොල්, රබර්, කොකෝවා, ගම්මිරිස්, බුලත්, හැමදා ම වවන්න පුළුවන්. මුළු වනය ම බෙහෙත් ගබඩාවක්. මැණික්, මිනිරන්, ඉල්මනයිට්, පොස්පේට් වැනි ඛනිජ ද්‍රව්‍ය තියෙන ස්වර්ණ භූමියක් අපට තිබෙන්නේ. අප ඉපදිලා ඉන්නේ සරුසාර රටක.

අපේ අතීත මුතුන්මිත්තන් කළ විස්මිත නිර්මාණ බොහොමයකි. එම නිර්මාණ නූතන තාක්ෂණයෙන් පිරුණු අද වැනි දිනක පවා ලොව මවිත කරනවා.''

සාකච්ඡාවෙන් අනතුරු ව මහගමසේකරයන් රචිත, ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේවයන් ගායනා කරන ගීතයක් වාදනය විය. ගීතයට අදාළ රූප පෙළක් ද ඒ සමග ම විකාශය විය.

රත්නදීප ජන්ම භූමි
ලංකාදීප විජය භූමි
මේ අපේ උදාර වූ - මාතෘ භූමියයි
ආදි සිංහලේ වීර මී මුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි


මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
ඇත්තෙ ඒ අභීත දූ පුතුන්
ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ
ජීවිතේ පුදා හෙළූ ලේ කඳයි

සින්ධූපමාන වැව් තලා මතින් ඇදී
පද්ම රේණුයෙන් සුගන්ධ වී
රන් කරල් නමා හමා සිත් ප්‍රබෝධයෙන් පුරා
එන්නෙ උන් හෙළූ ප්‍රාණ වායුවයි

ගංගා තරංග රාව දී රිදී වනින්
මල් පිපී කුළින් කුළේ හැපී
ගායනා කරන්නේ ආකාශයේ නැගී
වීරයින්ගෙ ඒ යශෝ ගීතයයි



අවුකන පිළිමය



සමාධි පිළිමය




සඳකඩපහණ



පොලොන්නරුවේ ශිව දේවාලය

3.10 රූපය

අනුරාධපුරයේ කලාවැව සමීපයේ පිහිටි උසින් අඩි 39 යි අඟල් 10 ක් වූ අවුකන හිටි පිළිමය ලෝකයේ ඇති අති විශිෂ්ට කලා නිර්මාණයකි. මහා කළු ගලක් තියුණු ගල් කටුවකින් කපා ඔපමට්ටම් කොට කළු ගලකට ජීව ගුණය කවන්නට තරම් ශිල්පීය ඥානයක් ඇති කලාකරුවෝ ශ්‍රී ලංකාවේ ජීවත් වූහ. ශ්‍රී ලාංකික ජනතාවගේ පුද පූජාවන්ට හා ගෞරවයට පාත්‍ර වන අවුකන පිළිමය සේ ම අනුරාධපුරයේ මහමෙව්නාවේ පිහිටා ඇති සමාධි පිළිමය, සඳකඩපහණ ඇතුළු කලා නිර්මාණ රාශියක් අප සතු වන්නේ ය. ලෝක උරුමයක් සේ සැලකෙන සීගිරිය අපේ අභිමානවත් අතීතය සිහිපත් කරන ස්මාරකයක් බඳු ය.



3.11 රූපය සීගිරිය



3.12 රූපය කලා වැව

එදා ශ්‍රී ලාංකිකයන් සතු ව පැවති වාරිමාර්ග තාක්ෂණික ඥානය නූතන තාක්ෂණය ඉදිරියේ දෙවැනි නොවන බවට කොතෙකුත් සාධක ඇත. වියළි කලාපයේ ජනයාගේ ජීවනෝපාය වූ කෘෂිකර්මාන්තය හා සෙසු අවශ්‍යතා සඳහා ඉදි කළ වැව්, මහා සයුරු පරදවන සුලු ය. කලාවැව, පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය ආදි වැව් ඊට නිදසුන් ය. එවැනි විශාල වැව් දහස් සංඛ්‍යාවක් අපේ රට තුළ බිහි කළේ අපේ මුතුන් මිත්තන්ගේ විස්මිත තාක්ෂණික ඥානය හා දෑතේ ශ්‍රමයෙනි. කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙන යන ජයගඟ වාරි තාක්ෂණයේ විස්මිත නිර්මාණයකි. එහි දිග කිලෝමීටර 86 ක් පමණ වේ. ජය ගඟේ බෑස්ම කිලෝමීටරයට මිලිමීටර් 95ක් පමණ වේ. ඒ අති සූක්ෂම නිර්මාණවල අභිමානවත් උරුමකරුවන් අපමය. එවැනි දේශීය උරුමයන් එදා මෙන් ම අදත් නිර්මාණය කිරීමත් ආරක්ෂා කිරීමත් අප සතු වගකීමකි.

ශ්‍රී ලාංකිකයන් ලෙස අපට අභිමානවත් විය හැකි දේශීය දේ අපි හඳුනාගත යුතු වෙමු. දේශීය දේ ලෙස සැලකෙන්නේ තම රටේ සංස්කෘතිය, සම්පත් හා නිෂ්පාදන යන සියල්ලයි.

දේශීය සංස්කෘතිය :

- ආගම් හා ආගමික උත්සව
- ආගම් ඇසුරින් නිර්මාණය වූ විශේෂ කලා නිර්මාණ උදා: පූජනීය ස්ථාන, පිළිම, දාගැබ්, බිතුසිතුවම්, ගල් කැටයම්
- සාහිත්‍ය කෘති, ජන සාහිත්‍යය
- දේශීය වෙදකම, දේශීය සිරිත් විරිත්
- වාරි සංස්කෘතිය හා ඊට අදාළ වැව් අමුණු



3.13 රූපය
ඇම්බැක්ක දේවාලය

**දේශීය සම්පත්**

- ඛනිජ සම්පත් (මිනිරන්, මැණික්, පස්, වැලි, පොස්පේට් ආදිය)
- සතුන්, දිය ඇලි, විසිතුරු මල් හා විශේෂ ශාක වර්ග
- ධාන්‍ය වර්ග හා එළවළු
- පලතුරු
- වෙනත් වැවිලි
- ස්වාභාවික වරාය



3.14 රූපය

**දේශීය නිෂ්පාදන**

- රෙදි පිළි
- පිඟන් භාණ්ඩ, උළු, ගඩොළු
- පිත්තල භාණ්ඩ, දැව භාණ්ඩ
- වෙස් මුහුණු
- පන් භාණ්ඩ
- කැවිලි වර්ග (ආහාර පාන)
- දේශීය නිර්මාණ



3.15 රූපය

දේශීය දේ හා දේශීය උරුමයන් හඳුනා ගැනීමෙන් අපේ රටේ පවතින දේ හි ඇති වැදගත්කම අපට ඉහත කරුණුවලින් අවබෝධ වෙයි. අපේ නිපැයුම් අප අගය කරන්නට නම් ඒවා හොඳින් හඳුනා ගත යුතු ය. එදිනෙදා පරිභෝජනයේ දී හා පරිහරණයේ දී දේශීය භාණ්ඩ සඳහා ප්‍රමුඛතාවක් දැක්වීම අපේ යුතුකමක් වන්නේ ය.

## දේශීය නිෂ්පාදන හා දේශීය සම්පත් අගය කිරීමේ ඇති වැදගත්කම

- දේශීය දේ පිළිබඳ අභිමානයක් ඇති වීම
- දේශීය සම්පත් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි වීම
- දේශීය සම්පත් ආශ්‍රිත නිපැයුම් සඳහා යොමු වීම හා ඒ ඇසුරින් ප්‍රදේශයේ රැකියා බිහිවීම
- විදේශීය රටවලට ඇදී යන මුදල් රටෙහි ඉතිරි වීම
- ආහාර පාන වැනි නිෂ්පාදන නැවුම් බවින් යුක්ත වීම
- දේශීය සම්පත් හඳුනා ගෙන ඒ ආශ්‍රිත නව නිපැයුම් බිහි වීම
- ශ්‍රී ලාංකික පාරිභෝගිකයාට අඩු මුදලට ලබාගත හැකි වීම
- භාණ්ඩයක විශ්වාසවන්ත බව තහවුරු වීම
- නිෂ්පාදකයාටත් පාරිභෝගිකයාටත් දේශීය භාණ්ඩයක් පිළිබඳ අභිමානයක් ඇති වීම

රටක් ලෙස ගොඩ නැගෙන්නට නම් ශ්‍රී ලාංකික ජාතියක් ලෙස අප අපේ දේශීය දේ අගය කරමින් කටයුතු කිරීමේ වැදගත්කම ඔබ හඳුනා ගන්නට ඇත. අතීතයෙන් අප ලද දේශීය උරුමයන් මතු පරපුරට ද උරුමකර දීමට හා ඒවා සුරැකීමට ඔබ මූලිකත්වය ගනු ඇත. එය සෑම පුරවැසියෙකුගේ ම වගකීම වෙයි.

**සාරාංශය**

මෙම පරිච්ඡේදය හොඳින් අධ්‍යයනය කළ ඔබට යහපත් පුරවැසියකු වශයෙන් සමාජයේ ජීවත් වීමට අවශ්‍ය පහත සඳහන් ගුණාංග ප්‍රගුණ කර ගැනීම පිළිබඳ අවබෝධය වර්ධනය කර ගැනීමට අවස්ථාව ලැබෙන්නට ඇත.

- ★ ආචාරශීලී ලෙස භාෂාව භාවිත කිරීම
- ★ අන් මත ගරු කරමින් සාකච්ඡා කර එකඟතාවට එළඹීම
- ★ විනයෙන් හා ශික්ෂණයෙන් යුතු ව කටයුතු කිරීම
- ★ සරු දේ හා නිසරු දේ හඳුනා ගැනීම
- ★ සම්ප්‍රදායන් හා නීතිරීති ගරු කිරීම
- ★ සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීම
- ★ පොදු දේපළ සුරැකීම
- ★ පරිසරය සුරැකීම
- ★ දේශීය දේ අගය කිරීම